# 2023

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

## ජල සම්පත් මණ්ඩලය
## நீர் வளச் சபை
## WATER RESOURCES BOARD



ජල සම්පාදන අමාත්‍යාංශය
நீர் வழங்கல் அமைச்சு
MINISTRY OF WATER SUPPLY

# වාර්ෂික වාර්තාව
# 2023

ජල සම්පත් මණ්ඩලය

ජල සම්පාදන අමාත්‍යාංශය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| **හැඳින්වීම** | 04 |
| **දැක්ම** | 05 |
| **මෙහෙවර** | 05 |
| **අරමුණු** | 06 |
| **කාර්යයන්** | 07 |
| **ආයතනික තොරතුරු** | 08 |
| **ආයතනික පාලන ව්‍යූහය** | 09 |
| පෙර ගමන්කරුවන් | 09 |
| විගණන හා කළමනාකරණ කමිටුව | 10 |
| ජ්‍යේෂ්ඨ විධායක නිලධාරීන් | 10 |
| **කාර්යය මණ්ඩල තොරතුරු** | 14 |
| **ප්‍රධාන ක්‍රියාකාරකම්** | 16 |
| **2023 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන්** | 17 |
| **මූල්‍ය ප්‍රකාශන** | 78 |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 79 |
| මූල්‍ය තත්ත්වය ප්‍රකාශය | 80 |
| ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය | 81 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 82 |
| භාණ්ඩාගාර ප්‍රදාන අනාවරණය කිරීම | 83 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 84 |
| මූල්‍ය ප්‍රකාශයට සටහන් | 88 |
| **විගණකාධිපති වාර්තාව** | 101 |
| **විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම** | 114 |
| **2023 ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතියේ සාරාංශ** | 128 |

# හැඳින්වීම

1964 අංක 29 දරණ ජල සම්පත් පනත යටතේ 1966 දී ස්ථාපිත කරන ලද ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පත් පාලනය හා ඵලදායී අයුරින් උපයෝගී කරගැනීම ආදී සියළු කරුණු පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දෙන ආයතනයක් වශයෙන් පැවතිණි.

1978 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූජල අංශය ජල සම්පත් මණ්ඩලයට අනුයුක්ත කරන ලද බැවින් මණ්ඩලයේ කාර්යයන් පුළුල්ව ක්‍රියාත්මක විය. උපදේශක සේවාවක්ව පැවති ජල සම්පත් මණ්ඩලය වාණිජමය කාර්යයන්හි නියැලීමට හැකිවන පරිදි හා ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පතට අදාළ කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලය පවරාදීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත 1999 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර සංශෝධනය කරන ලදී.

2017 මාර්තු 16 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍ර අංක 2010/23 අනුව දක්වන ලද කටයුතු සඳහා ස්වභාවික ජල උල්පත් හා භූගත ජලය භාවිතා කිරීමට ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය හා මඟ පෙන්වීම ලබා ගත යුතු බව නියම කරන ලදී.

# දැක්ම

පිරිසිදු හා ආරක්ෂිත ජලය සෑමට ප්‍රමාණවත් පරිදි ලබාදීම.

# මෙහෙවර

පොදු මහජනතාව, අදාල රාජ්‍ය දෙපාර්තමේන්තු/ අධිකාරී/ ආයතන/ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන හා දේශීය මෙන්ම විදේශීය විශේෂඥ සහ වෘතීයවේදී කණ්ඩායම් සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයට හා ජනතාවට උපදෙස් ලබාදීම.

# අරමුණු

- දිවයිනෙහි භූගත ජල සම්පත් පිළිබඳව පර්යේෂණ සිදු කිරීම
- භූගත ජල සම්පත් පිළිබඳ වූ විද්‍යාත්මක දත්තයන් එක්රැස් කිරීම
- භූගත ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදුකිරීම
- භූගත ජල සම්පත් පරිහරණය පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- භූගත ජල සම්පත් තක්සේරු කිරීම
- වෙනත් ආයතන හා සම්බන්ධවී මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම
- භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය කිරීම

# කාර්යයන්

1. රටේ ජල සම්පත් සංරක්ෂණය සහ උපයෝගීකරණය කිරීම ඇතුළත්ව ඒවා පාලනය කිරීම, විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම.

2. ගංගා ඇළ මාර්ග හා වෙනත් ජල මාර්ග අපවිත්‍ර වීම වැළැක්වීම.

3. පහත සඳහන් අරමුණු වලින් රටේ ජල සම්පත් පාලනය හා පරිහරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම.

- ජල සම්පත් බහු කාර්ය ලෙස සංවර්ධනය හා පරිහරණය කිරීම.
- ගෘහ කටයුතු හා කාර්මික කටයුතු සඳහා කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව ජල සම්පත් ලබාදීම.
- ලවණතාව පාලනය කිරීම.
- වෙනත් යම් සමාන අරමුණු

4. රටේ භූගත ජල සම්පත් සංරක්ෂණය, උපයෝගීකරණය, පාලනය හා සංවර්ධනය සඳහා සවිස්තරාත්මක හා එකිනෙක සම්බන්ධ සැලසුම් සකස් කිරීම.

5. ජල භූ විද්‍යාව සම්බන්ධව මූලික දත්ත සමීක්ෂණ සහ අනෙකුත් පරීක්ෂණ වලට අනුව රජයේ දෙපාර්තමේන්තු පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථාවල ක්‍රියාකාරකම් වල සම්බන්ධීකරණයක් ඇති කිරීම.

6. රටේ භූගත ජල සම්පත් සම්බන්ධයෙන් රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා මඟින් සිදු කරනු ලබන පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ, සැලසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම.

7. රටේ භූගත ජල සම්පත් සංරක්ෂණයට, උපයෝගීකරණයට සහ සංවර්ධනයට අදාළව රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ එම ව්‍යාපෘති පවත්වා ගැනීමේ හැකියාව, ඵල ප්‍රයෝජන සහ ආර්ථික සංඛ්‍යතාව තක්සේරු කිරීම.

8. භූගත ජලය නිසි ලෙස පාලනය හා ආර්ථිකමය පරිහරණය සඳහා රජය විසින් ගතයුතු වන වෙනත් ඕනෑම සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

# ආයතනික තොරතුරු

**ආයතනය**
ජල සම්පත් මණ්ඩලය

**නෛතික තත්ත්වය**
රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

**ස්ථාපිත වර්ෂය**
1966 දී 1964 අංක 29 දරණ පාර්ලිමේන්තු පනත මගින් 1999 දී, 1999 අංක 42 දරණ ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත මගින් ඉහත පනත සංශෝධනය කරන ලදී.

**ප්‍රධාන කාර්යාලය**
488/ඒ, නාවල පාර,
කොස්වත්ත, රාජගිරිය.

දුරකථන : +94 11 2694835, +94 11 2697050
ෆැක්ස් : +94 11 2669517 (පාලන)
ඊමේල් : helpdesk@wrb.gov.lk
වෙබ් : www.wrb.gov.lk

**රේඛීය අමාත්‍යාංශය**
ජල සම්පාදන අමාත්‍යංශය

**බදු හඳුනාගැනීමේ අංකය**
409018017

**එ.අ.බ. ලියාපදිංචි අංකය**
409018017 - 7000

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

**ආදායම් බදු උපදේශක**
ARS ඇසෝසියේට්
(වරලත් ගණකාධිකාරී)

**විගණකවරුන්**
විගණකාධිපති දෙපාර්තමේන්තුව
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ජල සම්පාදන අමාත්‍යංශය)
අභ්‍යන්තර විගණක (ජල සම්පත් මණ්ඩලය)

**අධ්‍යක්ෂක මණ්ඩලය**
ආචාර්ය ජේ.ඩී.සමරසිංහ මහතා - සභාපති
සී.රත්නමලල බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
(2023.03.13 දක්වා)
එස්.වයි.පිල්ලායි - අධ්‍යක්ෂ
(2023.03.14 සිට මේ දක්වා)
එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා - අධ්‍යක්ෂ
ඒ.කේ.ඩී.එස්.පී.මහානාම මහතා - අධ්‍යක්ෂ
එල්.ඒ.වයි ද සිල්වා මිය - භාණ්ඩාගාර නියෝජිත

**ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්**
කේ.පී.ඩී.ප්‍රියංකා මිය
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
ජල සම්පාදන අමාත්‍යාංශය
(2022.12.01 සිට 2023.12.31 දක්වා)

එම්.ඒ.පුෂ්පකුමාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)

ඒ.බී.එම්.චන්ද්‍රසිරි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) 2023.01.04 විශ්‍රාම යන ලදී.

සී.අබේසූරිය මිය
වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරී (පාලන හා මුදල්)
2023.01. 04 සිට මේ දක්වා
(ප්‍රධාන ගණකාධිකාරී ජල සම්පාදන අමාත්‍යාංශය)

ආර්.එම්.එස්.රත්නායක මහතා
නියොජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)

කේ.එම්.යු.සී.බී. කුලතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

ඩී.පී.එස්. වික්‍රම මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)
2023.12.10 දින විශ්‍රාම යන ලදී

ආර්.ආර්.පී. ආර්. රාජපක්ෂ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)

# ආයතනික පාලන ව්‍යුහය

## පෙර ගමන්කරුවන්

| | | |
|---|---|---|
| **ආචාර්ය ජේ.ඩී.සමරසිංහ මහතා** | - | **සභාපති (2021 සිට)** |
| වර්තමාන සේවා ස්ථානය හා තනතුර | - | සභාපති - ජල සම්පත් මණ්ඩලය |
| පෙර සේවා ස්ථානය හා තනතුර | - | සභාපති - ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, සමස්ත සම්බන්ධීකාරක - SLAS නිලධාරීන් සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනේ, ප්‍රධාන පුහුණුකරු හා ජ්‍යෙෂ්ඨ උපදේශක - SLIDA, අධ්‍යක්ෂ - ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, සංවර්ධන කළමනාකරු (මුදල් සහ ප්‍රතිසංස්කරණය) - Tsunamµ ව්‍යාපෘති ඒකකය (TRPU), ජාතිය යළි ගොඩනැගීම සඳහා වූ කාර්ය සාධක බලකාය (TAFREN), අධ්‍යක්ෂක - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අනුයුක්ත ජාතික එලදායිතා ලේකම් කාර්යාලය, කාර්මික සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, සහකාර කොමසාරිස් - මැතිවරණ දෙපාර්තමේන්තුව. |
| **එස්.වයි.පි පිල්ලායි** | - | **අධ්‍යක්ෂක (2023.03.14 සිට මේ දක්වා)** |
| වර්තමාන සේවා ස්ථානය හා තනතුර | - | කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී වුඩ් මාස්ටර් හෝල්ඩින් (පුද්ගලික) සමාගම |
| පෙර සේවා ස්ථානය හා තනතුර | - | අධ්‍යක්ෂක (මානව සම්පත් හා මුදල්) ප්‍රීමියර් ෆයිනෑන්ෂියල් කන්සල්ටන් (පුද්ගලික) සමාගම, අධ්‍යක්ෂක (අලෙවි) කූල් ෆවර් හෝල්ඩින්, සාමාන්‍යාධිකාරී - සූරියකන්ද වැවිලි (පුද්ගලික) සමාගම, ජ්‍යෙෂ්ඨ කළමනාකරු කහවත්ත වැවිලි පීඑල්සී, අධිකාරී වටවල වැවිලි පීඑල්සී. |
| **එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා** | - | **අධ්‍යක්ෂක - ජල සම්පත් මණ්ඩලය** |
| වර්තමාන සේවා ස්ථානය හා තනතුර | - | ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්බන්ධීකරණ ලේකම් (2020 අගෝස්තු 24 සිට 2022 මැයි 09 දක්වා සහ 2022 අගෝස්තු 01 සිට), අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික - කාර්මික සංවර්ධන මණ්ඩලය |
| පෙර සේවා ස්ථානය හා තනතුර | - | සහකාර කොමසාරිස් - ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික - සීමා සහිත නිපුණතා සංවර්ධන අරමුදල, කාර්මික සබඳතා උපදේශක - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, නියෝජ්‍ය අලෙවි කළමනාකරු (සංඛ්‍යා ලේඛන සහ ක්‍රියාපටිපාටි - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| **ඩී.කේ.ඩී.එස්.පී.මහානාම මහතා** | - | **අධ්‍යක්ෂක - ජල සම්පත් මණ්ඩලය** |
| වර්තමාන සේවා ස්ථානය හා තනතුර | - | කළමනාකාර අධ්‍යක්ෂ 3 එම් ස්කෑන් හෝල්ඩින් (පුද්ගලික) සමාගම |
| පෙර සේවා ස්ථානය හා තනතුර | - | කළමනාකාර අධ්‍යක්ෂ - ස්ටේජ්හහෙඩ් කන්සියුමර් ඇසෝසියේටඩ් නෙට්වර්ක් (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකාවේ 8 වන සහ 9 වන පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ලේකම්. |

**එල්.ඒ.වයි ද සිල්වා මිය - භාණ්ඩාගාර නියෝජිත**

වර්තමාන සේවා ස්ථානය හා තනතුර - අධ්‍යක්ෂක - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව.

පෙර සේවා ස්ථානය හා තනතුර - අධ්‍යක්ෂක - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය අධ්‍යක්ෂක - කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සහකාර අධ්‍යක්ෂක - කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සහකාර අධ්‍යක්ෂක - කර්මාන්ත සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

සමාලෝජිත වර්ෂය තුල අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් හයක් (06) පවත්වන ලදී .

## විගණන හා කළමනාකරණ කමිටුව

i. එල්.ඒ.වයි ද සිල්වා මිය - සභාපති - භාණ්ඩාගාර නියෝජිත
ii. සී.රත්නමලල බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
(2023.03.13 දක්වා)
iii. එස්.වයි.පිල්ලායි - අධ්‍යක්ෂ
(2023.03.14 සිට මේ දක්වා)
iii. එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා - අධ්‍යක්ෂ
iv. ඒ.කේ.ඩී.එස්.පී.මහානාම මහතා - අධ්‍යක්ෂ
(2023.03.14 සිට මේ දක්වා)
v. ඊ.ඒ.ඩී.පී.ප්‍රසන්න මහතා - නිරීක්ෂක - රජයේ විගණන අංශය
vi. එස්.ඩබ්.ගුණවර්ධන මිය - නිරීක්ෂක - ජල සම්පාදන අමාත්‍යාංශය

**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

2023 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

## ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් - 2023 වර්ෂය

i. ඉංජි. එච්.සී.ජේ.තිලකරත්න මහතා - සාමාන්‍යාධිකාරී (වැඩ බලන), අතිරේක ලේකම් ජල සම්පාදන අමාත්‍යාංශය (2022.11.30 දක්වා)
ii. කේ.ජී.ඩී.ප්‍රියංකා මිය - සාමාන්‍යාධිකාරී (වැඩ බලන) - අධ්‍යක්ෂ (සංවර්ධන) ජල සම්පාදන අමාත්‍යාංශය (2022.12.01)
iii. එම්.ඒ.පුෂ්පකුමාර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)
iv. ඒ.බී.එම්.චන්ද්‍රසිරි මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) 2023.01.04 විශ්‍රාම යන ලදී.
v. සී.අබේසූරිය මිය - වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරී (පාලන හා මුදල්) 2023.01. 04 සිට මේ දක්වා (ප්‍රධාන ගණකාධිකාරී, ජල සම්පාදන අමාත්‍යාංශය)
vi. ආර්.එම්.එස්.රත්නායක මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර් හා සං)
vii. කේ.එම්.යු.සී.බී. කුලතුන්ග මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
viii. ආර්.ආර්.ජී.ආර්. රාජපක්ෂ මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)
ix. ඩී.ජී.එස්. වික්‍රම මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

# සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රකාශය

1964 අංක 29 දරණ ජල සම්පත් පනත හා 1999 අංක 49 සංශෝධිත පනත මඟින් ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් පරිහරණයට අදාල වගකීම් ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ඇත. ඒ අනුව භූගත ජල සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා 2017 මාර්තු 16 දින අංක 2010/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කර ඇත.

ජල සම්පත් මණ්ඩලයේ මූලික අරමුණ ලෙස ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය, තිරසාර සංවර්ධනය සඳහා නිසි ලෙස භාවිතා කිරීමට අවශ්‍ය කළමනාකරණ සැලසුම් සකස් කිරීම හා ඒ උදෙසා භූගත ජලය පිළිබඳ පර්යේෂණ අධ්‍යයන සිදු කර අදාල නිර්දේශ ලබාදීම ප්‍රමුඛව සැලකිය හැක.

ඒ අනුව 2023 වර්ෂයේදී රජයේ හා පෞද්ගලික ආයතන මඟින් සිදු කරන ලද ඉල්ලීම් වලට අදාලව භූගත ජලය ලබා ගැනීමට සුදුසු ස්ථාන සොයාගැනීමට සිදු කරන භූජල සමීක්ෂණ හා විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා පස්, බොරළු, වැලි, මැටි හා ගල් කැඩීම නිසා භූගත ජල මට්ටමට හා පරිසරයට සිදු වන බලපෑම නිර්ණය කිරීම සඳහා භූගත ජල සමීක්ෂණ 398ක් සිදු කර අදාල නිර්දේශ ලබා දී ඇත. එසේම සිදුකරන ලද භූජල සමීක්ෂණ පදනම් කර පානීය, කාර්මික හා කෘෂිකාර්මික අවශ්‍යතාවන් සඳහා නිශ්පාදිත නල ළිං 53ක් 2023 වර්ෂයේදී අවසන් කර ඇති අතර භූගත ජලය උකහාගන්නා ආයතන නියාමනය යටතේ ජල ධාරිතා පරීක්ෂණ 190ක් විවිධ ආයතන සඳහා සිදු කර නිර්දේශ ලබාදී ඇත. ඒසේම වාණිජ ක්‍රියාකාරකම් යටතේ රසායනාගාරය මඟින් ජල සාම්පල 397ක් විශ්ලේෂණය සිදුකර ඇත.

පර්යේෂණ අධ්‍යයන යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගි කරගනිමින් දිස්ත්‍රික්ක 18ක සංවේදි කලාප වල භූගත ජල සම්පත් හි භූගත ජල මට්ටම් වෙනස් වීම හා එහි ගුණාත්මකභාවයේ හැසිරීම පිළිබඳ අධ්‍යයන් දිගු කාලීන ක්‍රියාවලියක් ලෙස ජල සම්පත් මණ්ඩලය විසින් සිදුකොට එම ප්‍රතිඵල භූගත ජල සම්පත් නියාමනය සහ කළමනාකරණ ක්‍රමෝපායන් සඳහා යොදවා ගනී. ඒ යටතේ භූගත ජල සම්පත් වල ප්‍රමාණාත්මක සහ ගුණාත්මක හැසිරීම පිළිබඳව ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය නිමාන දත්ත පද්ධතීන් හරහා සහ අනෙකුත් පර්යේෂණ අධ්‍යයන වල භූගත ජලය සම්බන්ධ සියළු තොරතුරු ජල සම්පත් මණ්ඩලය විසින් භූජල සම්පත් පිළිබඳ දත්ත ගබඩාවක් නිරතුරු යාවත්කාලීන සහ මෙහෙයුම් කටයුතු සිදු කර ගෙන යනු ලබයි. එසේම භූගත ජලය අධිකව උකහා ගන්නා සහ භූගත ජලය ස්වභාවිකව ආරෝපණය අවම ප්‍රදේශයන් හඳුනා ගෙන එම කලාප සඳහා කෘතීම භූගත ජල ආරෝපණ ක්‍රමවේද නියමු අධ්‍යයනයන් ලෙස ස්ථානයන් කිහිපයක මේ වන විට ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. මෙහි ප්‍රතිඵල සහ සඵලතාවය පදනම්ව රටෙහි අනෙකුත් ප්‍රදේශයන් සඳහා ද මෙම ප්‍රතිආරෝපණ ක්‍රමවේදය යොදා ගැනීම සඳහා සැලසුම් කොට ඇත.

භූගත ජලය කළමනාකරණය කරමින් භූගත ජලය පරිහරණය කිරීම සඳහා භූගත ජලය උකහාගන්නා ආයතන හා භාහිර නල ළිං විදුම් ආයතන නියාමනය කිරීමට කටයුතු යොදා ඇති අතර, එය තව දුරටත් ක්‍රමවත් කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලයේ පනත සංශෝධනය කර අමාත්‍යාංශය වෙත යොමු කර ඇති එමඟින් රටෙහි භූගත ජල සම්පත් තිරසාරව භාවිතා කිරීමට සැලසුම් සකස් කර ඇත.

මේ යටතේ ප්‍රධාන පියවරක් ලෙස භූගත ජල සම්පත් වල භාවිතය සහ එහි උකහාගැනීම පිළිබඳව මූලික තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මුළු රටම ආවරණය වන සේ තොරතුරු එක්රැස් කිරීම් ක්‍රියාවලියන්ද මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ අනුව, භූගත ජල සම්පත ආරක්ෂා කිරීම හා මන උපයෝගිකරණය මඟින් අනාගත පරපුරට ජලය ආරක්ෂා කිරීමේ වගකීම ඉහත කැපවීමෙන් යුතුව සිදු කරන බව සඳහන් කරමි.

## ජල සම්පත් මණ්ඩලයේ



## සංවිධාන සටහන


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (1)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මා ස හා මු) (1)
3
සහකාර සාමාන්‍යාධිකාරී(ඉංජිනේරු) (1)
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (1)
සහකාර සාමාන්‍යාධිකාරී (පාලන හා මුදල්)
8
ඉංජිනේරු (යාන්ත්‍රික) (1)
ඉංජිනේරු (සිවිල්) (1)
ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ/භූජල විද්‍යාඥ (1)
ගණකාධිකාරී (1)
කළමණාකරු (පාලන) (1)
නීති නිලධාරී (1)
අභ්‍යන්තර විගණක (1)
47
ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) (2)
ඉංජිනේරු සහකාර (සිවිල්) (1)
ප්‍රගති සමාලෝචන නිලධාරී (1)
ගිණුම් නිලධාරී (1)
bn පාලන නිලධාරී (2)
ප්‍රවාහන නිලධාරී (1)
විගණන නිලධාරී (1)
27
තාක්ෂණික සහකාර (යාන්ත්‍රික) (6)
තාක්ෂණික සහකාර (සිවිල්)(2)
ගිණුම් සහකාර (2)
වැඩපල පරීක්ෂණක (2)
වැඩ පරීක්ෂක (2)
විගණන සහකාර (2)
54
කළ.සහකාර(2)
කළ.සහකාර (1)
කළ.සහකාර (1)
කළ.සහකාර (1)
කළ.සහකාර (1)
කළ.සහකාර(6)
කළ.සහකාර (5)
ආරක්ෂක නිලධාරී (1)
කළ.සහකාර (2)
කළ.සහකාර (1)
38
පට්ටල්කරු/පෑස්සුම්ශිල්පී (1)
වැද්දුම්/පෑස්සුම් (3)
බර යන්ත්‍ර ක්‍රියාකරු (2)
මෝටර් කාර්මික (2)
තහඩු වැඩ/පින්තාරු (2)
මෝටර් විදුලි කාර්මික (1)
මේසන් (3)
ජල නල කාර්මික (4)
විදුලි කාර්මික (1)
රියදුරු (40)
83
නඩත්තු සහායක (1)
සංචාරක නිවාස භාරකරු (1)
11
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (4)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කම්කරු (10)
කම්කරු (3)
ආරක්ෂක නියාමක (14)
142
414

## 2023.12.31 දිනට කාර්යය මණ්ඩලය

| වැටුප් තලය | අනුමත කාර්යය මණ්ඩලය ස්ථිර | වර්තමාන කාර්යය මණ්ඩලය ස්ථිර |
|---|---|---|
| HM | 12 | 04 |
| MM | 47 | 31 |
| JM | 27 | 10 |
| MA | 92 | 50 |
| PL | 236 | 143 |
| | | |



# 2023.12.31 දිනට කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය

| තනතුර | වැටුප් තලය | අනුමත සේවක මණ්ඩලය | වර්තමාන සේවක මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | HM | 1 | 0 | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | HM | 3 | 1 | 2 |
| සහකාර සාමාන්‍යාධිකාරී | HM | 8 | 3 | 5 |
| පළාත් කළමනාකරු | MM | 5 | 0 | 5 |
| භූජල විද්‍යාඥ / ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ | MM | 24 | 23 | 1 |
| ඉංජිනේරු (යාන්ත්‍රික) | MM | 1 | 0 | 1 |
| ඉංජිනේරු (සිවිල්) | MM | 2 | 1 | 1 |
| රසඥ | MM | 7 | 5 | 2 |
| කළමනාකරු (විදුම්) | MM | 3 | 0 | 3 |
| අභ්‍යන්තර විගණක | MM | 1 | 1 | 0 |
| ගණකාධිකාරී | MM | 1 | 0 | 1 |
| කළමනාකරු (පාලන) | MM | 1 | 1 | 0 |
| කළමනාකරු (ප්‍රසම්පාදන) | MM | 1 | 0 | 1 |
| නීති නිලධාරී | MM | 1 | 0 | 1 |
| ජ්‍යෙෂ්ඨ ජල විශ්ලේෂක | JM 1-1 | 1 | 0 | 1 |
| පුද්ගලික සහකාර - සභාපති | JM 1-1 | 1 | 1 | 0 |
| පුද්ගලික සහකාර - සාමාන්‍යාධිකාරී | JM 1-1 | 1 | 1 | 0 |
| පාලන නිලධාරී | JM 1-1 | 2 | 2 | 0 |
| ගිණුම් නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| ප්‍රවාහන / ප්‍රවර්ධන නිලධාරී | JM 1-1 | 1 | 0 | 1 |
| පරිසර නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| විගණන නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| පුස්ථකාලාධිපති | JM 1-1 | 1 | 0 | 1 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| ඉංජිනේරු සහකාර (සිවිල්) | JM 1-1 | 4 | 0 | 4 |
| ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) | JM 1-1 | 2 | 0 | 2 |
| ගබඩා අධිකාරී | JM 1-1 | 1 | 0 | 1 |
| ප්‍රසම්පාදන නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| විදුම් අධිකාරී | JM 1-1 | 6 | 1 | 5 |
| ප්‍රගති අධීක්ෂණ නිලධාරී | JM 1-1 | 1 | 0 | 1 |
| විමර්ෂණ නිලධාරී | JM 1-1 | 1 | 0 | 1 |
| තාක්ෂණික සහකාර (සිවිල්) | MA 2-2 | 7 | 1 | 6 |
| තාක්ෂණික සහකාර (යාන්ත්‍රික) | MA 2-2 | 6 | 4 | 2 |
| සහකාර විදුම් අධිකාරී | MA 2-2 | 14 | 10 | 4 |
| විමර්ෂණ සහකාර | MA 2-2 | 4 | 0 | 4 |
| ජල විශ්ලේෂක | MA 2-2 | 10 | 10 | 0 |
| වැඩ පරීක්ෂක | MA 2-2 | 2 | 1 | 1 |
| වැඩපල පරීක්ෂක | MA 2-2 | 2 | 0 | 2 |
| පද්ධති ක්‍රියාකරු | MA 2-2 | 1 | 1 | 0 |
| ගිණුම් සහකාර | MA 2-2 | 2 | 0 | 2 |
| ගබඩා භාරකරු | MA 2-2 | 3 | 2 | 1 |
| තොරතුරු තාක්ෂණ ශිල්පී | MA 2-2 | 1 | 1 | 0 |
| කළමණාකරණ සහකාර | MA 2-1 | 2 | 2 | 0 |
| කළමණාකරණ සහකාර | MA 1-2 | 37 | 18 | 19 |
| ආරක්ෂක නිලධාරී / සහකාර | MA 1-2 | 1 | 0 | 1 |
| විදුම් යාන්ත්‍රික ශිල්පී රියදුරු | PL 3 | 7 | 0 | 7 |
| මේසන් | PL 3 | 3 | 2 | 1 |
| ජල නල කාර්මික | PL 3 | 4 | 0 | 4 |
| රියදුරු | PL 3 | 50 | 32 | 18 |
| වෑද්දුම් ශිල්පී / පෑස්සුම් ශිල්පී | PL 3 | 3 | 2 | 1 |
| මෝටර් කාර්මික | PL 3 | 2 | 1 | 1 |
| පට්ටල්කරු / පෑස්සුම් ශිල්පී | PL 3 | 1 | 1 | 0 |
| විදුලි කාර්මික | PL 3 | 1 | 0 | 1 |
| මෝටර් විදුලි කාර්මික | PL 3 | 1 | 0 | 1 |
| තහඩු වැඩ ශිල්පී / පින්තාරු ශිල්පී | PL 3 | 2 | 0 | 2 |
| බර යන්ත්‍ර ක්‍රියාකරු | PL 3 | 2 | 0 | 2 |
| විදුම් යන්ත්‍ර ක්‍රියාකරු සහ රියදුරු | PL 3 | 7 | 2 | 5 |
| විදුම් සහායක | PL 2 | 7 | 0 | 7 |
| නඩත්තු සහායක | PL 2 | 3 | 2 | 1 |
| සංචාරක නිවාස භාරකරු | PL 2 | 1 | 0 | 1 |
| කම්කරු | PL 1 | 105 | 78 | 27 |
| කාර්යාල සහායක | PL 1 | 23 | 14 | 09 |
| ආරක්ෂක නිලධාරී | PL 1 | 14 | 09 | 05 |
| **එකතුව** | | **414** | **238** | **176** |

# ප්‍රධාන ක්‍රියාකාරකම්

## නල ළිං ඉදිකිරීම





## ජල ධාරිතා පරීක්ෂණ





## භූජල පරීක්ෂණ



## ජල සාම්පල පරීක්ෂණ



# ජල සම්පත් මණ්ඩලය විසින්
# 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ
# මෙහෙයුම් කාර්යයන්

## ජල සම්පත් මණ්ඩලයේ විෂය පථය සහ කාර්යභාරය

1964 අංක 29 දරන පනත මගින් ජල සම්පත් මණ්ඩලය පිහිටුවන ලද අතර එම පනතේ 12.1 වගන්තිය අනුව ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන විෂය පථය වූයේ අමාත්‍යවරයාට උපදෙස් දීමයි. ඒ අනුව 1979 වර්ෂයේ සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූගත ජල අංශයට අනුබද්ධව, භූගත ජල ගවේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සහභාගී වීමත්, පනතේ 12.1 වගන්තිය යටතේ අවශ්‍ය කටයුතු සිදු කිරීමත් ජල සම්පත් මණ්ඩලය මගින් ඉටු කරනු ලබයි. ඒ අනුව මහවැලි සංවර්ධන ප්‍රදේශවල සහ අනෙකුත් වියළි කලාපීය ප්‍රදේශවල රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් ක්‍රියාත්මක වන (මොනරාගල, හම්බන්තොට, පුත්තලම, කුරුණෑගල, උතුරු හා නැගෙනහිර පළාත් වල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති වැනි) භූගත ජල ගවේෂණය, නළ ළිං ඉදිකිරීම්, අත් පොම්ප සවිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය ප්‍රමුඛත්වය ලබා දී ඇත.

බහුවිධ අරමුණු උදෙසා භූගත ජලය සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත් සමඟ, භූගත ජල සංවර්ධන කටයුතු සඳහා එහි විෂය පථය පුළුල් කිරීමට හැකි වන පරිදි 1999 දී, 1964 අංක 29 දරන පනත සංශෝධනය කිරීම හරහා භූගත ජලය පිළිබඳව වැඩි වගකීමක් ජල සම්පත් මණ්ඩලය වෙත පැවරිණි. මෙම සන්දිස්ථානයේදී, නළ ළිං ඉදිකිරීම් සහ අත් පොම්ප සවි කිරීම ආදී කටයුතු වලට අමතරව තව දුරටත් ජල සම්පත් මණ්ඩලය විසින් භූගත ජලය ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති, අධ්‍යයන, භූගත ජල ගවේෂණ වැඩසටහන් සහ ජාතික ආර්ථික සංවර්ධනයට සහ ප්‍රජාවගේ යහපැවැත්මට දායක වන ඵලදායී ජලධර හඳුනාගැනීම් ආදී පුළුල් පරාසයක් තුල විහිදුනු කටයුතු රාශියක් සිදු කරන ලදී.

සහස්‍රකයේ මුල් දශකය තුළ, කිසිදු විද්‍යාත්මක මාර්ගෝපදේශයක් අනුගමනය නොකර සීමිත ජල සම්පතක් වන භූගත ජල ප්‍රභවයන් ලබා ගැනීම සඳහා පෞද්ගලික පාර්ශව මෙන්ම පෞද්ගලික ආයතන විසින් විවිධ අරමුණු සඳහා රට තුළ නළ ළිං ඉදිකිරීමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි මෙම ප්‍රවණතාවය නිසා භූගත ජලය සීමාවකින් තොරව විවිධ කටයුතු වලට උකහා ගැනීම හේතුවෙන්, මුහුදු ජලය රට තුලට ගලා ඒම නිසා ලවණීකරණය වැඩි වීම, භූගත ජලය ක්ෂය වීම, රටේ විවිධ ප්‍රදේශවල මානව ක්‍රියාවලීන් හරහා භූගත ජලය දූෂණය වීමෙන් ගුණාත්මක භාවය පිරිහීම ආදී හානිදායක කටයුතු සිදු වී ඇති බව මෙම සංවේදී භූගත ජල මූලාශ්‍ර ආශ්‍රිතව ජල සම්පත් මණ්ඩලය විසින් සිදු කරන ලද භූගත ජල අධ්‍යයනයන් මගින් හඳුනාගෙන ඇත.

ඉතා සංවේදී භූගත ජල මූලාශ්‍ර පවතින ප්‍රදේශ වල භූගත ජලයේ ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව පිරිහීම සහ ඒ හේතුවෙන් ඉදිරිපත් කරන ලද මහජන පැමිණිලි නිසා විවිධ කටයුතු හේතුවෙන් භූගත ජලයට සිදු වන බලපෑම් අවම කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් නිසි කළමනාකරණ සැලැස්මක් ඔස්සේ විසඳුම් සෙවීම සඳහා යොමු වන ලදී. ඒ අනුව මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, භූගත ජල සම්පත් නියාමනය, පාලනය සහ කළමනාකරණය කිරීමේ වගකීම ජල සම්පත් මණ්ඩලය වෙත පවරමින් 2017 වර්ෂයේදී අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සමත් විය.

වර්තමානයේදී, රටේ පවතින ඵලදායී ජලධර පිළිබඳ පර්යේෂණ, අධ්‍යයනය, අධීක්ෂණය සහ ගවේෂණය ආදී කටයුතු සිදු කිරීම මගින් එක්රැස් කරගන්නා තොරතුරු අනාගතයේ උපාය මාර්ගික හා ආර්ථික වශයෙන් වැදගත් සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රයෝජනයට ගැනීම ජල සම්පත් මණ්ඩලය මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. මීට අමතරව, සියලුම ආකාරයේ කැණීම් කටයුතු, උමං ඉදි කිරීම, සහ සියලුම ජාතික වශයෙන් වැදගත් සංවර්ධන ව්‍යාපෘති වලදී EIA, IEE, SEA ආදී කටයුතු වලදී භූගත ජලයට සිදුවන බලපෑම් තක්සේරුව හා එම බලපෑම් අවම කිරීම සඳහා නිර්දේශ ලබා දීම ජල සම්පත් මණ්ඩලය මගින් සිදු කෙරේ. ක්‍රමානුකූලව සිදු කරනු ලබන සැලසුම් පාලනයක් සහ නියාමනයක් සහිතව ක්‍රියාත්මක කිරීම මගින් මෙම අධ්‍යයනයන් මගින් ලබා දෙන තොරතුරු හා නිර්දේශ, රටේ පවතින භූගත ජලයෙහි තිරසාර කළමනාකරණය සඳහා අඩිතාලම සපයයි.

මීට අමතරව, ජල සම්පත් මණ්ඩලයේ අනාගත සැලසුම් රටේ භූගත ජල සම්පත් නියාමනය හා කළමනාකරණය වෙත යොමු කෙරේ. විශේෂයෙන්ම ප්‍රධාන ගංගා ද්‍රෝණි 03ක් (මල්වතු ඔය, දැදුරු ඔය, කුඹුක්කන් ඔය) හා යාපනය සහ පුත්තලම ප්‍රදේශ ආශ්‍රිතව ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතිය මගින් හඳුන්වා දෙන ලද ක්‍රමානුකූල හා දිගු කාලීන භූගත ජල නිරීක්ෂණ ජාලය මගින් අනාගත භූගත ජල නියාමන හා සංවර්ධන කටයුතු සඳහා මූලික අඩිතාලම සපයනු ඇත. දිගු කාලීන සැලසුම් යටතේ මෙම ව්‍යාපෘතිය රටේ පවතින සියලුම ගංගා ද්‍රෝණි ආවරණය වන පරිදි පුළුල් කෙරේ. මේ අතර ගංගා ද්‍රෝණි 08 ක් ආශ්‍රිතව සිදු කිරීමට නියමිත භූගත ජල

කළමනාකරණ අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ මූලික අදියර දැනට ආරම්භ කර ඇත. රටේ පවතින භූගත ජලය කළමනාකරණය හා නියාමනය සඳහා අවශ්‍ය නෛතික රාමුව ශක්තිමත් කිරීම සඳහා දැනට පවතින ජල සම්පත් පනත සංශෝධනය කිරීමේ කටයුතුද සිදු කරමින් පවතී.

ජල සම්පත් මණ්ඩලය භූගත ජලය හා සම්බන්ධ සියලුම කටයුතු සඳහා වගකීම දරන ආයතනය වේ. මෙම කරුණ සැලකිල්ලට ගෙන, ජල සම්පත් මණ්ඩලය ප්‍රධාන වශයෙන් ගංගා ද්‍රෝණි ආශ්‍රිතව භූගත ජලය සම්බන්ධව පර්යේෂණ, නිරීක්ෂණ, නියාමන හා තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස්කරනු ලබයි. වර්තමානයේදී ජල සම්පත් මණ්ඩලය විසින් මූලික අවධානය යොමු කර ඇත්තේ භූගත ජලය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අවශ්‍ය නෛතික හා කළමනාකරණ ව්‍යුහය සකස් කිරීම සඳහා වේ.

## 2023 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්

2023 වර්ෂය තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සැලසුම් කරන ලදී. මූලික වශයෙන් ව්‍යාපෘති හා මෙහෙයුම් කටයුතු කොටස් තුනකට බෙදා දැක්විය හැක.

1) **භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු කරන ව්‍යාපෘති -** 2023 වසර සඳහා නිපුණතා සහ ආයතනික යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුළුව ප්‍රජා මූල සංවිධාන සහ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම සහිත ප්‍රදේශවල කළමනාකරණය කරන ලද ජලධර නැවත ආරෝපණය කිරීම පිළිබඳ භූගත ජල සම්පත් අධීක්ෂණය සහ ශක්‍යතා අධ්‍යයනයන් සැලසුම් කර ඇත.

2) **උත්පාදිත ක්‍රියාකාරකම් -** මෙරට භූගත ජලය භාවිතා කරන්නන්ගේ වාණිජ්‍යමය ක්‍රියාකාරකම් (නළ ළිං ඉදි කිරීම්, පිරිසිදු කිරීම, ජල ධාරිතා පරීක්ෂණ, ජල තත්ත්ව විශ්ලේෂණය) සහ නිශ්චිත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශන තුළින් භූගත ජල සම්පත් නියාමනය.

3) **විදේශ අරමුදල් යටතේ සිදු කරන ව්‍යාපෘති**

i.) **ප්‍රජා මූලික සංවිධාන (CBO) සහ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම (RWSS) තුළ භූගත ජල සම්පත් මත ජලධර ප්‍රතිචක්‍රීකරණ පද්ධති කළමනාකරණය කිරීම ක්‍රියාත්මක කිරීම**

CBOs, RWSS හි භූගත ජලය නැවත ආරෝපණය කිරීමේ ශක්‍යතා පිළිබඳ මූලික තක්සේරුව සැලසුම් කර ඇති අතර, 2023 වර්ෂයේදී මූලික තක්සේරු අධ්‍යයනයන් මත පදනම්ව කළ හැකි ජලධර නැවත ආරෝපණය (MAR) කළමනාකරණය කළ හැකි ස්ථාන දෙකක ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා UNICEF විසින් අරමුදල් සපයනු ලැබේ.

ii.) **ඒකාබද්ධ ජල සම්පත් සහ ජල පෝෂක කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) යටතේ "ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම"**

වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් දැනට ක්‍රියාත්මක වන "ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණය" ව්‍යාපෘතිය යටතේ භූගත ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීමේ උප සංරචකය ජල සම්පත් මණ්ඩලය විසින් එහි කටයුතු සිදු කිරීමට නියමිත අතර එම වැඩසටහන 2023 සිට 2025 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

මෙම කාල සීමාව තුළ භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ජයග්‍රහණ ඉහත ප්‍රධාන කාණ්ඩ තුන යටතේ පහත දැක්වේ.

**1.) භාණ්ඩාගාර ප්‍රතිපදන යටතේ සිදු කරන ව්‍යාපෘති (2023) - රු.මි. 20.0**

**වගුව 01 :** 2023 සඳහා භාණ්ඩාගාර ප්‍රතිපදන ව්‍යාපෘති සහ ප්‍රතිපාදන

| # | උප ව්‍යාපෘති/ උප ක්‍රියාකාරකම් | TEC (රු.මි.) | බලාපොරොත්තු වන ප්‍රතිලාභ/ ප්‍රතිඵල |
|---|---|---|---|
| 1 | දීර්ඝ කාලින භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM): කොළඹ-මීගමුව, අම්පාර, මන්නාරම, වවුනියාව, කිලිනොච්චි, යාපනය, අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ, පුත්තලම. | 4.0 | දීර්ඝ කාලින කළමනාකරණ හා සැලසුම් කටයුතු සඳහා රටේ සංවේදී භූගත ජලධර වළ ජලයේ ගුණාත්මක භාවය හා ජල මට්ටම් වළ වෙනස්කම් නිරීක්ෂණය කිරීම. |
| 2 | භූගත ජල සම්පත් කෙරෙහි දේශගුණ විපර්යාස වල ඍජු හා වක්‍ර බලපෑම් පිළිබඳව අධ්‍යයනය (SICC) | 1.50 | රටේ මුහුදුබඩ ප්‍රදේශවල පවතින භූගත ජල සම්පත් කෙරෙහි දේශගුණ විපර්යාස වල බලපෑම තක්සේරු කිරීම |
| 3 | මා ඔය ගංගා ද්‍රෝණියේ පවතින ජලධර නැවත ආරෝපණය සඳහා හිතකර කලාප හඳුනා ගැනීම (Ma-oya) | 1.40 | මා ඔය ද්‍රෝණියේ භූ ගත ජල සම්පත් කළමනාකරණය සඳහා භූ ජල විද්‍යාත්මක තක්සේරුව සහ ජලධර සිතියම් ගත කිරීම |
| 4 | භූගත ජල සම්බන්ධ පාරිසරික ගැටළු සඳහා සිදු කරන ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ (INSP) | 1.50 | භූ ගතජලය භාවිතය පිළිබඳ ගැටලු සඳහා පිළියම් යෙදීම සහ ගැටුම් නිරාකරණය සඳහා අනෙකුත් ආයතන හා ඒකාබද්ධව කටයුතු කිරීම |
| 5 | ශ්‍රී ලංකාවෙහි භූගත ජලය පැවතීම පිළිබඳ සිතියම් සකස් කිරීම (GW-ATLAS) | 0.60 | ශ්‍රී ලංකාවෙහි භූගත ජලය පැවතීම පිළිබඳ සිතියම් සකස් කිරීම |
| 6 | හදිසි ආපදා අවස්ථා වල අවශ්‍යතා සඳහා භූගත ජලය සංවර්ධනය (නියඟ, ගංවතුර, භූගත ජල සම්පත් දූෂණය වීම) (E-USE) | 3.00 | ජාතික මට්ටමේ ජලය ආශ්‍රිත ආපදා සිදුවීම් සම්බන්ධයෙන් සළකා බැලීම සහ ප්‍රතිකර්ම ක්‍රියාවට නැංවීම |
| 7 | ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම (REIMP) | 4.00 | ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය |
| 8 | ජල සම්පාදන යෝජනා ක්‍රමවල භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය (DMWSS) | 4.00 | සම්පූර්ණයෙන්ම භූගත ජල මූලාශ්‍ර මගින් ක්‍රියාත්මක වන අවදානම් මට්ටමේ ඇති හඳුනාගත් ජල සම්පාදන යෝජනා ක්‍රම තුළ භූගත ජලධර ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම |
| | **එකතුව** | **20.00** | |

## 1. භාණ්ඩාගාර ප්‍රතිපදන යටතේ සිදු කරන ව්‍යාපෘති

### 1.1 භූ ගත ජලය සඳහා සංවේදී ප්‍රදේශ තුළ දීර්ඝ කාලින භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM)

දිගු කාලීන භූගත ජල නිරීක්ෂණ ව්‍යාපෘතිය යනු ජල සම්පත් මණ්ඩලය විසින් මූලික වශයෙන් භූගත ජල අධ්‍යනය සිදු කළ සහ මූලික සමීක්ෂණ කටයුතු අවසන් කළ ප්‍රදේශ කිහිපයක අඛණ්ඩව භූගත ජල මට්ටම සහ රසායනික තත්ත්ව අධීක්ෂණය සිදු කරන ඒකාබද්ධ වැඩ සටහනකි. මෙම භූගත ජල අධ්‍යයන ආරම්භයේදීම ඒ ඒ ප්‍රදේශවල දිගු කාලීන භූගත ජල අධීක්ෂණ ජාල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා එක් එක් ව්‍යාපෘති ප්‍රදේශයේ හඳුනාගෙන තිබූ විවිධ භූගත ජල ගැටලු සැලකිල්ලට ගෙන පරීක්ෂණ නළ ළිං ඉදි කර ඇති අතර එමගින් එම ප්‍රදේශ වල පවතින ජලයේ ගුණාත්මක භාවය සහ ජල මට්ටම් අධ්‍යයනය කරනු ලැබේ.

**වගුව 02 :** දිගුකාලීන භූගත ජල අධීක්ෂණ ව්‍යාපෘති - 2023

| අංකය | ව්‍යාපෘතිය | ප්‍රදේශය | පර්යේෂණ නළළිං |
|---|---|---|---|
| 1. | කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වැලි සහිත ජලධරය සම්බන්ධව සිදු කරන ලද සවිස්තරාත්මක භූ ජල විද්‍යා අධ්‍යයනය | කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වෙරළබඩ වැලි තීරය | 78 |
| 2. | පුත්තලම දිස්ත්‍රික්කයේ භූගත ජල ආරෝපණය සඳහා සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම | පුත්තලම, කල්පිටිය ප්‍රදේශය | 14 |
| 3. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින භූගත ජලයේ පවතින අනතුරුදායක ඛණිජ හඳුනාගැනීම | අනුරාධපුර දිස්ත්‍රික්කය | 32 |
| 4. | වවුනියාව සහ කිලිනොච්චිය ප්‍රදේශ වල භූ ජල විද්‍යා අධ්‍යයනය | වවුනියාව සහ කිලිනොච්චිය | 35 |
| 5. | මොනරාගල දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදු කරන ලද භූ ජල විද්‍යා අධ්‍යයනය | මොනරාගල දිස්ත්‍රික්කය | 29 |
| 6. | මන්නාරම දිස්ත්‍රික්කය ආශ්‍රිතව පවතින හුණුගල් සහිත ජලධරය සම්බන්ධව සිදු කරන ලද භූ ජල විද්‍යා අධ්‍යයනය | මන්නාරම | 40 |
| 7 | කිරිඳි ඔය ගංගා ද්‍රෝණියේ සිදු කරන ලද සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය | කිරිඳි ඔය ගංගා ද්‍රෝණියේ | 25 |
| 8 | යාපනය ප්‍රදේශයේ පවතින ළිං පිළිබඳව සිදු කරන ලද සමීක්ෂණය | යාපනය අර්ධද්වීපය | 43 |
| 9 | DSWRPP යටතේ සිදු කරන ලද යාපනය භූගත ජල සම්පත් අධ්‍යයනය | යාපනය අර්ධද්වීපය | 35 |
| 10 | පොලොන්නරුව දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදු කරන ලද භූ ජල විද්‍යා අධ්‍යයනය | පොලොන්නරුව දිස්ත්‍රික්කය | 75 |
| 11 | මාතලේ දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදු කරන ලද භූ ජල විද්‍යා අධ්‍යයනය | මාතලේ දිස්ත්‍රික්කය | 35 |
| 12 | මල්වතුඔය - GWMNP | මල්වතුඔය ජල ද්‍රෝණිය | 85 |
| 13 | මාදුරු ඔය - GWMNP | මාදුරු ඔය ජල ද්‍රෝණිය | 20 |
| 14 | කුඹුක්කන් ඔය - GWMNP | කුඹුක්කන් ඔය ජල ද්‍රෝණිය | 20 |
| 15 | යාපනය - GWMNP | යාපනය අර්ධද්වීපය | 38 |
| 16 | පුත්තලම - GWMNP | පුත්තලම | 27 |
| 17 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 40 |

ඉහත අධීක්ෂණ ළිං වලට අමතරව, අවශ්‍යතාවය අනුව දැනට පවතින ළිං ද අදාළ ප්‍රදේශවල දිගු කාලීන අධීක්ෂණ ජාල පද්ධති වලට ඇතුළත් කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා අරමුණ වන්නේ ජල සාම්පල එක්රැස් කිරීම, ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීම, ජල මට්ටම අධීක්ෂණය කිරීම, අධීක්ෂණ තොරතුරු යාවත්කාලීන කිරීම සහ භූගත ජල සම්පත් කළමනාකරණය සඳහා අදාළ ප්‍රදේශවල ගුණාත්මකභාවය සහ ප්‍රමාණයේ දිගු කාලීන විචලනය හඳුනා ගැනීමයි.

මෙම කටයුතු යටතේ 2023 වර්ෂයේ ප්‍රගතිය පහතින් දක්වා ඇත

**වගුව 03 :** LTGM ව්‍යාපෘතිය ; 2023 වර්ෂයේ ප්‍රගතිය

| | ක්‍රියාකාරකම | 2023 වර්ෂයේ ඉලක්කය | 2022 වර්ෂයේ ඉලක්කය (%) | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | ජල නියදිකරණය | 2491 | 100% | 100% |
| 2 | ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 2095 | 100% | 62% |

### 1.1.1 කොළඹ සිට මිගමුව දක්වා වූ වෙරළබඩ වැලි සහිත ජල ධරය

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ පරිසරයට හානියක් නොවන පරිදි උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වෙරළබඩ ආශ්‍රිත නොගැඹුරු වැලි සහිත ජලධරය හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම, කළමනාකරණය කිරීම, සහ සංරක්ෂණය කිරීමයි.

කාර්මීකරණය සහ නාගරීකරණය හේතුවෙන් මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශ හා සසඳන විට ඉහළ වර්ධන වේගයක් සහ ඉහළ ජනගහන අනුපාතයක් ඇත. මේ අනුව, මිරිදිය සැපයුම ප්‍රමාණවත් නොවේ. කෙසේ වෙතත්, කොළඹ සහ මීගමුව අතර ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන නොගැඹුරු ජලධරයන්ගෙන් එකක් වන වෙරළබඩ වැලි සහිත ජල ධරය බටහිර වෙරළ දිගේ සැලකිය යුතු ලෙස සංවර්ධනය වී ඇති අතර එය ඉතා සපලදායි ජල ධරයක් වේ.

මතුපිට ජලය ඉල්ලුම සම්පූර්ණයෙන්ම සපුරාලන්නේ නැතත්, ප්‍රජාවෙන් 50% කට වඩා වැඩි පිරිසක් භූගත ජල සම්පත් ලෙස දැනටමත් පවතින නොගැඹුරු ළිං සහ නල ළිං මත රඳා සිටිති.

මෙම ජලධරය ගුවන් තොටුපළ, BOI කටුනායක, වෙනත් කර්මාන්ත සහ හෝටල් ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතන ගණනාවකින් සැලකිය යුතු ජල ප්‍රමාණයක් නිස්සාරණය කිරීමට යොදා ගනී. ජල ළිං අංශය ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වීමත් සමඟ අධික භූගත ජලය නිස්සාරණය පරිසරයට අහිතකර බලපෑමක් ඇති කරයි. ප්‍රදේශය ලවණීකරණය වීම, භාවිතයට ගත හැකි භූගත ජලය අවම වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩබිම ගිලා බැසීම් ආදියද සිදු විය හැක.




**රූපය 01 :** ජල මට්ටම් විචලනය (2012 - 2023)

පරිසරයට හානියක් නොවන පරිදි උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වැලි සහිත ජලධරය හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම, කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා කොළඹ සිට විහිදෙන වෙරළබඩ වැලි

ජලධරයට මානව හා ස්වභාවික ක්‍රියාකාරකම්වල බලපෑම තක්සේරු කරන දීර්ඝ කාලීන නිරීක්ෂණ ජාලයක් ශ්‍රී ලංකා ජල සම්පත් මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී.




**රූපය 02 :** භූගත ජලයේ නයිට්රේට විචලනය

2017 පෙබරවාරි මාසයේ CNEG/TW/2012/34 හැර පසුගිය වසර 11 තුළ නයිට්‍රේට් විචලනය mg/L හි නයිට්‍රේට් 50 (NO-3 ලෙස) අවසර ලත් මට්ටම යටතේ පවතී. නිරීක්ෂිත ළිං බහුතර සංඛ්‍යාවක ජල මට්ටම් පසුගිය වසර 11 තුළ වර්ෂාපතන රටාව අනුගමනය කරයි. පසුගිය වසර 11 තුළ ඉහළ වියුක්ත කිරීම්වලදී ජල මට්ටමේ වෙනස්කම්වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැත. කෙසේ වෙතත්, මෙම ප්‍රදේශයේ ඉහළ ජනගහනය, අධික කර්මාන්තශාලා ඝනත්වය, අධික ලෙස භූගත ජලය නිස්සාරණය මෙන්ම ජල ධරයේ ඉහළ සංවේදීතාව හේතුවෙන් මෙම අධීක්ෂණ වැඩසටහන දිගටම සිදු කරගෙන යාමට නිර්දේශ කෙරේ.

### 1.1.2 පුත්තලම දිස්ත්‍රික්කය

2011 වසරේ භාණ්ඩාගාර ප්‍රදානය යටතේ මෙම අධ්‍යයනය ආරම්භ කර 2015 දී අවසන් කරන ලදී. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු ඒ සඳහා තෝරා ගන්නා ලද දීර්ඝ කාලීන භූගත ජල අධීක්ෂණ ජාලය (LTGM) ව්‍යාපෘතිය යටතේ දීර්ඝ කාලීන අධීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී.

ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ප්‍රදේශයේ පවතින භූගත ජලධරවල පරාමිතීන් හඳුනා ගැනීම සහ ජලධරය සංවර්ධනය කිරීම, භූගත ජලය නැවත ආරෝපණය කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම සහ භූගත ජල විභවය ඉහළ නැංවීම මෙන්ම අධික ලෙස භූ ගත ජලය උකහා ගැනීම, මුහුදු ජලය රට තුලට කාන්දු වීම සහ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් භූගත ජලයට සිදුවන බලපෑම (කෘෂිරසායන හා පළිබෝධනාශක අධික ලෙස භාවිතා කිරීම වැනි) පිළිබඳව අවබෝධ කර ගැනීමයි. එමගින් ප්‍රදේශය සඳහා සුදුසු සහ තිරසාර භූගත ජල සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සිදු කල හැක.

**වගුව 04 :** 2023 වර්ෂයේ ප්‍රගතිය.

| ක්‍රියාකාරකම | 2023 වර්ෂයේ ඉලක්කය | 2023 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|---|
| ජල මට්ටම නිරීක්ෂණය | 214 | 214 |
| ජල සාම්පල එක්රැස් කිරීම<br>රසායනික විශ්ලේෂණය<br>බැර ලෝහ විශ්ලේෂණය | 214<br>60 | 214<br>60 |
| ජල සාම්පල විශ්ලේෂණය<br>රසායනික<br>බැර ලෝහ | 214<br>60 | 214<br>60 |




**රූපය 03:** ප්‍රදේශය තුල ජල මට්ටම් විචලනය

ඉහත ජල මට්ටමේ විචල්‍ය ප්‍රස්ථාරයට අනුව, 2023 දී බොහෝ ළිංවල ජල මට්ටම 2022 ජල මට්ටමට වඩා ගැඹුරු ය. 2019 දී, වර්ෂා සමයේදී බොහෝ ප්‍රදේශවල ජල මට්ටම මීටර් 2 ක් දක්වා ඉහළ ගොස් ඇත.

### 1.1.3. අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙම ප්‍රදේශය තුල පවතින නොගැඹුරු හා ගැඹුරු ජලධරවල ජලයේ ගුණාත්මක භාවයේ ව්‍යාප්තිය හඳුනා ගැනීමත්, ඒ පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කිරීමත්, ඒ ආශ්‍රයෙන් නිසි නිර්දේශ ඉදිරිපත් කිරීමත් අරමුණු කොට 2011 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ බහුලව පැතිර යන නිදන්ගත වකුගඩු රෝග (CKDu) සහ අනෙකුත් ජලයෙන් බෝවන රෝග පාලනය කිරීමේ අදහසින් ග්‍රාමීය ජනතාව ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ ඒ සම්බන්ධව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා අනුරාධපුර, කොරකහවැව ජල සම්පත් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් ජල සායන සංවිධානය කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ මූලික අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසු එම අධ්‍යයනයන් සඳහා භාවිතා කරන ලද භූගත ජල නිරීක්ෂණ ජාලය 2015 වසරේ සිට දීර්ඝ කාලීන භූගත ජල නිරීක්ෂණ ව්‍යාපෘතියට සම්බන්ධ කරන ලදී.

2023 වසර තුල, සවිස්තරාත්මක අධීක්ෂණය සඳහා තෝරාගත් නියැදීම් ස්ථාන 90ක් කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතියට ස්ථානීය දත්ත රැස් කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ රසායනාගාර විශ්ලේෂණය ඇතුළත් වේ. වගුව 5 මඟින් එක් එක් ක්‍රියාකාරකම්වල සංඛ්‍යාත්මක ප්‍රගතිය දක්වා ඇත.

**වගුව 05 :** 2023 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්..

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 1 | ජල මට්ටම් නිරීක්ෂණය සහ ජල සාම්පල එක් රැස් කිරීම | 167 |
| 2 | ක්ෂේත්‍රය තුලදී ජල සාම්පල විශ්ලේෂණය | 167 |
| 3 | ජල සාම්පල විශ්ලේෂණය | |
| | රසායනික | 167 |
| | බැර ලෝහ | - |




**රූපය 04:** ජල සාම්පල එක් රැස් කිරීම සහ ජල මට්ටම් නිරීක්ෂණය

### 1.1.4 කිලිනොච්චි දිස්ත්‍රික්කය

මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2013-2014 කාල සීමාව තුළ ඒ සඳහා සැලසුම් කරන ලද මූලික අධ්‍යයනයන් නිම කරන ලදී. මෙහිදී, භූගත ජලය පවතින ප්‍රදේශ හඳුනා ගැනීම, ප්‍රදේශයේ පවතින ජලධර වල පැතිරීම සහ ඒවායේ භූ ජල විද්‍යාත්මක පරාමිතීන් හඳුනා ගැනීම සහ කුඩා පරිමාණ වාරි කෘෂිකර්මය සහ පානීය කටයුතු සඳහා භූගත ජල මූලාශ්‍ර හඳුනා ගැනීම යන කරුණු අරමුණු කර මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඉන්පසු එම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද භූගත ජල අධීක්ෂණ ජාලය දීර්ඝ කාලින අධීක්ෂණ කටයුතු සඳහා (LTGM) ව්‍යාපෘතිය සමග ඒකාබද්ධ කරන ලදී. ඒ අනුව 2022 වර්ෂය තුලදී ජල සාම්පල එක්රැස් කිරීමත්, ඒවා රසායනික විශ්ලේෂණයට භාජනය කිරීමත්, ජල මට්ටම් නිරීක්ෂණය කිරීමත් සිදු කරන ලදී.

**නිරීක්ෂණ**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ වල ජලයේ මිශ්‍ර ද්‍රවිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය (TDS), විද්‍යුත් සන්නායකතාවය, ක්ලෝරයිඩ් ප්‍රමාණය, ජලයේ කඨිනත්වය, කැල්සියම් ප්‍රමාණය, මැග්නීසියම් ප්‍රමාණය සහ යකඩ ප්‍රමාණය, පානීය ජලය තුල පැවතිය යුතු ප්‍රමාණයන්ට වඩා වැඩි ප්‍රමාණ වලින් පවතී. 2022 වසර තුල සිදු කරන ලද විශ්ලේෂණයන්ට අනුව පානීය ජලය සඳහා හිතකර සීමාවන් තුල භූගත ජලය පවතින්නේ අයියකච්චි-පලෙයි ප්‍රදේශය තුළ පමණි.

**නිර්දේශ**

ජල සාම්පල විශ්ලේෂණ ප්‍රතිඵල අනුව, මෙම ප්‍රදේශය තුල ජලයෙහි ගුණාත්මක භාවය සම්බන්ධ ගැටළු කිහිපයක් දක්නට ලැබේ. සාමාන්‍යයෙන්, දිස්ත්‍රික්කයේ ගැඹුරු භූගත ජලධරය පානීය ජලය සඳහා වන 614: 2013 දරන ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල නොවේ.

ප්‍රදේශයේ සාමාන්‍ය ජල මට්ටම පොළව මට්ටමේ සිට මීටර් 2 සිට 16.5 දක්වා වෙනස් වන අතර එය සම්පූර්ණයෙන්ම පාලනය වන්නේ ප්‍රදේශයේ වර්ෂාපතන රටාව අනුව වේ.

ගුණාත්මක භාවයෙන් ඉහළ නොගැඹුරු භූගත ජලය පවතින අයියකච්චි-පලෙයි ප්‍රදේශයේ ඝනකම් වැලි ස්තරයක් සහිත ජල ධරයක් පවතී. එබැවින් මෙම ජලධරය මානව ක්‍රියාකාරකම් වලින් හානි වීම වැළැක්වීම අවශ්‍ය වේ. විශේෂයෙන් භූගත ජලය අධික ලෙස උකහා ගැනීම සහ අහිතකර කෘෂිකාර්මික කටයුතු සහ නාගරීකරණයත් නොගැඹුරු ජලධරය ඉතා ඉක්මනින් දූෂණය වීමට හේතු වේ. එබැවින් මෙම ප්‍රදේශය තුළ නැවත පදිංචි කිරීම හෝ නව ව්‍යාපෘතියක් යෝජනා කරන විට ඉහත කරුණු ඉතා ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය.

මීට අමතරව කෘෂි රසායන මගින් භූගත ජලය දූෂණය වීම වැළැක්වීමට අවධානය යොමු කල යුතු අතර එසේ නොකළ හොත්, නුසුදුසු කෘෂි කාර්මික ක්‍රම භාවිතය හේතුවෙන් අනාගතයේදී භූගත ජල සම්පතට සැලකිය යුතු තර්ජනයක් ඇති කරනු ඇත.

දිස්ත්‍රික්කයේ භූගත ජල මට්ටම්වල විචලනය සහ භූ ගත ජලයේ රසායනික සාධක සැලකිල්ලට ගනිමින්, දැනට පවතින අධීක්ෂණ වැඩසටහන අඛණ්ඩව සිදු කිරීම නිර්දේශ කරනු ලැබේ.

එමෙන්ම දිස්ත්‍රික්කයේ ඊසානදිග ප්‍රදේශයේ නොගැඹුරු ජලධර හැසිරීම් හඳුනා ගැනීම සඳහා අධීක්ෂණ ජාලයට නොගැඹුරු ළිං කිහිපයක් හඳුන්වා දීමට යෝජනා කෙරේ.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ වල වසරේ පළමු කාර්තුවේදී Ca, Mg, Cl- හා කඨිනත්වය නිර්දේශිත පරාසයේ නොමැත. එබැවින් පානීය කටයුතු සඳහා භූගත ජලය භාවිතා කිරීම සඳහා ජලය පිරිපහදු කළ යුතුය.

දිස්ත්‍රික්කය තුළ නළ ළිං ඉදිකිරීමේදී, ප්‍රදේශයේ කරදිය-මිරිදිය අතුරු මුහුණත පවතින ගැඹුර පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර එම ගැඹුර ඉක්මවා නළ ළිං ඉදි කිරීමෙන් මුහුදු ජලය රට තුලට ඇතුළු වීම සිදු විය හැක. මෙය වළක්වා ගැනීම සඳහා ළිංවල ගැඹුර පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය.

**වගුව 6 :** 2023 වර්ෂයේ ප්‍රගතිය

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| ජල සාම්පල එක් රැස් කිරීම | 39 |
| ක්ෂේත්‍රය තුලදී ජල සාම්පල විශ්ලේෂණය | 19 |
| ජල මට්ටම් නිරීක්ෂණය | 34 |
| ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 39 |
| බැර ලෝහ විශ්ලේෂණය | 10 |

### 1.1.5. වවුනියා දිස්ත්‍රික්කය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ භූගත ජල විභවයක් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම සහ අනාගත පානීය ජලය සහ කුඩා පරිමාණ වාරි කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා භූගත ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම වේ.

මීට අමතරව ජලධරයෙහි පැතිරීම සහ භූ ජල විද්‍යාත්මක පරාමිතීන් හඳුනා ගැනීමද විශේෂ අරමුණක් විය.

මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2013-2014 කාල සීමාව තුළ ඒ සඳහා සැලසුම් කරන ලද මූලික අධ්‍යයනයන් නිම කරන ලදී. ඉන්පසු එම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද භූගත ජල අධීක්ෂණ ජාලය දීර්ඝ කාලීන අධීක්ෂණ කටයුතු සඳහා (LTGM) ව්‍යාපෘතිය සමග ඒකාබද්ධ කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය තුලදී ජල සාම්පල එක්රැස් කිරීමත්, ඒවා රසායනික විශ්ලේෂණයට භාජනය කිරීමත්, ජල මට්ටම් නිරීක්ෂණය කිරීමත් සිදු කරන ලදී.

**වගුව 07 :** 2023 වර්ෂයේ ප්‍රගතිය

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| ජල සාම්පල එක් රැස් කිරීම | 34 |
| ක්ෂේත්‍රය තුලදී ජල සාම්පල විශ්ලේෂණය | 17 |
| ජල මට්ටම් නිරීක්ෂණය | 33 |
| ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 34 |
| බැර ලෝහ විශ්ලේෂණය | 10 |

### 1.1.6 මොණරාගල දිස්ත්‍රික්කය

මොනරාගල දිස්ත්‍රික්කයේ භූගත ජල රසායන විද්‍යාව සහ ජල මට්ටමේ උච්චාවචනයන් පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. විවිධ ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සහ පානීය ජල ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රම සහ පද්ධති පිළිබඳව දැනුවත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.




**රූපය 05:** අධීක්ෂණ සඳහා තෝරාගත් ළිං

**2023 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්**





**රූපය 06:** ජල සාම්පල එක්රැස් කිරීම

2020 සහ 2023 දක්වා ළිංවල ජල මට්ටමේ උච්චාවචනයන් පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.




**රූපය 05:** මොනරාගල ප්‍රදේශයේ 2020 සිට ජල මට්ටමේ උච්චාවචනය

### 1.1.7 කිරිඳි ඔය

ශ්‍රී ලංකාවේ ගිනිකොන දෙසට වන්නට පිහිටා ඇති කිරිඳි ඔය ගංගා ද්‍රෝණිය 6.904 0 සහ 6.187 $^{0}$ N අක්ෂාංශ සහ 80.987 සහ 81.331 $^{0}$ E දේශාංශ අතර පිහිටා ඇති අතර 1,203 $km^2$ ජල පෝෂක ප්‍රදේශයකින් පෝෂණය වන කිලෝමීටර 118 ක් පමණ දිගින් යුතු කිරිඳි ඔය ඌව සහ දකුණු පළාත්වලත්, බදුල්ල, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වලත් ව්‍යාප්ත වේ. අධ්‍යන ප්‍රදේශය උතුරින් මහවැලි ගංගා ද්‍රෝණියත්, බටහිරින් වලවේ ගඟ හා මල ඔය ද්‍රෝණියත්, නැගෙනහිරින් මැණික් ගඟ ද්‍රෝණිය හා දකුණින් ඉන්දියන් සාගරයෙන් මායිම් වේ.




**රූපය 08:** අධ්‍යන ප්‍රදේශය

නිවර්තන කලාපීය වන අතර උෂ්ණත්වය (26$^{0}$C - 28$^{0}$C) පමණ වේ. අධ්‍යයන ප්‍රදේශය පහතරට වියළි කලාපයට සහ පහතරට අතරමැදි කලාපයට අයත් වේ. වාෂ්පීකරණය වසර පුරා ඒකාකාර වන අතර, වාර්ෂික වර්ෂාපතනය ආසන්න වශයෙන් 2,000 mm වේ.




**රූපය 09:** වාර්ෂික වර්ෂාපතන රටාව

2023 වර්ෂයේදී ජල සාම්පල 25ක් කාර්තු 2ක් තුලදී එක්රැස් කරන ලදී.

### විද්‍යුත් සන්නායකතාවය

ජල සාම්පල වල විශ්ලේෂිත දත්ත කට්ටලයට අනුව, 2022 සහ 2023 වසර වලදී විද්‍යුත් සන්නායකතා අගයන් සැලකිය යුතු ලෙස වෙනස් වේ. 2022 වර්ෂයේ පළමු කාර්තුවේ EC අගයන් 2023 වර්ෂයේ පළමු කාර්තුවේ EC අගයන්ට වඩා වැඩිය. තණමල්විල සහ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළ EC අගයන් පෙන්වයි. නමුත් සියලුම අගයන් අවසර ලත් මට්ටම් තුළ ඇත.




**රූපය 10:** 2022 වර්ෂයේ පළමු කාර්තුවේ EC පැතිරීම




**රූපය 11:** 2023 වර්ෂයේ පළමු කාර්තුවේ EC පැතිරීම




**රූපය 12:** 2022 හා 2023 වර්ෂ වල EC වෙනස්වීම

## කඨිනත්වය




**රූපය 13:** 2022 වර්ෂයේ පළමු කාර්තුවේ කඨිනත්වයේ පැතිරීම




**රූපය 14:** 2022 වර්ෂයේ පළමු කාර්තුවේ කඨිනත්වයේ පැතිරීම

තණමල්විල සහ ලුණුගම්වෙහෙර ප්‍රදේශ වල කඨිනත්වය ඉහල අගයන් පෙන්වයි




**රූපය 15:** 2022 වර්ෂයේ පළමු කාර්තුවේ කඨිනත්වයේ පැතිරීම

**වගුව 08 :** 2023 වර්ෂයේ ප්‍රගතිය

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| ජල සාම්පල එක් රැස් කිරීම සහ ජල මට්ටම් නිරීක්ෂණය | 50 |
| ජලයේ රසායනික පරීක්ෂාව | 25 |
| බැර ලෝහ විශ්ලේෂණය | - |

මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල සහ ලුණුගම්වෙහෙර ප්‍රදේශවල භූගත ජලයේ ගුණාත්මක භාවය EC සහ TDS අගයන් සම්බන්ධයෙන් දුර්වල මට්ටමක පවතින බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය වේ. එබැවින් මෙම ප්‍රදේශවල භූගත ජලය පානීය අවශ්‍යතා සඳහා සෑහීමකට පත් නොවන අතර මෙම ප්‍රදේශවල ග්‍රාමීය ප්‍රජාවට පානීය ජලය සැපයීම සඳහා නිසි පෙරහන පද්ධතියක් භාවිතා කිරීම බෙහෙවින් නිර්දේශ කෙරේ.

යාපනය අර්ධද්වීපයේ භූ විද්‍යාව සැලකිය යුතු ලෙස කැපී පෙනෙන ලක්ෂණ වර්ග පහකින් සමන්විත වේ. මයෝසීන් හුණුගල් සහ Red beds අර්ධද්වීපයේ ඉහළ, මැද ආවරණය වන අතර, වෙරළබඩ වැලි සහිත ජල ධරය නැගෙනහිර වෙරළබඩ කලාපයට සහ කරෙයිනගර් පැත්තෙන් පේදුරුතුඩුව දක්වා උතුරු වෙරළ තීරයේ තුනී ස්ථරයකට සීමා වේ. අර්ධද්වීපයේ සෙසු ප්‍රදේශය ඒකාබද්ධ නොවූ දුඹුරු අළු වෙරළබඩ වැලි වලින් වැසී ඇති අතර ආන්තික ප්‍රදේශ කලපු / මෝය නිධි වලින් වැසී ඇත. භූගත ජලයේ ගුණාත්මක භාවය වෙනස් වන අතර කලාපයේ මෙම භූ විද්‍යාත්මක සැකසුම් සමඟ අන්තර් සම්බන්ධිත වේ.

විවිධ ගුණාංග සහිත නොගැඹුරු සහ ගැඹුරු ජලධර දිස්ත්‍රික්කයේ හමු වන අතර, මෙම අධ්‍යයනය මුළු අර්ධද්වීපයම ආවරණය කර කාලයත් සමඟ ජල ගුණාත්මක භාවයේ තාවකාලික හා අවකාශීය ව්‍යාප්තිය නිරීක්ෂණය කරන ලදී. මෙම විස්තීරණ ඇගයීම් අධ්‍යයනය මගින් මානව ක්‍රියාකාරකම් සහ දේශගුණික විපර්යාස හේතුවෙන් මුහුදු ජලය ගොඩබිම දෙසට ගලා ඒම වැනි ස්වභාවික සංසිද්ධි හේතුවෙන් ගුණාත්මක හා ප්‍රමාණයේ වර්තමාන තත්ත්වය සහ බලපෑම් පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීමට අවකාශ සලසා දී ඇත.

දිස්ත්‍රික්කයේ නොගැඹුරු හා ගැඹුරු ජලධර නියෝජනය කරන තෝරාගත් ළිං 121 ක් සඳහා ජල මට්ටම මැනීම සහ ජල තත්ත්ව විශ්ලේෂණය සිදු කරන ලදී. ජල සාම්පල රසායනාගාරයේ රසායනික විශ්ලේෂණය සිදු කරන ලදී. ගුණාත්මක පිරිහීම සහ මිරිදිය කාච හඳුනා ගැනීම සඳහා භෞතික හා රසායනික විශ්ලේෂණයන සිදු කරන ලදී.

**වගුව 9:** 2023 වර්ෂයේ ප්‍රගතිය

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 1 | ජල සාම්පල එක රැස් කිරීම සහ ජල මට්ටම් නිරීක්ෂණය | 224 |
| 2 | ක්ෂේත්‍රය තුලදී ජලයේ රසායනික විශ්ලේෂණය | 224 |
| 3 | ජලයේ රසායනික විශ්ලේෂණය | |
| | රසායනික | 224 |
| | බැර ලෝහ | 76 |

### 1.1.9 පොළොන්නරුව දිස්ත්‍රික්කය

2014 වසරේ භාණ්ඩාගාර ප්‍රදානයක් යටතේ ආරම්භ කරන ලද මෙම අධ්‍යයනය පොළොන්නරුව දිස්ත්‍රික්කය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර නිදන්ගත වකුගඩු රෝගය (CKDu) මගින් බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජල තත්ත්ව ව්‍යාප්තිය හඳුනා ගැනීමේ මූලික අරමුණ වේ. 2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශ වාර්තාව පහත දක්වා ඇත.

මෙම කාල පරිච්ඡේදය පුරාවට, පොළොන්නරුවේ CKDu බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කරමින් අධ්‍යයනය සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර විමර්ශන, ස්ථානගත දත්ත රැස් කිරීම සහ රසායනාගාර විශ්ලේෂණ ඇතුළු විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ CKDu සහ ඒ ආශ්‍රිත ජලය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා සාක්ෂි මත පදනම් වූ මැදිහත්වීම් සඳහා අඩිතාලම දැමීම, ජලයේ රසායනික තත්ත්ව පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබා දීම මෙම ප්‍රයත්නවල අරමුණ විය. භාණ්ඩාගාර ප්‍රදානය මගින් අනුග්‍රහය දක්වන මෙම අධ්‍යයනයට ඇති කැපවීම, CKDu මගින් පීඩාවට පත් වූ ප්‍රදේශවල මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකාරී පියවරවල වැදගත්කම අවධාරනය කරයි.

**වගුව 10:** 2023 වර්ෂයේ ප්‍රගතිය

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 1 | ජල සාම්පල එක රැස් කිරීම සහ ජල මට්ටම් නිරීක්ෂණය | 150 |
| 2 | ක්ෂේත්‍රය තුලදී ජලයේ රසායනික විශ්ලේෂණය | 150 |
| 3 | ජලයේ රසායනික විශ්ලේෂණය | |
| | රසායනික | 150 |
| | බැර ලෝහ | - |

### 1.1.10 මාතලේ දිස්ත්‍රික්කය

LTGM ව්‍යාපෘතිය තුළ ආවරණය වන මාතලේ දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත තුළ පිහිටා ඇති අතර එය මෙම ව්‍යාපෘතිය යටතේ ආවරණය වන අනෙකුත් ප්‍රදේශ වලට සාපේක්ෂව වෙනස් ආකාරයේ භූවිද්‍යාත්මක වපසරියක පිහිටා ඇත. මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි කැල්සියම් බහුල පාෂාණ නිසා එම ප්‍රදේශයටම ආවේණික වූ අභියෝග හා භූගත ජලය හා බැඳුනු අවස්ථාවන් පවතී. විශේෂයෙන්ම, භූවිද්‍යාත්මක පසුබිම නිසා මෙම ප්‍රදේශය තුළ භූගත ජලයෙහි සඵලතාවය පිළිබඳව ධනාත්මක තත්වයක් පවතී.

මෙම ප්‍රදේශයේ භූගත ජලයෙහි පවතින අධික දෘඪතාවය, එම ප්‍රදේශයේ කටයුතු සඳහා සැළකිය යුතු බලපෑමක් එල්ල කරනු ලබයි. භූගත ජල පරිභෝජනයේදී ඇතිවන බලපෑම් නිසා 2011 වර්ෂයේ සිට මෙම ප්‍රදේශයේ භූගත ජලය පිළිබඳව නිමාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර එය මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වෙනු ලබයි. මෙම අධ්‍යයනය තුළින් භූගත ජලයේ ගුණාත්මක භාවයේ ඇතිවන විචලනයන් අධ්‍යයනය කිරීම මූලික පරමාර්ථය වන අතර මෙහිදී භූගත ජලයේ දෘඪතාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

මාතලේ පවතින ලාක්ෂණික භූවිද්‍යාත්මක තත්වය මත භූගත ජලයේ සවුලතාවය සඳහා දායකත්වයක් සපයනු ලබන අතරම මෙහි නිමානය හා කළමණාකරණ උපායයන් පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. දැනට ක්‍රියාත්මක වන නිමාන ව්‍යාපෘතිය හරහා ප්‍රදේශයේ භූගත ජලයේ සිදුවන විචලනයන්ට අදාල තොරතුරු හා කළමණාකරණයට අදාල විස්තර සපයාගනු ලබයි.

2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරය පහත පරිදි වේ.

**වගුව 11:** 2023 වර්ෂයේදී මාතලේ දිගුකාලීන භූගත ජල නිමාන ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම් - මාතලේ

| අංකය | ක්‍රියාකාරකම / විස්තරය | ප්‍රගතිය |
|---|---|---|
| 1 | ජල සාම්පල එකතු කිරීම හා භූගත ජල මට්ටම නිමානය | 70 |
| 2 | ජල සාම්පල ස්ථානීය පරීක්ෂාව | 70 |
| 3 | ජල සාම්පල රසායණික පරීක්ෂාව | |
| | සම්පූර්ණ රසායණික පරීක්ෂාව | 70 |
| | බැර ලෝහ පරීක්ෂාව | සිදු කර නැත |

**1.1.11 ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය**

භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වකුගඩු රෝග ව්‍යාප්ති ප්‍රදේශ වල භූගත ජලයේ ගුණාත්මක භාවය නිමානය කිරීම අරමුණු කරගෙන 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය දැනට ත්‍රිකුණාමල දිස්ත්‍රිකය ආවරණය වන පරිදි ක්‍රියාත්මක වෙමින් පවතී. මෙහිදී විශේෂයෙන්ම පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ආවරණය කෙරේ. මෙහි මූලිකම අරමුණ වනුයේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගය බහුල ප්‍රදේශ වල භූගත ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය කිරීම වේ.

2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරය පහත පරිදි වේ.

මෙම කාල පරාසය තුළ ව්‍යාපෘතියේ මූලික අරමුණ වෙනුවෙන් සියළු කටයුතු සකස් කෙරිණි. එය, ක්ෂේත්‍ර පරීක්ෂාවන්ගෙන්, ස්ථානීය ජල සාම්පල පරීක්ෂාවන්ගෙන් හා රසායණික විශ්ලේෂණයන්ගෙන් සමන්විත් වූ අතර ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝග බහුළ ප්‍රදේශයන්ගේ භූගත ජලයේ ගුණාත්මකභාවයේ විචලනය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම මෙම සියළු කාර්යයන්ගේ අරමුණ විය. මේ හරහා තීරණ ගැනීම් සඳහා අවශ්‍ය වන නිවැරදි දත්ත ලබා දීම ව්‍යාපෘතිය මඟින් සිදුවන ප්‍රධාන කාර්යයක් වේ.

මෙම අධ්‍යයන දිගුව හරහා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අමතරව, වෙනත් කළාප වල ජලය මූලික රෝග පිළිබඳව සාකච්ඡා කිරීමේ හැකියාව ලැබේ. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවතින වකුගඩු රෝගය පිටුදැකීමේ කාර්යය සඳහා වැදගත් වන තොරතුරු ලබා ගැනීමේ කාර්යයේදී සිදු කරන ලද කාර්යයන් සංක්ෂිප්තව පහතින් දැක්වේ.

**වගුව 12:** 2023 වර්ෂයේදී දිගුකාලීන භූගත ජල නිමාන ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම් - ත්‍රිකුණාමල

| අංකය | ක්‍රියාකාරකම / විස්තරය | ප්‍රගතිය |
|---|---|---|
| 1 | ජල සාම්පල එකතු කිරීම හා භූගත ජල මට්ටම නිමානය | 80 |
| 2 | ජල සාම්පල ස්ථානීය පරීක්ෂාව | 80 |
| 3 | ජල සාම්පල රසායණික පරීක්ෂාව | |
| | සම්පූර්ණ රසායණික පරීක්ෂාව | 80 |
| | බැර ලෝහ පරීක්ෂාව | සිදු කර නැත |

## 1.2 කාළගුණික වෙනස්වීම් මත ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජලධරයන් වලට සෘජුව හා වක්‍රාකාරව සිදු වන බලපෑම් පිලිබඳ අධ්‍යයනය (SICC)

දේශගුණික විපර්යාස අයිස් දියවීමට හේතු වන අතර එය මුහුදු මට්ටම ඉහළ යාමට හේතු වේ. දේශගුණික විපර්යාස නිසා සාගර උණුසුම් වීම, ආම්ලික වීම, වෙරළ ඛාදනය සහ මිරිදිය මූලාශ්‍රවලට ලවණ ආක්‍රමණය සිදු වේ. ශ්‍රී ලංකාව වැනි දූපත් රටවල් මුහුදු මට්ටම ඉහළ යාමේ අහිතකර බලපෑම්වලට බෙහෙවින් ගොදුරු වේ. වර්තමාන ප්‍රක්ෂේපණයට අනුව, 2100 (IPCC) වන විට මුහුදු මට්ටම මීටර් 0.2-0.6 කින් ඉහළ යා හැකිය. මුහුදට මායිම්ව ඇති ප්‍රදේශවල ජල සම්පත සහ වෙරළබඩ ජලධරයන් මිරිදිය සඳහා වැදගත් මූලාශ්‍ර වේ. වෙරළබඩ භූගත ජලධරවල ඇති වන ප්‍රධාන ගැටලුවක් වන්නේ ලවණ ජලය ඇතුල් වීමයි. ලුණු ජලය ආක්‍රමණය කිරීම වෙරළබඩ ජලධරවල පවතින නැවුම් භූගත ජල සම්පත් අඩු කරයි. එබැවින්, වෙරළබඩ ජල සම්පත් මත දේශගුණික විපර්යාසවල දේශීය හෝ කලාපීය බලපෑම් පිළිබඳ තොරතුරු වඩාත් වැදගත් වෙමින් පවතී. කොළඹ සිට හම්බන්තොට දක්වා සහ ත්‍රිකුණාමලය වෙරළ තීරය දක්වා විහිදෙන වෙරළබඩ ජලධරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලධර පද්ධතියට දේශගුණික විපර්යාසවල සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් ජල සම්පත් මණ්ඩලය 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ දේශගුණික විපර්යාස හේතුවෙන් භූගත ජලයට, ප්‍රධාන වශයෙන් වෙරළබඩ ප්‍රදේශවලට සිදුවන බලපෑම නිරීක්ෂණය කිරීමයි. මෝසම් කාලවලදී භූගත ජල මට්ටම නිරීක්ෂණය කිරීම, ළිං කැණීම පරීක්ෂා කිරීම, අස්වැන්න පරීක්ෂා කිරීම සහ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජල සාම්පල විශ්ලේෂණය මෙම අධ්‍යයනයන්ට ඇතුළත් විය.

### ජල මට්ටම් මිනුම් කිරීම, ජල නියදි ලබා ගැනීම හා ජල සාම්පල විශ්ලේෂණය

2014 සිට 2020 දක්වා සිදු කරන ලද අධ්‍යයනයන්ගේ ප්‍රතිපල වලට අනුව, ඉදි කරන ලද නොගැඹුරු නළ ළිං හා දැනට පවතින නළ ළිං භාවිතා කරමින්, පිරිසිදු භූගත ජලධරයන් තුළට මුහුදු ජලය ඇතුල් වීම හා වෙරල තීරයට සිදුවන අනෙකුත් පාරිසරික බලපෑම් අධයයනය කිරීම සඳහා තව දුරටත් නිමාන කටයුතු සිදු කරන ලදී.




**රූපය 16:** ස්ථාපිත කරන ලද භූගත ජල නිමාන පද්ධතිය( කොළඹ සිට වැලිගම වෙරළ තීරය).




**රූපය 17:** ස්ථාපිත කරන ලද භූගත ජල නිමාන පද්ධතිය (ත්‍රිකුණාමල වෙරළ තීරය).

- කොළඹ සිට වැලිගම දක්වා වෙරළබඩ භූගත ජලධරය

මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2023 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

**වගුව 13:** 2023 වර්ෂයේ ප්‍රගතිය

| ප්‍රදේශය | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| කොළඹ සිට වැලිගම දක්වා වෙරළබඩ භූගත ජලධරය | ජල සාම්පල රසායනික විශ්ලේෂණය (50) සහ බැර ලෝහ විශ්ලේෂණය (15) | 50<br>15 | 100% |
| | ක්ෂේත්‍රය තුලදී රසායනික විශ්ලේෂණය (50), ද්විවාර්ෂික ජල සාම්පල එක් රැස් කිරීම (50) | 50<br>15 | 100% |

### ජල සාම්පල එක් රැස් කිරීම සහ සහ ළිං නිරීක්ෂණය (50)

නිසි භූගත ජල නිරීක්ෂණ ජාලයක් හරහා ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලධර පද්ධතියේ ලවණතා මට්ටමේ වෙනස්වීම් හඳුනා ගැනීමට සහ මිරිදිය- භූගත ජල අතුරු මුහුණතේ උච්චාවචනය තීරණය කිරීමට ජල මූලාශ්‍ර 50ක් තෝරා ගන්නා ලදී. කොළඹ සිට හම්බන්තොට වෙරළ තීරය දක්වා පවතින බටහිර වෙරළ කලාපයේ නොගැඹුරු ළිං වල පෙබරවාරි මාසයේ පළමු කාර්තුව සහ අගෝස්තු මාසයේ 3 වැනි කාර්තුව සඳහා ජල මට්ටම් සහ ජල සාම්පල එකතු කරන ලදී. සෑම කාර්තුවකදීම ජල සාම්පල 50 ක් සම්පූර්ණ රසායනික විශ්ලේෂණය සඳහා එකතු කරන ලද අතර සාම්පල 15. බැර ලෝහ විශ්ලේෂණය සඳහා එකතු කරන ලදී. ඒවා භෞතික හා රසායනික පරාමිතීන් 17 ක් සඳහා විශ්ලේෂණය කරන ලදී.



**රූපය 18:** ජල සාම්පල එක් රැස් කිරීම සහ ජල මට්ටම් නිරීක්ෂණය

### විද්‍යුත් සන්නායකතාව විචලනය

අධ්‍යයන ප්‍රදේශයෙන් 75% කට වඩා වැඩි ප්‍රමාණයක් 750 µs/cm ට අඩු EC මට්ටමක පවතී. කෙසේ වෙතත්, ප්‍රදේශ කිහිපයක, (කොග්ගල වැව ආශ්‍රිත ප්‍රදේශ, මිදිගම සහ නෙටොල්පිටිය) ඉහළ EC අගයන් දැකිය හැකිය. (1000 µs/cm ට වැඩි)




**රූපය 19:** ප්‍රදේශයේ EC ව්‍යාප්තිය




**රූපය 20:** වර්ෂාපතනය සහ EC විචලනය




**රූපය 21:** ප්‍රදේශයේ EC පැතිරීම




**රූපය 23:** වර්ෂාපතනය සමග ජල මට්ටම් විචලනය

ජල මට්ටමේ විචලනය වර්ෂාපතන රටාව සමඟ මනාව එකඟ වන බව අපට නිරීක්ෂණය කළ හැකි අතර අනෙකුත් ප්‍රදේශවලට වඩා බෙන්තොට ප්‍රදේශය අවට සාපේක්ෂ ගැඹුරු භූගත ජල මට්ටමක් ද නිරීක්ෂණය කළ හැකිය.

**නිර්දේශ**

- මෙතෙක් (2015-2023) සිදු කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵල මත පදනම්ව, ගංගා ආශ්‍රිත ළිං, විල් පිටකිරීම් සහ මුහුදට ආසන්නයේ හැර බොහෝ නිරීක්ෂණ ස්ථානවල ජල තත්ත්වය සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව පෙනී යයි.
- මිරිදිය ජලධරයට ලවණ මිශ්‍ර වීම හඳුනා ගැනීමට සහ වෙරළබඩ ජලධරයට ඇති අනෙකුත් පාරිසරික බලපෑම් හඳුනා ගැනීමට අධ්‍යයන ප්‍රදේශය ඔස්සේ තෝරාගත් ළිං භාවිතයෙන් තවදුරටත් නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.

### 1.3 මා ඔය ගංගා ද්‍රෝණිය තුළ භූජල විද්‍යාත්මක තක්සේරුව හා භූගත ජල ආරෝපණය සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම (Ma-Oya )

මා ඔය ද්‍රෝණියේ මධ්‍ය ප්‍රදේශය වියළි කාලවලදී භූගත ජල හිඟයට මුහුණ දෙයි. ද්‍රෝණියේ ඉහළ කොටසට වසර පුරා ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබෙන බැවින් ද්‍රෝණියේ මැද කොටස සඳහා කෘත්‍රිම නැවත ආරෝපණය කිරීමේ ක්‍රමයක් සැලසුම් කිරීම වඩා සුදුසු වේ. මේ සඳහා සවිස්තරාත්මක ජල භූ විද්‍යාත්මක තක්සේරුවක් වැදගත් වේ.

**විශේෂිත අරමුණු**

- මා ඔය ජල ද්‍රෝණිය තුළ භූගත ජලය අධිකව උකහා ගන්නා ස්ථාන හඳුනා ගැනීම
- ප්‍රදේශයේ පවතින භූගත ජලධරයන් හඳුනා ගනිමින් භූජල විද්‍යාත්මක සිතියම් සකස් කිරීම හා ජල සම්පත් මණ්ඩලය සතුව පවතින ජල ධාරිතා පරීක්ෂන දත්ත භාවිතයෙන් ප්‍රදේශයේ පවතින එක් එක් ජලධරයන්ගෙන් උකහා ගත හැකි ජල ප්‍රමාණය තක්සේරු කිරීම.
- එක රැස් කරන ලද තොරතුරු මගින් භූගත ජලය භාවිතා කරන ප්‍රජාව සඳහා භූගත ජලය තිරසාර ලෙස කළමනාකරණය සිදු කරමින් භාවිතා කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- එම සැලසුම් සහ නිර්දේශ ක්‍රියාත්මක වීම පිළිබඳව පසු විපරම් කිරීම

**2023 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්**

- පරීක්ෂණ ළිං සඳහා සුදුසු ස්ථාන තෝරා ගැනීම සඳහා භූගත ජල පරීක්ෂණ සිදු කරන ලදී.
- පරීක්ෂණ ළිං කැණීම (03)
- ඉහළ භූගත ජලය උකහා ගන්නා කර්මාන්තශාලා පිළිබඳ තොරතුරු මධ්‍යම පරිසර අධිකාරියෙන් රැස් කරන ලදී.
- ඉහළ භූගත ජලය උකහා ගැනීම් ඇති කර්මාන්තශාලා වෙත ගොස් එම පරිශ්‍රයේ භූගත ජලය නැවත ආරෝපණය කිරීමේ ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා තොරතුරු රැස් කරන ලදී.




**රූපය 24:** මා ඔය ද්‍රෝණියේ ඉහළ භූගත ජල විභව කලාප සොයා ගැනීම සඳහා භූගත ජල පරීක්ෂණ සිදුකිරීම

**වගුව 14:** මාඔය ව්‍යාපෘතියේ ප්‍රගති සාරාංශය

| ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මා ඔය ගංගා ද්‍රෝණිය තුළ භූගත ජලය අධික ලෙස උකහා ගැනීමේ කලාප හඳුනා ගැනීම සහ එමගින් ජලධරයට සිදුවන බලපෑම් විශ්ලේෂණය | 100% | 100% |
| භූගත ජලය ප්‍රති ආරෝපණය කිරීමේ හැකියාව (ඵලදායිතාව සහ තත්ත්වය) සහ කෘතිම ප්‍රතිආරෝපණය කරන ලද ජලය ගබඩාකිරීම සඳහා විකල්ප හඳුනා ගැනීම | 100% | 100% |
| තිරසාර කළමනාකරණය සහ භූගත ජලය ගබඩා කිරීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම සඳහා පරිශීලකයන් අනුවර්තනය කිරීම සදහා අවශ්‍ය සොයාගැනීම් සහ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන් සලකා බැලීම. | 100% | 90% |

## 1.4 භූ ගත ජලය සම්බන්ධ ගැටළු පිළිබඳ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ

ඉහත සඳහන් ප්‍රධාන භූ ගත ජලය සම්බන්ධ අධ්‍යයනයන්ට අමතරව, විවිධ පාර්ශවයන්ට අයත් ආයතන සම්බන්ධීකරනය කරමින් භූ ගත ජල සම්පත් සම්බන්ධ ගැටළු පිළිබඳ පරීක්ෂණ සිදුකරන ලදි. භූ ගත ජලය සම්බන්ධයෙන් දක්නට ලැබෙන ප්‍රමුඛ ගැටළු සමහරක් වනුයේ කළු ගල්, පස් ආදී කැණීම් කටයුතු ආශ්‍රිතව භූ ගත ජලයට සිදුවිය හැකි බලපෑම්, නීති විරෝධී නළ ළිං ඉදිකිරීම සහ නිසි නිර්දේශ ලබා ගැනීමකින් තොරව වාණිජමය වශයෙන් භූගත ජලය අවභාවිතා කිරීම, ජල අයිතිය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලය මගින් නිකුත් ලබාදනු ලබන මාර්ගෝපදේශයන්ට අනුව ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් ඇතිවන මහජන ගැටළු ආදියයි.

2023 වසරේ කොළඹ, ගම්පහ, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, මොණරාගල, කෑගල්ල සහ කළුතර දිස්ත්‍රික්කවල මධ්‍යම පරිසර අධිකාරිය, GSMB, NBRO සහ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන ඒකාබද්ධ පාරිසරික අධ්‍යයනයන් 129 ක් සඳහා ජල සම්පත් මණ්ඩලයේ තාක්ෂණික උපදේශන දායකත්වය ලබා දී ඇත.





**රූපය 25:** නුවරඑළිය ප්‍රදේශයේ පවත්වනු ලැබූ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක්.



**රූපය 26:** පස් කැණීම් කටයුතු හේතුවෙන් ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම



**රූපය 27:** කළු ගල් කැණීම් කටයුතු සඳහා ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

**වගුව 15:** INSP ව්‍යාපෘතියේ ප්‍රගති සාරාංශය

| ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| භූගත ජල සම්පත් සම්බන්ධ රැස්වීම් සහ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාව | 100% | 149% |
| භූ ගත ජල නියාමන කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් (25) | 100% | 56% |

### 1.5 ශ්‍රී ලංකාව සඳහා භූගත ජල සිතියම් සකස් කිරීම.

මෑත දශක කිහිපය තුළ භූගත ජල සම්පත ආර්ථික හා සමාජීය වශයෙන් වැදගත් ජාතික සම්පතක් බවට පත්ව ඇත. එසේ වුවද, විවිධ අවස්ථා වල උත්සාහයන් කිහිපයක් ගන්නා ලද නමුත්, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල සම්පත් පිළිබඳ ක්‍රමානුකූල හා සම්පූර්ණ සිතියමක් තවමත් සකස් කර නොමැත. දැනට ජල සම්පත් මණ්ඩලය විසින් ජල සම්පත් මණ්ඩලය සතු දත්ත සහ තොරතුරු භාවිතා කරමින් ශ්‍රී ලංකාව සඳහා භූ ගත ජල සිතියම් සකස් කරමින් පවතී. මෙම සිතියම් විවිධ කටයුතු වලදී සහ, දීර්ඝ කාලින භූගත ජල සම්පත් කළමනාකරණ කටයුතු වලදී බොහෝ උපකාරී වනු ඇත. මෙම ව්‍යාපෘතිය ජල සම්පාදන අමාත්‍යංශයේ භූගත ජල සම්පත් අධ්‍යයනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් 2022 වර්ෂයේදී ආරම්භ කරන ලදී. භූගත ජලය සබන්ධව තීන්දු තීරණ ගැනීමේදී ඒ සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදකයින්,

ජල කළමනාකරුවන් සහ අදාළ තාක්ෂණික නිළධාරීන් හට මෙම සිතියම් ඉතා වැදගත් වන අතර සාමාන්‍ය ජනතාවටද භූගත ජලය සම්බන්ධව තොරතුරු ලබා ගැනීමට වැදගත් වනු ඇත.

මෙම සිතියම් භූගත ජලය සමන්ධ විශේෂ දැනුමක් නොපවතින පුද්ගලයින් හටද අවබෝධ වන පරිදි ප්‍රකාශයට පත් කිරීමට නියමිත වේ. තාක්ෂණික තොරතුරු විස්තර කිරීම සඳහා සරල භාෂාවක් යොදා ගනු ලැබේ. එමෙන්ම විවිධ දේශගුණික සහ භූගෝලීය පරිසරයන්හි භූගත ජලය පැවතීම, ගලායාම සහ ගුණාත්මකභාවය පාලනය කරන මූලධර්ම විස්තරාත්මකව නිරූපණය කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාසල් මට්ටමින් භූ ජල විද්‍යාව පිළිබඳ පාඨමාලා සඳහා ඉගැන්වීමේ මෙවලමක් ලෙසත්, විශේෂිත ජලධර/ප්‍රදේශයක් පිළිබඳ තොරතුරු සොයන පුද්ගලයින් සඳහා භූගත ජල තත්ත්වයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් ලෙසත් මෙම සිතියම් වටිනා මූලාශ්‍රයක් වනු ඇත. එමෙන්ම එය නීති සම්පාදකයින්, විවධ ආයතනවල පුද්ගලයින් සහ භූගත ජලය ඇතිවීම, චලනය සහ ගුණාත්මකභාවය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම කෙනෙකුට ප්‍රාදේශීය සහ ජාතික භූගත ජල සම්පත් පිළිබඳ හැඳින්වීමක් ද සපයයි.

විශ්වාසදායක භූගත ජල දත්ත සහ තොරතුරු නොමැතිකම ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් සංවර්ධනයට බරපතල බාධාවක් මෙන්ම ඒ පිළිබඳව පර්යේෂණ කිරීමට අමතර බාධාවකි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වූයේ ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් පිළිබඳ සවිස්තරාත්මක සහ නිවැරදි තොරතුරු විවිධ පාර්ශ්වකරුවන් වෙත ලබා දීමයි. මේ සඳහා හඳුනා ගන්න ලද පාර්ශව කරුවන් පහත පරිදි වේ.

- විවධ ප්‍රදේශවල හෝ රටෙහි භූගත ජල තත්ත්වයන් පිළිබඳ දැනුම සහ දත්ත සොයන භූ ජල විද්‍යාඥයින් සහ අනෙකුත් වෘත්තිකයන්.
- භූගත ජල තත්ත්වයන් සහ විශ්ලේෂණයන් සඳහා උත්සුක වන ප්‍රතිපත්ති සම්පාදකයින් සහ තීරණ ගන්නන්.

**ක්‍රමවේදය**

ජල සම්පත් මණ්ඩලය විසින් වසර ගණනාවක් පුරා එක්රැස් කරන ලද වැදගත්ම භූගත ජල දත්ත වලින් සමන්විත වන ශ්‍රී ලංකාවේ භූගත ජල සිතියම ස්ථාවර ආකාරයකින් තනි ප්‍රකාශනයකින් සම්පාදනය කිරීමට අපේක්ෂා කරයි. භූගත ජල සම්පත් පිළිබඳ පවතින සියලු තොරතුරු රැස් කිරීම, නිසි පරිදි සකස් කිරීම, පවතින තොරතුරු පිරික්සීම, දත්ත විශ්ලේෂණය සහ සිතියම් සකස් කිරීම, භූගත ජල සම්පත සඳහා ඇති අවදානම පිළිබඳ සිතියම් සකස් කිරීම සහ සැකසූ සිතියම් ක්ෂේත්‍ර සත්‍යාපනය කිරීම යන ක්‍රියාකාරකම් සමඟ අධ්‍යයනය පියවරෙන් පියවර ඉදිරියට යමින් පවතී. දැනට රටේ පවතින මූල්‍යමය තත්වය හේතුවෙන් වියදම් කපා හැරීම නිසා එක් රැස් කරන ලද සහ විශ්ලේෂණය කරන ලද දත්ත ක්ෂේත්‍රය තුළදී සත්‍යාපනය කිරීම සිදු නොකරන ලදී.

මෙම ග්‍රන්ථය පරිච්ඡේද 09 ක් යටතේ සංවර්ධනය කර ඇති අතර, ලංකාව තුල හමුවන ප්‍රකට ජලධර වර්ග සම්බන්ධයෙන් විවිධ පරිච්ඡේද 06කේ ඔස්සේ ගැඹුරු ලෙස සාකච්ඡා කරන ලදී.

**ප්‍රතිපලය**

භූ ගත ජලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක බව ප්‍රදේශය තුල පැතිරී පවතින ආකාරය දක්වන සිතියම් සකස් කිරීම සඳහා විවිධ නියැදි ලබාගන්නා ලද ස්ථාන 7746ක් සලකා බලන ලදී. යාපනය අර්ධද්වීපය, දිවයිනේ නැගෙනහිර සහ බටහිර වෙරළ තීරයන්, වියළි කලාපය වැනි සංවේදී ප්‍රදේශ සඳහා වසර කිහිපයක් ඇතුළත රට පුරා මෙන්ම පූර්ව සහ පසු මෝසම් කාලසීමාවන් සැලකිල්ලට ගනිමින් භූ ගත ජලයේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බවෙහි පැතිරීම පිළිබඳ සිතියම් සකස් කරන ලදී. ඉන් අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**භූගත ජල මට්ටමේ ව්‍යාප්තිය**

- රටේ සාමාන්‍ය භූගත ජල මට්ටමේ ව්‍යාප්තිය දැනට පවතින බිම් මට්ටමේ සිට මීටර් 10 ට අඩු ව්‍යාප්තියක් පෙන්වන අතර  බදුල්ල දිස්ත්‍රික්කය වැනි උස්බිම් ප්‍රදේශ මීටර් 30 - 60 සහ වයඹ දිග වෙරළ තීරය මීටර් 10 - 30 ක ව්‍යාප්තියක් පෙන්නුම් කරයි.
- රටේ සාමාන්‍ය භූගත ජල මට්ටමේ ව්‍යාප්තිය මුහුදු මට්ටමට සාපේක්ෂව භූමියේ පවතින සාමාන්‍ය උන්නතාංශයට අනුගාමීව ව්‍යාප්තව ඇති අතර බොහෝ ප්‍රදේශ සාමාන්‍යයෙන් මුහුදු මට්ටමට ඉහලින් භූ ගත ජල මට්ටම පෙන්නුම් කරයි.

- පහත් බිම් සහ වෙරළබඩ ප්‍රදේශයේ පවතින භූ විද්‍යාත්මක පසුබිම හේතුවෙන් එම ප්‍රදේශ වල භූගත ජල මට්ටම සාමාන්‍යයෙන් මුහුදු මට්ටමට ඉහළින්, පහළින් (උදා- විශේෂයෙන්ම, හම්බන්තොට සහ පුත්තලම) සහ සමාන ව්‍යාප්තියකින් යුක්ත වේ.
- රට තුළ සාමාන්‍ය භූගත ජල මට්ටමේ ව්‍යාප්තිය පරීක්ෂණ ළිං 840 ක් භාවිතා කර විශ්ලේෂණය කර ඇති අතර 1974 සිට ජ.ස.ම විසින් වරින් වර ඉදිකරන ලද ළිං ද අධීක්ෂණ කටයුතු සඳහා භාවිතා කරන ලදී.
- යාපනය අර්ධද්වීපය සහ බටහිර වෙරළබඩ වැලි සහිත ජලධරය වැනි සංවේදී ප්‍රදේශ වල අඛණ්ඩ අධීක්ෂණය මගින් රැස් කරගත් දත්ත භාවිතයෙන් භූගත ජල මට්ටමේ ව්‍යාප්තිය සහ භූ ගත ජලයේ ගැලීම් දිශානතීන්ගේ කාලීන විචලනයන් සිතියම් ගත කරන ලදී.




**රූපය 28:** ශ්‍රී ලංකාවේ සාමාන්‍ය භූගත ජල මට්ටම



**රූපය 29:** භූගත ජලය ගලා යන දිශා දැක්වෙන සිතියම්

**භූගත ජලයේ ගුණාත්මකභාවයේ ව්‍යාප්තිය**

පරාමිති 9 ට අදාළව භූගත ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පොදු ව්‍යාප්තිය සකස් කර ඇත. මේ සඳහා අධීක්ෂණ ළිං සහ ඉදිකරන ලද නල ළිං යන දෙකම භාවිතා කරන ලද අතර විද්‍යුත් සන්නායකතාව, නයිට්‍රේට්, සම්පූර්ණ යකඩ සහ ෆ්ලෝරයිඩ් ව්‍යාප්තීන් පහත පරිදි වේ.




**රූපය 30:** ශ්‍රී ලංකාවේ භූ ගත ජලයේ EC විචලනය

- යාපනය අර්ධද්වීපය - අඩු උන්නතාංශය සහ වර්ෂාපතන රටා වල සෘතුමය උච්චාවචනය වීම සහ අධික ලෙස භූ ගත ජලය උකහා ගැනීම හේතුවෙන් මුහුදු ජලය ගොඩබිම දෙසට ඇතුළු වීම හේතුවෙන් භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාව 750 සිට 5,000 (µS/cm) පරාසයක පවතී.

- අනුරාධපුර දිස්ත්‍රික්කය - පාෂාණ ජීර්ණ ක්‍රියාවලිය මගින් ජලයේ දියවූ අයන වැඩිවීම හේතුවෙන් භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාව 750 සිට 3,500 µS/cm දක්වා පරාසයක පවතී.

- පුත්තලම දිස්ත්‍රික්කය - ලවණ සහිත ජලධරයේ පැවතීම හේතුවෙන් මෙම ප්‍රදේශයේ බොහෝ ස්ථානයන්හි භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාව 1,500 සිට 10,000 µS/cm දක්වා පරාසයක පවතී.

- වෙරළබඩ ප්‍රදේශවල මුහුදු ජලය ගොඩබිම දෙසට ආක්‍රමණය වීම තුලින් භූගත ජලයේ ඉහළ විද්‍යුත් සන්නායකතාවයක් පවතී.

- සාමාන්‍යයෙන්, කඳුකර ප්‍රදේශවලදී ජලයේ දිය වූ අයන පහසුවෙන් ගංගා ජාල ප්‍රවාහ ජාලය හරහා සෝදා හරිනු ලබන බැවින් අඩු විද්‍යුත් සන්නායකතා මට්ටමක් පෙන්නුම් කරයි.




**රූපය 31:** ශ්‍රී ලංකාවේ භූ ගත ජලයේ Fe විචලනය

- ශ්‍රී ලංකාවේ සම්පූර්ණ යකඩ ව්‍යාප්තිය ලංකාවේ විවිධ කලාප වල පවතින භූ විද්‍යාත්මක සැකැස්මට අනුකූලව පැහැදිලි ව්‍යාප්තියක් පෙන්නුම් කරයි.

- භූගත ජලයේ යකඩ පැවැත්ම සහ ඒ හා සම්බන්ධ විශේෂිත සාන්ද්‍රණ මට්ටම් විවිධ ප්‍රදේශයන්හි පවතින ඇතැම් සාධක බලපානු ලබයි.

    ✧ අනුරාධපුරයේ පවතින යකඩ තැන්පතු; එප්පාවල
    ✧ නැගෙනහිර පළාත; සේරුවිල යකඩ නිධිය
    ✧ කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රික්කවල පවතින යපස් නිධි සාමාන්‍යයෙන් විපරීත පාෂාණ සමඟ සම්බන්ධ වී ඇති අතර ඒවා රටේ යකඩ සහිත භූ විද්‍යාත්මක සැකැස්මේ කොටසකි.
    ✧ සාමාන්‍යයෙන් කබොක් සංයුතිවල යකඩ බහුල ඛනිජ වලින් සමන්විත, රටේ බටහිර සහ දකුණු ප්‍රදේශ වල කබොක් ජලධර පැවතීම හේතුවෙන් භූගත ජලයෙහි යකඩ පවතී.




**රූපය 32:** ශ්‍රී ලංකාවේ භූ ගත ජලයේ ෆ්ලෝරයිඩ් විචලනය

වියළි කලාපයේ පවතින අධික උෂ්ණත්වය සහ ඉහල වාෂ්පීකරණය හේතුවෙන් භූගත ජලයේ ෆ්ලෝරයිඩ් සහිත ඛනිජ සාන්ද්‍රණය වැඩි වීමෙන් ෆ්ලෝරයිඩ් මට්ටම ඉහළ මට්ටමක පවතී




**රූපය 33:** ශ්‍රී ලංකාවේ භූ ගත ජලයේ නයිට්‍රේට විචලනය

සාමාන්‍යයෙන් භූගත ජලයේ නයිට්‍රේට් ව්‍යාප්තිය ඇතැම් කෘෂිකාර්මික ප්‍රදේශයන්ගේ හැර සමස්තයක් ලෙස කැපී පෙනෙන අයුරින් එහි අවසර ලත් මට්ටම 50 mg/l ට වඩා අඩුය




**රූපය 34:** භූගත ජලධරයේ අවදානම් සිතියම - යාපනය

පවතින මිහි විදුම් තොරතුරු භාවිතා කරමින්, භූගත ජලධරය අපවිත්‍ර වීම සඳහා මූලික වශයෙන් බලපාන භූජල විද්‍යාත්මක සාධක හඳුනා ගැනීම සඳහා සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් යාපනය අර්ධද්වීපය සඳහා සිදුකරන ලදී. භූගත ජල සම්පත  තවදුරටත් සංවර්ධනය කිරීමේ අරමුණින් මුළු රටෙහිම අවදානම් තක්සේරු කිරීම සිදුකිරීම සඳහා අවදානම් තක්සේරුවක් සිදුකෙරෙමින් පවතී.







**රූපය 35:** A-B හරස්කඩ




**රූපය 36:** X-Y හරස්කඩ

ජල භූ විද්‍යාත්මකව සංවේදී ප්‍රදේශ සඳහා එම ප්‍රදේශ වල පවතින ජලධරයන් සහ භූ ජල විද්‍යාත්මක ඒකකයන් හදුනා ගැනීම සදහා හරස්කඩ සකස් කරන ලදී.

**වැඩිදුර සංවර්ධනය**

අනාගත තිරසාර ජල සැපයුම සහ ආර්ථික සංවර්ධනය සඳහා භූගත ජල සම්පත් සාර්ථකව සහ තිරසාර ලෙස සංවර්ධනය කළ යුතුය. මේ සඳහා භූ ජල විද්‍යාව සහ භූගත ජලය පිළිබඳ දැඩි අවබෝධයක් අවශ්‍ය වේ. එසේ වුවද, ශ්‍රී ලංකාව තුල භූගත ජලය බහුල ලෙස පවතින විට පවා ඒ පිළිබඳ යාවත්කාලීන, නිවැරදි තොරතුරු සොයා ගැනීම සහ ලබා ගැනීම ඉතා අභියෝගාත්මක ය. එම නිසා ශ්‍රී ලංකා භූගත ජල සිතියම රටේ භූගත ජලය පිළිබඳ තොරතුරු වඩාත් තේරුම් ගත හැකි සහ පහසුවෙන් පරිශීලනය කළ හැකි වන පරිදි සකස් කිරීමෙන්, මෙම ගැටලුව විසඳීමට දායක වේ.

දැනට ජල සම්පත් මණ්ඩලය සතු දත්ත හා තොරතුරු භාවිතා කර සකස් කරන මෙම සිතියම් තව දුරටත් නිවැරදි හා විශ්වාසනීය ලෙස සකස් කිරීම සඳහා, පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔස්සේ තවදුරටත් පුළුල් කිරීම සිදු කල යුතුය.

- මෙම වාර්තාව අවසන් කිරීමට පෙර, භූගත ජල විශේෂඥයින්ගෙන් සමන්විත ශාස්ත්‍රීය වෘත්තිකයන් ගෙන් සැදුම් ලත් කර්තෘ මණ්ඩලයකින් අත්‍යවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.
- භූ ගත ජල සිතියම් වලට සමගාමීව ඒ පිළිබඳව විස්තර අඩංගු අත් පොතක් ප්‍රකාශනය කිරීම.

## 1.6 යටිතල පහසුකම් සංවර්ධනය, විද්‍යාත්මක උපකරණ වල ක්ෂමතාවය වර්ධනය කිරීම සහ ආයතනය තුල නිපුණතා සංවර්ධනය කිරීම (REIMP)

අනුරාධපුරයේ පිහිටි පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම අවසන් වූ අතර අ'පුර නිලධාරි නිවාස පුළුල් කිරීම ආරම්භ කළ නමුත් රටේ ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස මුල්‍ය ප්‍රතිපාදන අවහිරතා නිසා මේ වන විට ඉදිකිරීම් කටයුතු නතර වී ඇත.

ජලධර පරීක්ෂාව සඳහා ගිල්විය හැකි පොම්ප, වර්ෂයේ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය වූ ජල මට්ටම් මාවක වැනි විද්‍යාත්මක උපකරණ කිහිපයක් ප්‍රසම්පාදනය සඳහා ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, ආර්ථික අර්බුදය හේතුවෙන් අරමුදල් නොමැතිකම හේතුවෙන් උපකරණ මිලදී ගෙන නොමැත. pH මීටර දෙකක් පමණක් වසර තුළ මිළදී ගැනීමට සමත් විය.

**වගුව 16:** REIMP හි ප්‍රගතිය

| අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | යන්ත්‍රෝපකරණ සහ වාහන වැඩිදියුණු කිරීම | 100% | 100% |
| 2 | අ'පුර පර්යේෂණ මධ්‍යස්ථානය නැවත ගොඩ නැගීම | 100% | 50% |
| 3 | මොනරාගල සහ පුත්තලම ප්‍රාදේශීය කාර්යාල වල වැටවල් ව්‍යුහය වැඩිදියුණු කිරීම | 100% | 100% |
| 4 | රසායනාගාර සහ භූ භෞතික උපකරණ නඩත්තු කිරීම | 90% | 95% |

## 1.7 ජල අංශයට අදාල හදිසි ආපදා තත්ත්ව සඳහා ක්‍රියාත්මක වීම (නියඟ, ගංවතුර, භූ ගත ජලය දූෂණය වීම ආදී,) (E-USE)

2023 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් විපතට පත් ප්‍රදේශවල ප්‍රජාවගේ අවශ්‍යතා අනුව භූගත ජල ගවේෂණය, නළ ළිං ඉදිකිරීම සහ ජල ධාරිතා පරීක්ෂණ පැවැත්වීම සිදු කරන ලදී.මෙහිදී අවශ්‍යතාවය අනුව ප්‍රදේශ කිහිපයක නළ ළිං ඉදි කරන ලද අතර එම ළිං පිලිබඳ විස්තර පහත පරිදි වේ.

**වගුව 17:** ඉදිකරන ලද නළ ළිං පිළිබඳ විස්තර

| අංක | ලිපිගොණු අංකය | ස්ථානය |
|---|---|---|
| 1 | EMUSE/2023/01 | අඟුරුමලේ, උනගොල්ල, හාලි ඇල |
| 2 | EMUSE/2023/02 | කිවුල්ආර ප්‍රාථමික විද්‍යාලය, තණමල්විල |
| 3 | EMUSE/2023/03 | ශාන්ත අන්තෝනි විද්‍යාලය, තෝඩුවාව |
| 4 | EMUSE/2023/04 | ගමේවෙල, මොණරාගල |
| 5 | EMUSE/2023/05 | ඇරමිනඅත්තමඩ, ඇල්ලකොන, මොණරාගල |
| 6 | EMUSE/2023/06 | සාලියපුර ශාන්ති සෙවන රජයේ වැඩිහිටි නිවාසය, අනුරාධපුර |



**රූපය 37:** නළ ළිං ඉදි කිරීම

**වගුව 18:** EM USE ව්‍යාපෘතියේ ප්‍රගති සාරාංශය

| අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | අවශ්‍යතාවය අනුව මූලික පරීක්ෂණ සහ භූගත ජල ගවේෂණ කටයුතු සිදු කිරීම | 100% | 100% |
| 2 | හඳුනාගත් විපතට පත් ප්‍රදේශවල ප්‍රජාවගේ පානීය අවශ්‍යතා සඳහා විකල්ප ප්‍රභවයක් ලෙස සැපයීම සඳහා නළ ළිං ඉදිකිරීම | 100% | 100% |

### 1.8 භූ ගත ජලයෙන් පෝෂණය වන ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා භූ ගත ජලය කළමනාකරණය සහ සංවර්ධනය කිරීමේ ක්‍රමෝපායන් හඳුන්වාදීම (DMWSS)

දිනෙන් දින ඉහළ යන ජල ඉල්ලුම, දේශගුණික විපර්යාසයන් හා නිසි කළමනාකාරයකින් තොරව භූ ගත ජලය පොම්ප කිරීම හේතුවෙන් ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ජලය ලබා ගන්නා ජල මූලාශ්‍රවල දිගුකාලීන තිරසාරභාවයට තර්ජනයක් වී ඇත. මෙය භූගත ජලය මත යැපෙන ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් ප්‍රජාවන්ට අඛණ්ඩ පානීය ජලය සැපයීමට බාධා ඇති කරන අතර ජලයේ ගුණාත්මකභාවයටද තර්ජනයක් ඇති වීමේ ඉහළ අවදානමක් ඇති කරයි. රටේ සමහර ප්‍රදේශවල භූගත ජලය මත යැපෙන ජල සම්පාදන යෝජනා ක්‍රම අත්හැර දැමීමට ප්‍රධාන වශයෙන් ඉහත සඳහන් හේතූන් මත ජල සම්පත් ක්ෂය වීම සහ කාලයත් සමඟ ගුණාත්මක භාවය පිරිහීම හේතු විය.

දෛනික ජල අවශ්‍යතා ඉහළ යාමත් සමග මෙම තත්ත්වය උග්‍ර වේ. ජල සැපයුම-ඉල්ලුම කළමණාකරණය කළ හැක්කේ සුදුසු ජලධර කලාප සොයා ගැනීම හා ජලධරය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සඳහා එම ජලධර නැවත ආරෝපණය කිරීමේ (MAR) යාන්ත්‍රණය යෙදීම වැනි යෝග්‍ය උපාය මාර්ග ඇතුළුව

සුදුසු කළමනාකාරන ක්‍රියාදාමයන් හරහා පමණි. මෙමගින් භූගත ජල සම්පත දිගු කාලීනව එහි තිරසාර බව පවත්වා ගැනීමට හැකියාව ලැබේ.

**අරමුණ**

භූගත ජල මුලාශ්‍ර මගින් ක්‍රියාත්මක වන අවදානම් මුලාශ්‍ර ලෙස හඳුනාගත් ජල සම්පාදන යෝජනා ක්‍රම තුළ භූගත ජලධරයේ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සහ කළමනාකරණ සැලැස්මක් හඳුනා ගැනීම.

**අධ්‍යයන ප්‍රදේශය**

ජල ඉල්ලුම වැඩිවීම, දේශගුණික විචල්‍යතා, වර්ෂා ජලය භූ අභ්‍යන්තරයට ගමන් කිරීමකින් තොරව මතුපිටින් ගලායාම, භූගත ජලය නැවත ආරෝපණය වීමේ ප්‍රදේශ අඩුවීම (ඉදි කිරීම් හේතුවෙන්) නිසා භූගත ජල පෝෂණය වීම අඩු වීම වැනි හේතුන් විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වියළි ප්‍රදේශවල භූගත ජලය මත යැපෙන ජල සම්පාදන යෝජනා ක්‍රම (WSS) කෙරෙහි බරපතල ලෙස බලපා ඇත. මෙම ජල සම්පාදන යෝජනා ක්‍රම කෙරෙහි අඛණ්ඩ ජල සැපයුම් මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා නිසි කළමනාකරණ සැලැස්මක් අවශ්‍ය තත්ත්වයක පවතී. එබැවින් භූගත ජල සම්පත කෙරෙහි ඇති වන අවදානම් බලපෑමට පිළියම් යෙදීම සඳහා තිරසාර කළමනාකරණ සැලැස්මක් හඳුන්වාදීම ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම නියමු ව්‍යාපෘතියේ මූලික අදියරේදී යාපනය, අනුරාධපුරය, පුත්තලම සහ මොනරාගල දිස්ත්‍රික්කවල බරපතල ලෙස බලපෑමට ලක් වූ බවට හඳුනාගෙන ඇති ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.



**රූපය 38:** ද්වි මාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

**2023 දී සිදුකර ඇති ක්‍රියාකාරකම්**

- අධික ලෙස ජලය පොම්ප කරන ජල මුලාශ්‍ර 30 ක් හඳුනා ගැනීම සහ අදාළ ජල සම්පාදන ක්‍රමවල තොරතුරු එක්රැස් කිරීම
- ජලධරවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවයන්වල අනාගතයේදී සිදුවිය හැකි තත්වයන් පිළිබඳව පුරෝකථනය කිරීම සඳහා තත්‍ය කාලීන නිමානන දත්ත සහ තොරතුරු ස්ථානයන් 06 ක් (උක්ත ජල සම්පාදන ක්‍රම 30 තුල පවතින නිමානන ස්ථානයන් 6 ක් ) සඳහා විශ්ලේෂණය කිරීම
- විශ්ලේෂණය සහ පවතින තොරතුරු මත පදනම්ව පවතින ජල මූලාශ්‍රවල ආරක්ෂිත ජල ප්‍රමාණයන් තක්සේරු කිරීම සඳහා ජල ධාරිතා පරීක්ෂණ 12 ක් පවත්වන ලදී.
- භූගත ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ජල සාම්පල 55ක් එක් රැස් කරන ලදී.
- භූ අභ්‍යන්තර සැකැස්ම හා සංයුතිය පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා 2D භූ භෞතික පරීක්ෂණ 8 ක් සහ 1D භූ භෞතික සමීක්ෂණ 35ක් සිදු කරන ලදී.

## 2. උත්පාදන මූලය ක්‍රියාකාරකම්

### 2.1 වාණිජ්‍ය ක්‍රියාකාරකම්

රාජ්‍ය හා අනෙකුත් ආයතන මෙන්ම පොදු ජනතාවගෙන් කරන ලද ඉල්ලීම් හා අවශ්‍යතාවයන්ට අනුව පහතින් දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. 2023 ඔක්තෝබර් මාසය දක්වා ප්‍රගතිය පහතින් දක්වා ඇත.

1. **භූ ජල විද්‍යා සමීක්ෂණ -** (නළ ළිං ඉදි කිරීම සඳහා සුදුසු ස්ථාන සලකුණු කිරීම, පස්, ගල්, වැලි කැණීම් කටයුතු හා අනෙකුත් සංවර්ධන කටයුතු වලදී භූගත ජලයට හානියක් නොවන සේ එම ව්‍යාපෘති සිදු කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම)



**රූපය 39:** ප්‍රතිරෝධකතා සමීක්ෂණ සිදු කිරීම



**රූපය 40:** මධ්‍යම අධිවේගී මාර්ගය ආශ්‍රිතව ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ (2D resistivity surveyss) සිදු කිරීම



**රූපය 41:** පස් කැණීමේ ව්‍යාපෘති ප්‍රදේශයක් අශ්‍රිතව භූ සමීක්ෂණ සිදු කිරීම



**රූපය 42:** කළු ගල් කැණීමේ ව්‍යාපෘති ප්‍රදේශයක් අශ්‍රිතව භූ සමීක්ෂණ සිදු කිරීම





**රූපය 43:** නළ ළිං ඉදි කිරීම

3. ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම - මෙමගින් නිෂ්පාදන නළ ළිං වලින් අවට භූ ගත ජලයට හානි නොවන පරිදි උකහා ගත හැකි ජල පරිමාව නිර්ණය කරනු ලැබේ.





**රූපය 44 :** ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම

4. පවතින නළ ළිං සංවර්ධනය කිරීම

විවිධ සේවා දායක පාර්ශ්වයන්ගේ ඉල්ලීම් වලට අනුව වසර ගණනකට පෙර ඉදි කරන ලද නළ ළිං පිරිසිදු කර සංවර්ධනය කිරීමේ කටයුතු ජල සම්පත් මණ්ඩලය මගින් වාණිජ්‍යමය ක්‍රියාකාරකමක් ලෙස සිදු කරනු ලැබේ.



**රූපය 45 :** නළ ළිං පිරිසිදු කිරීම

5. ජල සාම්පල රසායනික විශ්ලේෂණය





**රූපය 46:** විද්‍යාගාරය තුල ජල සාම්පල විශ්ලේෂණය

මෙම ක්‍රියාකාරකම් වලට අදාලව 2023 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 19 :** ප්‍රගති සාරාංශය

| අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | භූ ජල විද්‍යා සමීක්ෂණ (350 Nos.) | 100% | 114% |
| 2 | නළ ළිං ඉදි කිරීම (75 Nos.) | 100% | 71% |
| 3 | ජල ධාරිතා පරීක්ෂණ (225 Nos.) | 100% | 84% |
| 4 | පවතින නළ ළිං සංවර්ධනය කිරීම (10 Nos.) | 100% | 210% |
| 5 | ජල සාම්පල රසායනික විශ්ලේෂණය (500 Nos.) | 100% | 79% |

## 2.2 භූ ජල නියාමන කටයුතු

2023 වර්ෂයේදී ජල සම්පත් මණ්ඩලය විසින් සිදු කරන ලද භූගත ජල නියාමන කටයුතුවල සාරාංශ ප්‍රගතිය පහත දක්වා ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වාණිජ, කෘෂිකාර්මික සහ ගෘහාශ්‍රිත කටයුතු සඳහා යොදා ගන්නා භූගත ජල මුලාශ්‍ර පිළිබඳ තොරතුරු රැස් කිරීම මෙම වසරේ ප්‍රධාන වශයෙන් අරමුණු කරන ලදී. ඉහත ක්‍රියාකාරකම් සාර්ථක කර ගැනීම සඳහා, ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි තොරතුරු රැස්කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛයක් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත  නිකුත් කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජල සම්පත් මණ්ඩලය වෙත අදාළ තොරතුරු ලැබීමෙන් පසු අදාළ දත්ත විශ්ලේෂණයට ලක් කල අතර එම තොරතුරු අනුව අදාළ සිතියම් සකස් කරන ලදී. වාණිජමය වශයෙන් භූ ගත ජලය ලබාගන්නා ජල මුලාශ්‍ර පිළිබඳව ප්‍රධාන වශයෙන් දත්ත පද්ධතියක් සකස් කරනු ලැබීය. මෙතෙක් ලැබුණු දත්තවල ප්‍රගතිය පහත පරිදි වේ.




**රූපය 47:** භූගත ජල මූලාශ්‍ර පිළිබඳ තොරතුරු ලැබී ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල




**රූපය 48:** : කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූගත ජලය පරිභෝජන ප්‍රමාණයන් වල ව්‍යාප්තිය

**වගුව 20 :** ප්‍රගති සාරාංශය - 2023

| ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බාහිර භූජල විද්‍යාඥයින් ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව 20) | 100% | 60% |
| පුද්ගලික විදුම් සමාගම් ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව 110) සහ විදුම් යන්ත්‍ර සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම. (සංඛ්‍යාව 20) | 100% | 43% |
| භූ ජල විද්‍යා සමීක්ෂණ වාර්තා සඳහා අනුමැතිය ලබාදීම (නල ළිං ඉදිකිරීමට පෙර අනුමැතිය ලබා ගැනීම සඳහා ලියාපදිංචි බාහිර ජල විද්‍යාඥයින් විසින් සකස් කර ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද භූ ජල විද්‍යා වාර්තා) (සංඛ්‍යාව 500) | 100% | 69% |
| ජල මනු පරීක්ෂා කිරීම (50) | 100% | 20% |
| ජල මනු ස්ථාපනය (05) | 100% | 20% |

## 2.3 පර්යේෂණ නැඹුරු වාණිජ කටයුතු

### 2.3.1 නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ පර්යන්ත ප්‍රදේශය පිළිබඳ සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක සහ භූ ගත ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව අධ්‍යනය.

නොරොච්චෝලේ බලාගාරය ලෙසද හඳුන්වන ලක්විජය බලාගාරය ශ්‍රී ලංකාවේ විශාලතම බලාගාරය වේ. මෙම බලාගාරය පුත්තලම, කල්පිටිය අර්ධද්වීපයේ දකුණු දෙසින් පිහිටා ඇත. ලංකා විදුලිබල මණ්ඩලයට අනුව, ඇමරිකානු ඩොලර් මිලියන 455 ක පළමු අදියර වාර්ෂිකව TWh 1.7 කට ආසන්න විදුලිය ජනනය කරයි; 2011

වසරේ ශ්‍රී ලංකාවේ මුළු නිෂ්පාදනය වූ 11.5 TWh හා සසඳන විට සැලකිය යුතු ප්‍රමාණයකි. මෙම බලාගාරය වේයන්ගොඩ දක්වා කිලෝමීටර 115 (සැතපුම් 71) 220-කිලෝවෝල්ට් සම්ප්‍රේෂණ මාර්ගයක් හරහා විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇත. මිනිසා විසින් සාදන ලද රටේ උසම ව්‍යුහයන්ගෙන් එකක් වන මීටර් 150 (අඩි 492) උස චිමිනියක් හරහා බලාගාර පිටාර විමෝචනය වේ. බලාගාරයේ මූලික වශයෙන් විදුලිය නිපදවනු ලබන්නේ මෙගාවොට් 300ක් නිපදවිය හැකි වාෂ්ප ටර්බයිනයක් භාවිතා කරමිනි. ගල් අඟුරු, වාෂ්ප නිපදවීමට ඉන්ධන ලෙස භාවිතා කරන අතර එය ටර්බයිනය 3000 rpm වේගයෙන් කරකැවීමට භාවිතා කරයි.

ලක්විජය බලාගාරය අක්කර 100ක පමණ විශාලත්වයකින් යුත් තම පරිශ්‍රයේ භූමි අලංකරණ කටයුතු සඳහා භූගත ජලය භාවිතා කරයි. බලාගාරයේ ඉදිකිරීම් සඳහා ජල අවශ්‍යතාවය සඳහා මුලින් ඉදිකරන ලද මෙම බලාග ාර පරිශ්‍රයේ පවතින නොගැඹුරු ළිං පද්ධතිය මගින් අවශ්‍ය ජලය ලබා ගනී. සමස්තයක් වශයෙන්, මිලිමීටර් 225 ක විෂ්කම්භයක් සහිත ආසන්න වශයෙන් මීටර් 6 ක් ගැඹුරින් යුත් නොගැඹුරු නල ළිං 74 ක් පමණ ඉදිකර ඇත. මෙම ප්‍රදේශයේ ස්ථිතික භූගත ජල මට්ටම බිම් මට්ටමේ සිට මීටර් 2.50-3.50 ක් පමණ ගැඹුර පරාසයක් පමණ වේ. නල ළිං 74 ක් ඉදිකර තිබියදීත්, භූමි අලංකරණ කටයුතු සඳහා භූගත ජලය ලබාගැනීම සඳහා ක්‍රමානුකූල භාවිතයකින් තොරව විවිධ ආකාරයෙන් ළිං වරින් වර භාවිතා කර ඇත. කෙසේ වෙතත්, ලක්විජය බලාගාරයේ ඉල්ලීම මත, ජල සම්පත් මණ්ඩලය විසින් මෙම අධ්‍යයනයේ පළමු අදියරේදී තෝරාගත් ළිං සඳහා ජලය පොම්ප කිරීමේ සැලැස්මක් හා ආරක්ෂිත ජල ධාරිතාවයන් නිර්ණය කිරීම සඳහා පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී.




**රූපය 49:** නොරොච්චෝලි බලාගාරයේ සහ ඒ අවට අධ්‍යයන ප්‍රදේශයේ ගූගල් සිතියම සහ නිමානන ස්ථානයන්



**රූපය 50:** ජල සාම්පල රැස් කිරීම

අවසාන වශයෙන් ළිං පද්ධතිය සඳහා ජල මනු සවිකිරීම මගින් භූගත ජලය උකහා ගැනීම තවදුරටත් අධීක්ෂණය කිරීම නිර්දේශ කරන ලදී. ප්‍රදේශයේ භූගත ජල සම්පත් භාවිතය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම මගින් ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් මගින් සිදුවිය හැකි ජල දූෂණය වීම් අවම කරගනිමින් ජලධරය දිගු කාලීන ලෙස සංරක්ෂණය කිරීම ඉතාමත් ඵලදායි කටයුත්තක් වේ.

**2023 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්**

ජල සාම්පල 100 ක් එක් රැස් කර රසායනික විශ්ලේෂණය සඳහා භාර දෙන ලදී. රසායනික විශ්ලේෂණය මේ වන විට සිදු කරමින් පවතී.

## 3. විදේශාධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

### 3.1 භූ ගත ජලය මගින් ක්‍රියාත්මක වන ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජලය ලබාගන්නා ජල ප්‍රභවයන්වල ජලධරයන් ප්‍රති ආරෝපණය කිරීම මගින් ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම. (RWSS)

දිනෙන් දින ඉහළ යන ජල ඉල්ලුම, දේශගුණික විපර්යාසයන් හා නිසි කළමනාකාරයකින් තොරව භූ ගත ජලය පොම්ප කිරීම හේතුවෙන් ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ජලය ලබා ගන්නා ජල මූලාශ්‍රවල දිගුකාලීන තිරසාරභාවයට තර්ජනයක් වී ඇත. මෙය භූගත ජලය මත යැපෙන ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් ප්‍රජාවන්ට

අඛණ්ඩ පානීය ජලය සැපයීමට බාධා ඇති කරන අතර ජලයේ ගුණාත්මකභාවයටද තර්ජනයක් ඇති වීමේ ඉහළ අවදානමක් ඇති කරයි. රටේ සමහර ප්‍රදේශවල භූගත ජලය මත යැපෙන ජල සම්පාදන යෝජනා ක්‍රම අත්හැර දැමීමට ප්‍රධාන වශයෙන් ඉහත සඳහන් හේතූන් මත ජල සම්පත් ක්ෂය වීම සහ කාලයත් සමඟ ගුණාත්මක භාවය පිරිහීම හේතු විය.

දෛනික ජල අවශ්‍යතා ඉහළ යාමත් සමග මෙම තත්ත්වය උග්‍ර වේ. ජල සැපයුම-ඉල්ලුම කළමණාකරණය කළ හැක්කේ සුදුසු  ජලධර කලාප සොයා ගැනීම හා ජලධරය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සඳහා එම ජලධර නැවත ආරෝපණය කිරීමේ (MAR) යාන්ත්‍රණය යෙදීම වැනි යෝග්‍ය උපාය මාර්ග ඇතුළුව සුදුසු කළමනාකාරන ක්‍රියාදාමයන් හරහා පමණි. මෙමගින් භූගත ජල සම්පත දිගු කාලීනව එහි තිරසාර බව පවත්වා ගැනීමට හැකියාව ලැබේ.

**අරමුණ**

භූගත ජල මූලාශ්‍ර මගින් ක්‍රියාත්මක වන අවදානම් මූලාශ්‍ර ලෙස හඳුනාගත් ජල සම්පාදන යෝජනා ක්‍රම තුළ භූගත ජලධරයේ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සහ කළමනාකරණ සැලැස්මක් හඳුනා ගැනීම.

**අධ්‍යන ප්‍රදේශය**

ජල ඉල්ලුම වැඩිවීම, දේශගුණික විචල්‍යතා, වර්ෂා ජලය භූ අභ්‍යන්තරයට ගමන් කිරීමකින් තොරව මතුපිටින් ගලායාම, භූගත ජලය නැවත ආරෝපණය වීමේ  ප්‍රදේශ අඩුවීම (ඉදි කිරීම් හේතුවෙන්) නිසා භූගත ජල පෝෂණය වීම අඩු වීම වැනි හේතූන් විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වියළි ප්‍රදේශවල භූගත ජලය මත යැපෙන ජල සම්පාදන යෝජනා ක්‍රම (WSS) කෙරෙහි බරපතල ලෙස බලපා ඇත. මෙම ජල සම්පාදන යෝජනා ක්‍රම කෙරෙහි අඛණ්ඩ ජල සැපයුම් මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා නිසි කළමනාකරණ සැලැස්මක් අවශ්‍ය තත්ත්වයක පවතී. එබැවින් භූගත ජල සම්පත කෙරෙහි ඇති වන අවදානම් බලපෑමට පිළියම් යෙදීම සඳහා තිරසාර කළමනාකරණ සැලැස්මක් හඳුන්වාදීම ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම නියමු ව්‍යාපෘතියේ මූලික අදියරේදී යාපනය, අනුරාධපුරය, පුත්තලම සහ මොනරාගල දිස්ත්‍රික්කවල බරපතල ලෙස බලපෑමට ලක් වූ බවට හඳුනාගෙන ඇති ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

පවතින තොරතුරු සහ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මත පදනම්ව MAR යොදාගැනීම  සඳහා වඩාත් අවධානයට ලක් කලයුතු ස්ථානයන් හඳුනාගනු ලැබීය. MAR ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතා අධ්‍යනය සඳහා දැනට නොයෙකුත් හේතූන් නිසා සැලකියයුතු බලපෑමකට ලක්ව ඇති ජල සම්පාදන යෝජනා ක්‍රම හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදු කරනු ලැබීය.

අධික ලෙස භූගත ජලය උකහාගන්නා ජලධරයන් වල පවතින ගැටලුකාරී තත්වයන් මුල්කර ගනිමින්  මේ සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රම තෝරා ගන්නා ලදී.

**ප්‍රතිඵල හා නිරීක්ෂණ**

අධ්‍යනය කටයුතු සිදුකල භූගත ජල මූලාශ්‍රවල වර්තමාන තත්වය පහත පරිදි වේ.

**අනුරාධපුර දිස්තික්කය**

සිරිමාපුර - රාජාංගනය පිහිටි නිල්දියවර ප්‍රජාමූල සංවිධානය (නොගැඹුරු වල ලිඳ)

- පොම්පකරණ ජල ධාරිතාවන් හා නව ජල සම්බන්ධතා වාර්ෂිකව වැඩිවී ඇති ආකාරය.

| වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| ජල සම්බන්ධතා | 100 | 120 | 140 | 150 | 210 |
| සාමාන්‍ය දෛනික ජල පොම්ප කරන කාලය | 10 | 10 | 10 | 8 | 8 |

- වියලි කාලයේදී මෙම වල ලිංවලින් ප්‍රමාණවත් පරිදි ජලය ලබාගත නොහැකි තත්වයක් ඇති බව නිරීක්ෂණය විය.
- ලිංවල ජලයේ කඨිනත්වය හා ක්ෂරියතාවය බිමට නුසුදුසු අයුරින් ඉහල අගයක් ගැනීම
- කොලිෆෝම් බැක්ටීරියා ඉතා විශාල ප්‍රමාණයක් ළිං ජලයේ සමන්විත වීම (ඒකක 64ක්)

මෙම ප්‍රජාජල ව්‍යාපෘතිය සඳහා ජලය ලබාගැනීමට වල ළිං දෙකක් යොදාගනී. ඉන් එක් නල ලිඳක් කුඹුරු යායක් ආසන්නයේ ඇති අතර එම වල ලිඳට ජලය මෙම කුඹුරු මැදින් ගලාවන කෘෂිකර්මාන්ත සඳහා ලබාදෙන ජලයෙන් පෝෂණය වේ. එබැවින් කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාදෙන කාලසීමාව තුල ප්‍රජා ජල සැපයුමට අවශ්‍ය ජල ප්‍රමාණය වී ආකාරයෙන්ම ලබාගැනීමට හැකියාව පවතින අතර මෙම කුඹුරු සඳහා ජලය ලබානොදෙන කාලය තුලදී එම වල ලිංවලින් ලබාගත හැකි ජල ප්‍රමාණය අඩු ප්‍රමාණයක් වන බවත් එවැනි කාලවලදී ජලය ජල ව්‍යාපෘතියට අවශ්‍ය පරිදි ප්‍රමාණවත් නොවන බවද පැහැදිලි වේ. කෙසේ හෝ මෙම වල ලිඳේ ජලය ගුනාත්මභාවයෙන් ඉතා අවම මට්ටමක පවතී.



**රූපය 51:** කුඹුරු ආශ්‍රිතව පවතින වල ලිඳ

මෙම ප්‍රජා ජල ව්‍යාපෘතිය සතු දෙවන වල ලිඳ රාජාංගනය වැව ආසන්නයේ පවතින අතර එම වල ලිඳේ සාමාන්‍ය භූගත ජල මට්ටම මීටර 1 ත් මීටර 1.5 ත් අතර වේ. ලිඳේ ජල මට්ටම ඉහලින් පැවතියද, ජලය පොම්ප කරන අතරතුරදී එම ලිඳේ ජල මට්ටම සැලකිය යුතු ආකාරයෙන් පහල බසින බවත් නැවත ජල මට්ටම ප්‍රතිස්ථාපනය වීම සඳහා වැඩි කාලයක් ගත වන බවත් පෙනී යයි. වර්ෂ 2018 සිට 2020 අතර කාලය තුලදී මෙම ප්‍රජා ජල ව්‍යාපෘතිය මගින් මෙම වල ලිඳෙන් ජලය පොම්ප කිරීමේදී පැය 5ක් පමණ නොකඩවා ජලය පොම්ප කර ඇති බවත් පැය කීපයකදී නැවතත් ජල මට්ටම පෙර පැවති මට්ටමට පැමිණෙන බවත් නැවත ජලය නොකඩවා පම්ප කල හැකි බවත් තොරතුරු අනුව පැහැදිලි වේ. කෙසේ වෙතත් අවසාන වසර දෙක තුල මෙම වල ලිඳෙන් පොම්ප කල හැකි ජල ප්‍රමාණය සීඝ්‍ර ලෙස අඩු වූ බවත් නැවත ජල මට්ටම ප්‍රතිස්ථාපනය වීම සඳහා වැඩි කාලයක් තැබීමට සිදුව ඇති බවත් පෙනී යයි. ජලය පොම්ප කිරීමේදී සිදුකල නිරීක්ෂණයන් අනුව ජලය පොම්ප කිරීමේදී ලිඳේ ජල මට්ටම පහත බැස්සද ඒ අවට පිහිටි නොගැඹුරු ජලධරයේ භූගත ජල මට්ටම ඒ අනුව පහත බැසීම සිදුනොවන බව පැහැදිලි විය. එනම් ජලධරයෙන් ජලය ලිඳ තුලට පැමිණෙන ජල මාර්ග විවිධ හේතුන් නිසා අවහිර වී ඇති බව පැහැදිලි වේ. මේ හේතුන් නිසා වියලි කාලයේදී ප්‍රජා ජල ව්‍යාපෘතියට ජලය හිගකමක් ඇති බව පැහැදිලි වේ.

සියලු කරණා සැලකිල්ලට ගනිමින් ලිඳෙන් ලබාගත හැකි ජල ප්‍රමාණය වැඩි කිරීම සඳහා සුදුසු ජල මුලාශ්‍රයක් යොදාගනිමින් එහි ජල මුලාශ්‍රය ප්‍රතිආරෝපණය කිරීම කළමනාකරණය කිරීමට ක්‍රමවේදයක් හදුන්වා දීම සඳහා ඉහත දෙවන වල ලිඳ තෝරාගනු ලැබීය.

අදාළ භූ ගත ජලය ලබාගත හැකි ආකාරයන් හා භූ ජල විද්‍යාත්මක සාධක සලකමින් මෙම වල ලිඳෙන් ලබාගත හැකි ජල ප්‍රමාණයන් වැඩි දියුණු කිරීමේ කටයුතු සිදුකල හැකි ක්‍රමවේදයන් පිළිබඳව අවධානය යොමු කරනු ලැබීය.




**රූපය 52:** රාජාංගනය නිල්දියවර ජල යෝජනා ක්‍රමයට අයත් වල ලිංවල පිහිටීම

මූලාශ්‍ර ජලය ලබා ගැනීමේ හැකියාව සහ නැවත ආරෝපණය කිරීමේ යෝජිත ක්‍රමය.

භූගත ජලය නැවත ආරෝපණය කිරීම සඳහා මූලික අවශ්‍යතාවලින් එකක් වන මූලාශ්‍ර ජලය ලබා ගැනීමේ හැකියාව මූලික වශයෙන් තක්සේරු කරනු ලබන්නේ මෝසම් වර්ෂාපතනය අනුව වේ. නමුත් ගැටළුව අවට ප්‍රදේශයේ භූගත ජල මට්ටම ක්ෂය වීම නොවේ. ළිඳ ආශ්‍රිත ප්‍රදේශය අවහිර වන ද්‍රව්‍ය තැන්පත් වීම නිසා එහි කාර්යක්ෂමතාව අඩුවීම මෙයට හේතු වී ඇත.

එබැවින් මෙහි දී රාජාංගනය වැවෙන් පහළට ගලා බසින වන ජලය සෘජුවම ළිං නැවත ආරෝපණය කිරීම සඳහා පාර්ශ්වික ප්‍රතිචක්‍රීකරණ ව්‍යුහ හෝ භූගත ජල වේලි හෝ අභ්‍යන්තර බැමි යෙදිය හැකිය.

ජලධරයේ වර්තමාන තත්ත්වයන් තුළ ළිඳ සෘජුවම නැවත ආරෝපණය කිරීම සඳහා මෙය වඩාත් කාර්යක්ෂම හා ලාභදායී ව්‍යුහයන් වනු ඇත. ජලාශය හේතුවෙන් බහු වාර්ෂික ජල මූලාශ්‍ර ඇති ප්‍රදේශවල. මෙම තාක්ෂණයේ ප්‍රධාන වාසි පහත පරිදි වේ: -

1. තැන්පත් කිරීමේ ටැංකි වැනි විශාල ඉඩක් වෙන් කිරීම අවශ්‍ය නොවේ
2. පසෙහි පවතින ජල වාෂ්ප වාෂ්පීකරණයේ ස්වරූපයෙන් ජල හානියක් සිදු නොවේ. එය සාමාන්‍යයෙන් සිදුවන්නේ මූලාශ්‍ර ජලය වඩෝස් කලාපය හරහා ගමන් කළ යුතු විටය.
3. වේලි කඩා වැටීම වැනි විය හැකි ව්‍යසනය වළක්වා ගත හැක.

**භූ ජල විද්‍යාත්මක අංශ හඳුනා ගැනීම**

කෘතිම පුනරාරෝපණය කිරීමේ ව්‍යුහය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීම සඳහා භූ භෞතික විද්‍යාත්මක ක්‍රම භාවිතා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ භූ ජල විද්‍යාත්මක පසුබිම පිළිබඳව අධ්‍යයනයයි.

2-D ප්‍රතිරෝධක සමීක්ෂණය මගින් (භූ භෞතික සමීක්ෂණය) පෙන්නුම් කරන්නේ (රූපය 53) ඉහළ පාංශු ස්ථරය (3 සිට 7 m ගැඹුර මට්ටම) අඩු ප්‍රතිරෝධක අගයන් ඇති බව සහ එහි තවදුරටත් ස්තර පවතින බව වේ.

ක්ෂේත්‍ර නිරීක්ෂණ, භූ භෞතික සමීක්ෂණ ප්‍රතිඵල, ළිඳේ අභ්‍යන්තරයේ සහ පිටත භූගත ජල මට්ටම වෙනස් වීම සහ භූමියේ ස්වභාවය අනුව, පිටාර ජලය එකතු කිරීම සඳහා මතුපිට වේලි ඉදිකිරීමට සුදුසු වේ. භූගත ජල වේල්ලක් යනු ඇළ හරහා ඇති උප-මතුපිට බාධකයක් වන අතර එමඟින් පද්ධතියේ ස්වාභාවික භූගත ජල ප්‍රවාහය ප්‍රමාද කරන අතර අවශ්‍ය කාල සීමාව තුළ ජලය පොලව තුලට කාන්දු වීම සඳහා පොළව මතුපිටට

පහළින් ජලය ගබඩා කරයි. භූගත ජල වේල්ලේ ප්‍රධාන අරමුණ වන්නේ භූගත ජලය උප ද්‍රෝණියන් පිටතට ගලායාම නතර කිරීම සහ කෘතිම ජලධරය තුළ ගබඩා කිරීම වැඩි කිරීමයි. ළිඳෙන් පොම්ප කරන විට ජල මට්ටමේ විචලනය හේතුවෙන් ගුරුත්වාකර්ෂණය යටතේ ජලය ස්වයංක්‍රීයව නල මාර්ගයෙන් සකස් කරන ළිඳට ගලා යා හැකිය.




**රූපය 53:** ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ ප්‍රතිපල අනුව වල ළිඳ පිහිටි ස්ථානය

**අනුරාධපුර රඹෑව ඉක්‍රා CBO (ආසන්න ගැඹුරු නල ළිං 3ක්)**

ජලය පොම්ප කිරීමේ විස්තර සහ ජල සැපයුම් සම්බන්ධතා ගණන

| වසර | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| සම්බන්ධතා ගණන | 818 | 823 | 830 | 830 | 840 |
| නළ ළිඳ 2: දෛනිකව ජලය පොම්ප කරන පැය ගණන | 10 | 8 | 8 | 8 | 8 |
| නළ ළිඳ 2: දෛනිකව ලබා ගන්නා ජල ප්‍රමාණය(ඝන මීටර) | 150 | 125 | 125 | 125 | 100 |
| නළ ළිඳ 1: දෛනිකව ජලය පොම්ප කරන පැය ගණන | 5 | 5 | 4 | 4 | 4 |
| නළ ළිඳ 1: දෛනිකව ලබා ගන්නා ජල ප්‍රමාණය(ඝන මීටර) | 50 | 40 | 40 | 40 | 40 |
| නළ ළිඳ 3: දෛනිකව ජලය පොම්ප කරන පැය ගණන | 17 | 10 | 10 | 8 | 8 |
| නළ ළිඳ 3: දෛනිකව ලබා ගන්නා ජල ප්‍රමාණය(ඝන මීටර) | 300 | 200 | 200 | 200 | 120 |

- ඉල්ලුම සඳහා වියළි කාලවලදී ජලය ප්‍රමාණවත් නොවීම
- ජලයේ කඨිනත්වය සහ ක්ෂාරීය බව පානීය ප්‍රමිතීන් සඳහා නිර්දේශිත මට්ටමට වඩා වැඩිය
- Coliform & E.Coli බැක්ටීරියා පානීය ප්‍රමිතීන් සඳහා නිර්දේශිත මට්ටමට වඩා වැඩිය




**රූපය 54:** අධ්‍යයන ප්‍රදේශය - ඇකිරිගොල්ලෑව, රබෑව, ඉක්‍රා ප්‍රජා ජල ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශය




**රූපය 55:** භූගත ජල මට්ටම, විද්‍යුත් සන්නායක තාවය සහ වර්ෂාපතන විචලනය

**භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය**

ප්‍රදේශය ආවරණය වන පරිදි ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ 2ක් සිදුකරන ලදී. මෙහි අරමුණ පොලව අභ්‍යන්තරයේ පවතින ව්‍යුහයන් පිලිබඳ අවබෝධයක් ලබා ගැනීමයි.




**රූපය 56:** ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ සිදු කළ ස්ථාන




**රූපය 57:** Survey Line 1 - ඇකිරියගොල්ලෑව




**රූපය 58:** Survey Line 2 - ඇකිරියගොල්ලෑව

භූභෞතික විද්‍යාත්මක ප්‍රතිපල අනුව, මතුපිට පස් ස්තරයේ ගැඹුර මීටර් 8-10 ක් පමණ වේ. තවද තද පාෂාණමය ස්ථරය දැඩි ලෙස පවතින බව නිරීක්ෂණය වේ. Survey Line 2 හි මධ්‍යම කොටස භූ ජල විද්‍යාත්මකව යෝග්‍යතාවයක් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකි අතර තත්කාලීන නිරීක්ෂණ ළිඳ (Real-time monitoring well) සහ ජලය අධික ලෙස උකහා ගන්නා (Abstraction) ළිඳ එම ප්‍රදේශයේ ඉදි කර ඇත.

කෙටි කාල සීමාවකදී ගැඹුරු ජලධරයන් පුනරරෝපණය සිදු කිරීම පිළිබඳව නිර්ණය කිරීම තරමක් සංකීර්ණ වේ. එබැවින්, ජල මට්ටමේ විචලනය, පිරිවැය මිනුම්, අනෙකුත් ගැඹුරු ළිංවල ජල මට්ටමේ වෙනස්වීම් නිරීක්ෂණය, භූගත ජලය අදාල ජල ධරය තුල ගබඩා කිරීමේ ධාරිතාව (Storitivity) ගණනය කිරීම්, ජලය ප්‍රවාහ වන වේගය (Hydraulic Conductivity), මෝසම් වර්ෂාව සමග ජල මට්ටමේ වෙනස්වීම් (මෝසම් පෙර සහ පසු) වැනි අමතර දත්ත ලබා ගැනීම ඉදිරි කාලය තුල මෙම ප්‍රදේශය තුල භූගත ජලය පුනරාරෝපණය සිදු කිරීමේ කටයුතු සඳහා වැදගත් වේ.

**පුත්තලම දිස්ත්‍රික්කය**
**සුනිල දිය දහර ප්‍රජා මුල සංවිධානය, මහකුඹුක්කඩවල**

| වර්ෂය | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| ජල සම්බන්ධතා | 80 | 120 | 160 | 220 |
| වළ ළිඳ: පොම්ප කරන දෛනික ජල ප්‍රමාණය (ඝන මීටර) | 30 | 20 | 10 | 0 |
| වළ ළිඳ: පොම්ප කරන දෛනික පය ගණන | 03 | 04 | 03 | 0 |
| නළ ළිඳ: පොම්ප කරන දෛනික ජල ප්‍රමාණය (ඝන මීටර) | 50 | 70 | 100 | 140 _Well dried |
| නළ ළිඳ: පොම්ප කරන දෛනික පැය ගණන | 03 | 04 | 03 | 0 |

වියළි කාලය තුල මෙම ළිං වලින් ලබා ගත හැකි ජල ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ.




**රූපය 59:** අධ්‍යයන ප්‍රදේශය - මහකුඹුක්කඩවල

මෙම වළ ළිඳ පෙත්තිගම වැව ආසන්නයේ පිහිටා ඇත. මෙම ළිඳ, වැවෙන් එන පිටාර ජලයෙන් නැවත ආරෝපණය වේ. ජලයකාන්දු වන දිශාව සලකා බලන විට, ළිඳ පිහිටා ඇත්තේ මඳක් ඈතින් බැවින්, වියළි කාලය තුළ නැවත ආරෝපණය කිරීමේ හැකියාව ඉතා අඩු වන අතර, ළිං ක්ෂේත්‍රයේ සහ එම ජලධරයෙන් ජලය රැස් කර ගත හැක. පොම්ප කිරීමෙන් ලබා ගත හැකි ජල ප්‍රමාණය වර්ෂා කාලයේ ජල ඉල්ලුමට ප්‍රමාණවත් නමුත් වසරේ වියළි කාලවලදී, පොම්ප කිරීමේදී භූගත ජල මට්ටම සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් ජල ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ.



**රූපය 60:** වළ ළිඳ සහ ඒ ආශ්‍රිත වැව

### භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය



භූභෞතික විද්‍යාත්මක ප්‍රතිපල අනුව, මතුපිට පස් ස්තරයේ ගැඹුර මීටර් 8-10 ක් පමණ වේ. තවද තද පාෂාණමය ස්ථරය දැඩි ලෙස පවතින බව නිරීක්ෂණය වේ. Survey Line 2 හි මධ්‍යම කොටස භූ ජල විද්‍යාත්මකව යෝග්‍යතාවයක් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකි අතර තත්කාලීන නිරීක්ෂණ ළිඳ (Real-time monitoring well) සහ ජලය අධික ලෙස උකහා ගන්නා (Abstraction) ළිඳ එම ප්‍රදේශයේ ඉදි කර ඇත.

කෙටි කාල සීමාවකදී ගැඹුරු ජලධරයන් පුනරරෝපණය සිදු කිරීම පිළිබඳව නිර්ණය කිරීම තරමක් සංකීර්ණ වේ. එබැවින්, ජල මට්ටමේ විචලනය, පිරිවැය මිනුම්, අනෙකුත් ගැඹුරු ළිංවල ජල මට්ටමේ වෙනස්වීම් නිරීක්ෂණය, භූගත ජලය අදාල ජල ධරය තුල ගබඩා කිරීමේ ධාරිතාව (Storitivity) ගණනය කිරීම්, ජලය ප්‍රවාහ වන වේගය (Hydraulic Conductivity), මෝසම් වර්ෂාව සමග ජල මට්ටමේ වෙනස්වීම් (මෝසම් පෙර සහ පසු) වැනි අමතර දත්ත ලබා ගැනීම ඉදිරි කාලය තුල මෙම ප්‍රදේශය තුල භූගත ජලය පුනරාරෝපණය සිදු කිරීමේ කටයුතු සඳහා වැදගත් වේ.

**පුත්තලම දිස්ත්‍රික්කය**
**සුනිල දිය දහර ප්‍රජා මුල සංවිධානය, මහකුඹුක්කඩවල**

| වර්ෂය | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| ජල සම්බන්ධතා | 80 | 120 | 160 | 220 |
| වළ ළිඳ: පොම්ප කරන දෛනික ජල ප්‍රමාණය (ඝන මීටර) | 30 | 20 | 10 | 0 |
| වළ ළිඳ: පොම්ප කරන දෛනික පය ගණන | 03 | 04 | 03 | 0 |
| නළ ළිඳ: පොම්ප කරන දෛනික ජල ප්‍රමාණය (ඝන මීටර) | 50 | 70 | 100 | 140 _Well dried |
| නළ ළිඳ: පොම්ප කරන දෛනික පැය ගණන | 03 | 04 | 03 | 0 |

සවිස්තරාත්මක අධ්‍යයනයේ ප්‍රතිපල අනුව භූමි මට්ටමේ උස වෙනස්වීම සහ වළ ළිඳ දක්වා ඇති දුර සැලකිල්ලට ගත් විට, භූගත ජල පුනරාරෝපණය සඳහා ව්‍යුහමය සැකසුම සඳහා වැය කල යුතු පිරිවැය වැඩි විය හැක. එබැවින්, මෙම ළිඳ සඳහා MAR තාක්ෂණය යොදා ගැනීමට පෙර, එවැනි ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.

එයට අමතරව, පවතින නල ළිඳ පිරිසිදු කිරීම හෝ අලුත්වැඩියාවන් කිරීමත්, එය නැවත ක්‍රියාත්මක තත්ත්වයකට ගෙන ඒමත් සිදු කළ යුතුය.

**බදුල්ල දිස්ත්‍රික්කය**
**පුරනැගුම ජල සම්පාදන ව්‍යාපෘතිය- ඇකිරියන්කුඹුර, රිදීමාලියද්ද**

- පොම්පකරණ ජල ධාරිතාවන් හා නව ජල සම්බන්ධතා වාර්ෂිකව වැඩිවී ඇති ආකාරය.

| වර්ෂය | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| ජල සම්බන්ධතා | 337 | 366 | 373 | 377 |
| නල ළිඳ : පොම්ප කරන දෛනික ජල ප්‍රමණය (ඝන මීටර) | 40 | 40 | 40 | 40 |
| නල ළිඳ (දිනකට පොම්ප කරන පැය) | 08 | 08 | 18 | 18 |

මෙම ජල ව්‍යාපෘතියට අයත් නල ළිඳ 2017 වර්ෂයේ ජල සම්පත් මණ්ඩලය මගින් ඉදිකර ඇති අතර එහි දළ ජල ධාරිතාවය මිනිත්තුවට ලීටර 1200 ක් පමණ වී ඇත. මෙය ඇකිරියන්කුඹුර මුලික රෝහල් භූමියේ ඉදිකර ඇත.




**රූපය 62:** නල ළිඳ ඉදිකර ඇති ස්ථානය

ප්‍රජා ජල සැපයුම වෙනුවෙන් දෛනිකව වැඩි ප්‍රමාණයක් ජලය ලබාගන්නා මෙම නල ළිඳ තුලට ජලය සැපයෙන ගැඹුරු ජලධරයේ ජල මට්ටමේ වෙනස්වීම් නිමානය කිරීම සඳහා තත්කාලීන තොරතුරු ලබාගත හැකි පරිදි නිමානන ඒකකයක් මෙම ස්ථානයේ ස්ථාපිත කර ඇත. මෙම නල ළිඳේ හා නිමානන නල ළිඳේ තාක්ෂණික විස්තර පහත පරිදි වේ.

| ළිඳ | පොම්ප කරන නල ළිඳ | නිමානන නල ළිඳ |
|---|---|---|
| සම්පූර්ණ ගැඹුර (පොලව මට්ටමේ සිට මීටර ) | 60 | 50 |
| සිදුරු රහිත පී.වී.සී. ගැඹුර | 0 | 0 - 12.00 |
| කළුගල සිදුරුකර ඇති ගැඹුර | 12.30 - 60 | 12.0 – 50.0 |
| කළුගලේ පැලුම් කලාප හා එක් එක් පැලුම් කලාපවල දළ ජල ධාරිතාවය (yield) | 1.24.30 -24.40 / yield 200 lpm | 1. 14.00 -14.10 / වියළි පැලීම් |
| | 2. 29.0-29.20 / වියළි පැලීම් | 2. 41.20- 41.25 / yield 35 lpm |
| | 3. 39.20-39.30 / yield 100 lpm | 3. 41.80- 41.85 / yield 20 lpm |
| | 4. 48.9- 49.10 / yield 900 lpm | 4. 42.60-42.65 / yield 30 lpm |
| | | 5. 43.90- 43.95 / yield 20 lpm |
| | | 6. 45.3 – 45.35 / yield 15 lpm |
| දළ ජල ධාරිතාවය | **1200** | 120 |




**රූපය 63:** ජල මට්ටම, ජලයේ විද්‍යුත් සන්නායකතාවය, සහ වර්ෂාපතන විචලනය - ඇකිරියන්කුඹුර ප්‍රදේශය

අඛණ්ඩ වර්ෂාපතනය ප්‍රදේශයේ ගැඹුරු ජලධරයන්ට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බව පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, එම වර්ෂාපතනය හේතුවෙන් පාරිභෝගිකයින්ගේ ජල ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ජල ධාරිතාවයක් වැඩි වී නොමැත.




**රූපය 64:** ද්වීමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ ප්‍රතිපල

2017 වර්ෂයේ ජල සම්පත් මණ්ඩලය මගින් සිදුකර ඇති ජල ධාරිතා පරීක්ෂණ දත්ත අනුව මෙම නල ලිඳෙන් එවකට දිනකට ජලය ඝන මීටර 325 ක් පමණ ලබාගැනීමට නිර්දේශ දී තිබුනද දැනට වසර දෙකක පමණ කාලයක සිට එයින් ලබාගත හැකි ජල ධාරිතාවය දිනකට ඝන මීටර 40 ක් පමණ බව තොරතුරු අනුව ගම්‍ය වේ. එම ප්‍රමාණය ලබාගැනීම සඳහාද දිනකට අවම ලෙස පැය 15 ක් පමණ පොම්ප කල යුතු බව තොරතුරු අනුව පැහැදිලි වේ. මෙම තත්වය පහත හේතුන් මත ඇතිවිය හැක.

1. නල ළිඳ තුලට ජලය ගලා එන පැලුම් හා කුස්තුරවල විවිධ රසායනික ප්‍රතික්‍රියා හේතුවෙන් සෑදෙන ද්‍රව්‍ය තැන්පත් වීම හේතුවෙන් එම ජල ධරයන් අවහිර වීම.
2. ගැඹුරු ජල ධරයේ භූ ගත ජල මට්ටම සීඝ්‍ර ලෙස පහත බැසීම හා ජලධරය ප්‍රතිස්ථාපනය වීම සඳහා වැඩි කාලයක් ගැනීම.
3. අධික පොම්ප කිරීම නිසා ජල ධරය ක්‍රමයෙන් සිඳී යාම

**නිර්දේශ**

ජල මූලාශ්‍රවල භූගත ජල මට්ටමෙහි වත්මන් ආතති තත්ත්වය, භූ භෞතික පරීක්ෂණ, ජලධර පරීක්ෂණ (අස්වැන්න පරීක්ෂාව), භූගත ජලය නිස්සාරණය කිරීමේ ප්‍රමාණය සහ නැවත ආරෝපණය කළ හැකි මූලාශ්‍ර පිළිබඳ දත්ත සහ තොරතුරු අනුව, විශේෂයෙන් භූගත ජලය වැඩි දියුණු කිරීම සඳහා MAR යෙදීම සඳහා ස්ථාන දෙකක් තෝරා ගන්නා ලදී.

**පුරානැගුම ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ඇකිරියන්කුඹුර මූලික රෝහලේ නළ ළිඳ.**

**වර්ෂා ජලය රැස් කිරීම මගින් භූගත ජලය නැවත ආරෝපණය කිරීමේ ක්‍රමය මේ සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. වහලයේ ඇති වැසි ජලය සංරක්ෂණය කර භූගත ජලය නැවත ආරෝපණය කිරීම සඳහා භාවිතා කළ හැකිය. මේ සඳහා ජලය විශේෂයෙන් නිර්මාණය කර ඇති නව නල ළිඳකට හරවා සිදු කෙරේ. රෝහල් ගොඩනැගිල්ල විශාල වහළ ප්‍රදේශයකින් යුක්ත වන අතර මෙම ස්ථානයේ ජලධරය නැවත ආරෝපණය කිරීම සඳහා වහලයේ ඉහළ කොටස වැසි ජලය රැස් කිරීම සඳහා භාවිතා කළ හැකිය.**

නිල්දිය ප්‍රජා මූලික සංවිධානය යටතේ ශ්‍රීරාම්පුරයේ නොගැඹුරු ළිඳ.

ළිං ක්ෂේත්‍රයේ භූගත ජල ධාරිතාව ඉහළ නැංවීම සඳහා, රාජාංගනය වැවෙන් පහළට ගලා බසින ජලය සෘජුවම ළිං නැවත ආරෝපණය කිරීම සඳහා පාර්ශ්වික ප්‍රතිචක්‍රීකරණ ව්‍යුහ තුල හෝ භූගත ජල වේලි හෝ උප මතුපිට බැම් යෙදිය හැකිය. මෙම ක්‍රමය Regolith aquifer හි ජල භූ විද්‍යාත්මක සැකැස්ම අනුව භාවිතා වේ. මෙම ක්‍රමය ළිං වල සෘජුවම ජල ප්‍රමාණය වැඩි කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම හා ලාභදායී ව්‍යුහයකි. මූලික ප්‍රවාහය ලෙස ජල මූලාශ්‍රය පවතින ප්‍රදේශවල, ළිඳ සෘජුවම නැවත ආරෝපණය කිරීම සඳහා භූගත ජල වේලි ඉදිකළ හැක.

භූගත ජලය කෘත්‍රිමව නැවත ආරෝපණය කිරීමේ ඕනෑම යෝජනා ක්‍රමයකදී ජල මට්ටම් සහ ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම ප්‍රධාන වැදගත්කමක් දරයි. කෘත්‍රිම නැවත ආරෝපණය කිරීම සඳහා ඉදිකරන ලද ව්‍යුහවල කාර්යක්ෂමතාව මැනීමට අධීක්ෂණ දත්ත ප්‍රයෝජනවත් වන අතර විද්‍යාත්මක මාර්ග ඔස්සේ භූගත ජල කළමනාකරණය සඳහා ඵලදායී පියවර ගැනීමට බෙහෙවින් උපකාරී වේ.

## 3.2 ඒකාබද්ධ ජල සම්පත් සහ ජල පෝෂක කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම

භූගත ජල ක්ෂේත්‍රයේ වර්තමාන ගැටලු සලකා බැලීමේදී, එහි ආරක්ෂාව සහ තිරසාර මට්ටමින් භාවිතය සඳහා නිසි භූගත ජල කළමනාකරණයක් සංවර්ධනය කිරීමේ හා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව ප්‍රමුඛ වැදගත්කමක් දරයි. කෙසේ වෙතත්, මේ වන විට රට තුළ භූගත ජල කළමනාකරණයක් පැවතියද එම කාර්යය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත පනත මගින් ලබා දී ඇති නියාමනය කිරීමේ බලතල නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රමාණවත් ආයතනික ව්‍යුහයක් හා නීතිමය වටපිටාවක් නොමැති කම විශාල ගැටළුවකි. තවද, අවශ්‍ය පරිදි සුදුසු සංශෝධන මගින් භූගත ජලය පිළිබඳ පවත්නා නීතිමය රාමුව සහ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. මෙම භූගත ජල සංරචකය සැලසුම් කර ඇත්තේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ මහවැලි අධිකාරිය මගින් සිදුකරන නියමු ගංගා ද්‍රෝණිවල පූර්ණ ඒකාබද්ධ සහ සංයෝජිත භූගත ජල කළමනාකරණ වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම සඳහා වන අතර භූගත ජලය මත රඳා පවතින තවත් ද්‍රෝණි කිහිපයක භූගත ජල කළමනාකරණය සඳහා රාමුව සංවර්ධනය කිරීම සඳහා ය.

**අරමුණ**
උප සංරචක 3.2 හි පරමාර්ථය වන්නේ ආයතනික රාමුව සහ ධාරිතාව සංවර්ධනය කිරීම, අවශ්‍ය තාක්ෂණය සහ යටිතල පහසුකම් අත්පත් කර ගැනීම සහ ස්ථාපනය කිරීම සහ ශ්‍රී ලංකාව තුළ තිරසාර භූගත ජල කළමනාකරණයක් සඳහා උපාය මාර්ගික භූගත ජල කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ සැලැස්මක් ස්ථාපිත කිරීමයි.

භූගත ජල කළමනාකරණ සැලැස්ම සකස් කරනු ලබන්නේ:
- අධික ලෙස ජලය පොම්ප කිරීම මගින් සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සහ වැළැක්වීම
- නියඟයේ සහ දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අවම කිරීම
- භූගත ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව තර්ජන අඩු කිරීම
- තිරසාර භූගත ජල ආරෝපණය වැඩි දියුණු කිරීම
- භූ ගත ජලය සම්බන්ධයෙන් වන ගැටළු නිරාකරණය සඳහා යාන්ත්‍රණ සැපයීම.

**ප්‍රතිපල**
ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ නියමු ගංගා ද්‍රෝණිවල භූගත ජල සම්පත් තිරසාර ලෙස ලබා භාවිතය හා සංරක්ෂණය වේ.
තවද,
- නියමු ගංගා ද්‍රෝණිවල භූගත ජලය භාවිත කරන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර භූගත ජල කළමනාකරණ සැලැස්මක් සහ අධීක්ෂණ පද්ධතියක් සකස් කර, සම්මත කර, ක්‍රියාත්මක කර ඇත.
- නියමු ගංගා ද්‍රෝණිවල භූගත ජලය භාවිතය නියාමනය කිරීම සහ භාවිතයට අවසර දීම සඳහා අලුතින් නීති හා ආයතනික රාමුව ශක්තිමත් කිරීම.

මෙම අධ්‍යනය මගින් නියමු ගංගා ද්‍රෝණි වල සිටින ප්‍රජාවන්ට, ව්‍යාපාරික, කෘෂිකාර්මික හෝ වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා භූගත ජලය භාවිතා කරන්නන් හට තම භූගත ජල සම්පත් හා මුලාශ්‍ර තිරසාර ලෙස භාවිතා කිරීමට අවශ්‍ය දැනුම හා ක්‍රමවේදයන් පිළිබඳව අවශ්‍ය දැනුවත් කිරීමේ කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරගත හැකි වේ.

තවද මෙමගින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින්, ජල සම්පත් මණ්ඩලය විසින් එහි ධාරිතාව, හැකියාව සහ සුදුසු කාර්ය මණ්ඩලය වැඩි දියුණු කරගැනීම මගින් අදාළ ද්‍රෝණි තුල භූගත ජල කළමනාකරණ කටයුතු වඩාත් කාර්යක්ෂමව හා කාර්යක්ෂමව කළමනාකරණය කරනු ඇත. මේ වන විට, පහත වගුවේ ලැයිස්තුගත කර ඇති (පහත සිතියමේ පෙන්වා ඇති පරිදි) ගංගා ද්‍රෝණි 3 ක් සහ එක් කලාපයක (යාපනය අර්ධද්වීපය) භූගත ජල කළමනාකරණ සැලසුම් සංවර්ධනය සිදු වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සහාය දක්වන ගංගා ද්‍රෝණි තුන ද පහත වගුවේ ලැයිස්තුගත කර ඇති අතර පහත සිතියමේ පෙන්වා ඇත

**වගුව 21:** අධ්‍යයන ප්‍රදේශ සහ අධ්‍යයන ස්වභාවය

| | ගංගා ද්‍රෝණිය | අධ්‍යනයේ ස්වභාවය | ගංගා ද්‍රෝණි කළමනාකරණය සිදු කරන පළාත් කාර්යාලය |
|---|---|---|---|
| 1 | කැළණි ගඟ | නව අධ්‍යනයක් | බස්නාහිර පළාත් කාර්යාලය (ජල සම්පත් මණ්ඩලය ප්‍රධාන කාර්යාලය ) |
| 2 | දැදුරු ඔය | නව අධ්‍යනයක් | වයඹ පළාත් කාර්යාලය |
| 3 | මා ඔය | නව අධ්‍යනයක් | වයඹ පළාත් කාර්යාලය |
| වෙනත් ව්‍යාපෘති මගින් සිදුකරගෙන යනු ලබන භූගත ජල කළමනාකරණ ක්‍රමවේදයක් සැකසීම සඳහා මෙම ව්‍යාපෘතියට එක් කරගන්නා ප්‍රදේශ | | | |
| 4 | යාපනය | සිදුකරගෙන යනු ලබන අධ්‍යනයකි | උතුරු පළාත් කාර්යාලය |
| 5 | මල්වතුඔය | සිදුකරගෙන යනු ලබන අධ්‍යනයකි | උතුරුමැද පළාත් කාර්යාලය |
| 6 | කුඹුක්කන් ඔය | සිදුකරගෙන යනු ලබන අධ්‍යනයකි | ඌව / නැගෙනහිර පළාත් කාර්යාලය |
| 7 | මාදුරු ඔය | සිදුකරගෙන යනු ලබන අධ්‍යනයකි | උතුරුමැද පළාත් කාර්යාලය |

**ප්‍රධාන කාර්යයන්**

පහත දක්වා ඇති කාර්යයන් මෙම ව්‍යාපෘතිය මගින් අදාළ ප්‍රදේශ වල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**භූගත ජලධරයන් වල භූ සමීක්ෂණ, සිතියම් හා ප්‍රමාණාත්මකතාවයන් අධ්‍යනය කිරීම**

ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මගින් ලබාගත් දත්ත/තොරතුරු විශ්ලේෂණය මඟින් අදාළ ද්‍රෝණිවල භූ ගත ජලයේ රසායනික සංයුතිය සහිත සිතියම්, ජල භූ විද්‍යාත්මක සහ ජලයේ ප්‍රමාණාත්මක භාවය පිළිබඳව සිතියම් සකස් කිරීම සැලසුම් කර ඇත. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා සවිස්තරාත්මක භූ භෞතික ගවේෂණ, පරීක්ෂණ නල ළිං ඉදිකිරීම, ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම, ජලයේ රසායනික විශ්ලේෂණ පරීක්ෂාව යනාදිය ඇතුළත් වේ.

තවද, භූගත ජලය නැවත ආරෝපණය කිරීමේ කලාප සහ යාන්ත්‍රණ හඳුනා ගැනීම සහ ඒවායේ සාපේක්ෂ වැදගත්කම තක්සේරු කිරීම; (ගංගා ද්‍රෝණි සැලසුම් කණ්ඩායම සමඟ සම්බන්ධීකරණයෙන් නැවත ආරෝපණය කිරීමේ කළමනාකරණ අවශ්‍යතා හඳුනා ගැනීම.)

**භූගත ජල කළමනාකරණ ක්‍රමවේදයන්, මාර්ගෝපදේශ සහ රෙගුලාසි සංවර්ධනය කිරීම**

මෙම අධ්‍යනය යටතේ කෙටුම්පත් කරන ලද එක් එක් ගංගා ද්‍රෝණිය සඳහා භූගත ජල කළමනාකරණ සැලැස්ම, එක් එක් නියමු ද්‍රෝණියේ මතුපිට ජලය සම්බන්ධයෙන් සකස් කරන ලද මතුපිට ජල කළමනාකරණ සැලසුම් සමඟ ඒකාබද්ධ කිරීම සිදු කරනු ලබයි.

**පළාත් මට්ටමෙන් භූගත ජල කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීම**

ශ්‍රී ලංකාවේ ඇති ජලධරයන්වල ස්වභාවය හා හැසිරීම ඒ ඒ ප්‍රදේශයේ පවතින භූ අභ්‍යන්තර ලක්ෂණයන් අනුව වෙනස් වන බැවින් ඒ ඒ ද්‍රෝණි වල භූගත ජල කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පළාත් සහ ද්‍රෝණි මට්ටමින් සිදුකල යුතු අතර ඒ සඳහා පළාත් මට්ටමෙන් කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීම වැදගත් වේ.




**රූපය 65:** නියමු අධ්‍යන ප්‍රදේශ

මෙම ව්‍යාපෘතිය මගින් මෙම වර්ෂයේ පහත සඳහන් ක්‍රියාකාරකම් නිමකර ඇත.

1. කැළණි ගඟ, මා ඔය හා දැදුරු ඔය ගංගා ද්‍රෝණි සඳහා ක්ෂේත්‍රයේ රාජකාරි කිරීමට ප්‍රථම මූලික සමීක්ෂණ කටයුතු සිදුකර අදාළ සිතියම් හා සැලසුම් සැකසීම නිමකර ඇත.
2. භූ අභ්‍යන්තර ව්‍යුහයන් පරීක්ෂා කිරීමට අදාලව කැළණි ගඟ හා මා ඔය ගංගා ද්‍රෝණි තුල භූ සමීක්ෂණ 20 ක් සිදුකර ඇත.
3. භූ ගත ජල නිමානන පද්ධතියක් සැකසීම සඳහා වන මූලික අදියරේ ජල සාම්පල පරීක්ෂා කිරීමට සුදුසු ස්ථාන සහිත සිතියම සකසා නිමකර ඇත.
4. තෝරාගත් ගංගා ද්‍රෝණි සඳහා භූගත ජල කළමනාකරණ සැලසුම් සංවර්ධනය සඳහා උපදේශන සේවා ලබාගැනීමට අදාලව ඇගයීම (Evaluation of Consultancy Service for Development of Groundwater Management Plans) අවසන් කරන ලදී.

**2023 වර්ෂයේ ප්‍රගති සාරාංශය**

| | **උප ව්‍යාපෘති/ උප ක්‍රියාකාරකම්** | **TEC (රු.මි.)** | **2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | **මූල්‍යමය ප්‍රගතිය** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|---|
| 1 | දීර්ඝ කාලින භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM)؛ කොළඹ-මීගමුව, අම්පාර , මන්නාරම,වවුනියාව,කිලිනොච්චි, යාපනය, අනුරාධපුර, පොළොන්නරුව,මාතලේ, පුත්තලම. | 4.00 | 4.00 | 3.34 | 68% |
| 2 | භූගත ජල සම්පත් කෙරෙහි දේශගුණ විපර්යාස වල සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳව අධ්‍යයනය (SICC) | 1.50 | 1.50 | 0.97 | 71% |
| 3 | මා ඔය ගංගා ද්‍රෝණියේ පවතින ජලධර නැවත ආරෝපණය සඳහා හිතකර කලාප හඳුනා ගැනීම (Ma-oya) | 1.40 | 1.40 | 0.91 | 73% |
| 4 | භූගත ජල සම්බන්ධ පාරිසරික ගැටළු සඳහා සිදු කරන ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ (INSP) | 1.50 | 1.50 | 0.88 | 103% |
| 5 | ශ්‍රී ලංකාවෙහි භූගත ජලය පැවතීම පිළිබඳ සිතියම් සකස් කිරීම (GW-ATL) | 0.60 | 0.60 | 0.02 | 75% |
| 6 | හදිසි ආපදා අවස්ථා වල අවශ්‍යතා සඳහා භූගත ජලය සංවර්ධනය (නියඟ, ගංවතුර, භූගත ජල සම්පත් දූෂණය වීම) (E-USE) | 3.00 | 3.00 | 3.00 | 100% |
| 7 | ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම (REIMP) | 4.00 | 4.00 | 3.67 | 86% |
| 8 | ජල සම්පාදන යෝජනා ක්‍රමවල භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය (DMWSS) | 4.00 | 4.00 | 1.68 | 83% |
| | **එකතුව** | **20.00** | **20.00** | **14.48** | 82% |

**2024 වර්ෂය සඳහා වූ ව්‍යාපෘති පුරෝකථනය**

2024 වර්ෂය තුළදී, පහත සඳහන් ව්‍යාපෘති හා අධ්‍යයන සිදු කිරීමට නියමිත අතර, භූගත ජලය පිළිබඳ සංවේදී ප්‍රදේශය අනුව අර්ථ දක්වා ඇති සහ සංස්ථාගත කරන ලද තිරසාර සංවර්ධන සැලැස්ම (SDG), ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAP) ජල අංශය, NDC (ජාතික වශයෙන් නිශ්චය කරගත් දායකත්වයන්), ශ්‍රී ලංකාවේ ජල සම්පත් මණ්ඩල පනත සහ ඒකාබද්ධ ජල කළමනාකරණ සැලසුම් වැනි අනෙකුත් ජාතික සැලසුම්, යන මේ සියල්ල ජාතික හෝ ගෝලීය වශයෙන් රටේ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කර ගැනීම සඳහා දිගු කාලීන අරමුණු ඇති ප්‍රතිපත්තීන් වේ. කෙසේ නමුත් දැනට පවතින ආර්ථික අර්බුධය හමුවේ වියදම් අවම කර ගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු කරන ක්‍රියාකාරකම් අවම කර ඇත. භාණ්ඩාගාර අරමුදල් යටතේ සිදු කරන තාවකාලික ව්‍යාපෘති සැලසුම් සහ නියමිත පරිදි සකස් කළ යුතු අතනකුත් කාණ්ඩ පහත වගුවෙහි දක්වා ඇත.

**ව්‍යාපෘති පුරෝකථනය (විශේෂ අරමුදල්) - වර්ෂ 2024**

| | උප ව්‍යාපෘතිය/ උප ක්‍රියාකාරකම | TEC (රු.මි.) | අරමුණ | ප්‍රතිධානය | ප්‍රතිපලය | ව්‍යාපෘති කාල සීමාව | අයවැය | අරමුදල | ජාතික ක්‍රියාකාරී සැලසුම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | භූගත ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම - (componant 1,2,3 under, WWRMP) | 225.00 | ආයතනික රාමුව සහ ධාරිතාව සංවර්ධනය කිරීම, අවශ්‍ය තාක්ෂණය සහ යටිතල පහසුකම් අත්පත් කර ගැනීම සහ ස්ථාපනය කිරීම සහ ශ්‍රී ලංකාව තුළ තිරසාර භූගත ජල කළමනාකරණයක් සඳහා උපාය මාර්ගික භූගත ජල කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ සැලැස්මක් ස්ථාපිත කිරීමයි. | ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ නියමු ගංගා ද්‍රෝණිවල භූගත ජල සම්පත් තිරසාර ලෙස ලබා භාවිතය හා සංරක්ෂණය වේ. | රටේ භූගත ජල සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම | 2024.01.01 2025.08.31 | 129.5 | ලෝක බැංකු | WRB පනත; NEAP (ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම - IWRM හි උපාය මාර්ගය 7.6 |

## ව්‍යාපෘති පුරෝකථනය (භාණ්ඩාගාර අරමුදල්) - වර්ෂ 2024

| | ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිධානය | ප්‍රතිපලය | ව්‍යාපෘති කාල සීමාව | අයවැය | අරමුදල | ජාතික ක්‍රියාකාරී සැලසුම් |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | දිගු කාලීන භූගත ජල අධීක්ෂණ ව්‍යාපෘතිය (LTGM): කොළඹ-මීගමුව, අම්පාර, මන්නාරම, වවුනියාව, කිලිනොච්චිය, යාපනය, අනුරාධපුර, පොතළාන්නරුව, මාතලේ, පුත්තලම, මොණරාගල, ත්‍රිකුණාමලය, මාදුරුඔය ජල ද්‍රෝණිය | දිගු කාලීන කළමනාකරණය සහ සැලසුම් සඳහා රටේ ඉහළ සංවේදී භූගත ජලධර වල ජලයේ ගුණාත්මකභාවය සහ භූගත ජල මට්ටමේ වෙනස්කම් තක්තස්රු කිරීම. | රටේ ඉතා සංවේදී ජලධර වල තාවකාලිකව භූගත ජල සම්පත් හැසිරීම් හඳුනා ගැනීම සහ එහි අවකාශීය විචලනය හඳුනා ගැනීම. | රටේ ඉහළ සංවේදී ප්‍රදේශ වල භූගත ජල සම්පත් කළමනාකරණය කිරීම | 1/1/2024 - 31/12/2024 | 4.50 | භාණ්ඩාගාර | WRB පනත; NEAP (ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම - IWRM හි උපායමාර්ගය 7.6 |
| 2 | භූගත ජල සම්පත් වල දේශගුණික විපර්යාසයන්තේ සෘජු හා වක්‍ර බලපෑම් අධ්‍යයනය (SICC) | රතේ තවරළබඩ ප්රතද්ශවල තද්ශගුණික විපර්යාස තහුතවන් භූගත ජල සම්පත් වල තවනස්කම් තක්තස්රු කිරීම සහ ඇගයීම | භූගත ජල සම්පත් කළමනාකරණය කිරීම සහ ලවණතාවයට ඇළු වීම පාලනය කිරීම සඳහා ලවණතාවතේ බාධක wes ප්රතද්ශ හඳුනා ගැනීම | පාර්ශවකරුවන්ගේ නියෝජිතයා සහ භූගත ජල සම්පත් කළමනාකරණය කිරීම මගින් ලවණතාවතේ බාධක ස්ථාපනය කිරීම සඳහා නිර්දේශ ලබාදීම | 1/1/2024 - 31/12/2024 | 1.00 | භාණ්ඩාගාර | WRB පනත; NEAP (ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම - IWRM හි උපායමාර්ගය 7.6 සහ 8.1 |
| 3 | භූගත ජලය ආශ්‍රිත පාරිසරික ගැට පිළිබඳ ඒකාබද්ධ පරීක්ෂණ (INSP) | ප්‍රජාව තුල භූ ගත ජලය භාවිතය පිළිබඳ ගැටළු සඳහා පිළියම් දීම සහ ඒ ආශ්‍රිත ගැටුම් නිරාකරණය සඳහා ආමන්ත්‍රණය කිරීම | තිරසාර කළමනාකරණය සහ සමාජය තුල ජල අයිවාසිකම් සමානකම් ඇති කිරීම | තිරසාර කළමනාකරණය සහ සමාජය තුල ජල අයිවාසිකම් සමානකම් ඇති කිරීම | 1/1/2024 - 31/12/2024 | 1.00 | භාණ්ඩාගාර | WRB පනත; WRB ගැසේ පත්‍රය -2017; NEAP (ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම - IWRM උපාය මාර්ග 7.2 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (REIMP) | ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | උසස් වූ මෙහෙයුම් සැකසුම් ආයතනය තුල ප්‍රතිස්ථාපනය කිරීම | රතටහි භූගත ජල සම්පත් කළමනාකරණයෙහි ඵලදායිතාවය ඉහල නැංවීම | 1/1/2024-31/12/2024 | 3.50 | භාණ්ඩාගාර | |
| 5 | භූ ගත ජලයෙන් පෝෂණය වන ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා භූ ගත ජලය කළමනාකරණය සහ සංවර්ධනය කිරීමේ ක්‍රමෝපායන් හඳුන්වාදීම (DMWSS) | භූගත ජල මූලාශ්‍ර මගින් ක්‍රියාත්මක වන අවදානම් මූලාශ්‍ර ලෙස හඳුනාගත් ජල සම්පාදන යෝජනා ක්‍රම තුළ භූගත ජලධරයේ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සහ කළමනාකරණ සැලැස්මක් හඳුනා ගැනීම. | තිරසාර භාවිතය සඳහා ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය | | 1/1/2024-31/12/2024 | 1.00 | භාණ්ඩාගාර | |
| 6 | හදිසි ආපදා අවස්ථා වල අවශයතා සඳහා භූගත ජලය සංවර්ධනය (නියඟ, ගංවතුර, භූගත ජල සම්පත් දුෂණය වීම) | ජාතික මේටතම් ජල ආශ්‍රිත ආපදා සිදුවීම් පිළිබඳව ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පියවර ගැනීම | ජ්රජාතේ යහපැවැත්ම සඳහා භූගත ජල සම්පත් තකතරහි ඇති කරන බලපෑම අවම කිරීම හා භූගත ජල සම්පත් කළමනාකරණය කිරීම | භූගත ජල සම්පත් වලට ඇි බලපෑම අවම කිරීම; ආපදා අවස්ථාවලදී ජල අවශයතා සපුරාලීම සඳහා භූ ගත ජලය කළමනාකරණය කිරීම. | 1/1/2024 - 31/12/2024 | 2.00 | භාණ්ඩාගාර | උසෘරී ජවී; භෘක (ජාතික වශයේන් නිර්ණය කල දායකත්වය) ජල අංශය යටතත් 2.3 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | ශ්‍රී ලංකාවේ භූගත ජල මූලාශ්‍ර සහ එහි භාවිතා කරන්නන් පිළිබඳ සංඛ්‍යාන සමීක්ෂණය (GWSM) - රටේ භූගත ජල සම්පත් නියාමන ක්‍රියාවලිය සඳහා ශක්තිමත් කිරීමේ වැඩසටහන | රට තුළ භූගත ජල සම්පත් කළමනාකරණය සඳහා භූගත ජලය භාවිතා කරන්නන් සහ ඔවුන්ගේ අරමුණු පිළිබඳ විශ්ලේෂණය | භූගත ජල මූලාශ්‍ර පලදායි ලෙස භාවිතය සහ ජල ප්‍රමුඛතා හඳුනා ගනිමින් නියාමනය කිරීම | රටේ ජල අවශ්‍යතා සඳහා මතුපිට ජලය ඒකා-බද්ධව භාවිතා කිරීම සමඟ එහි තිරසාරභාවය සඳහා භූගත ජල සම්පත් කළමනාකරණය කිරීම | 1/1/2024 - 31/12/2024 | 1.50 | භාණ්ඩාගාර | NDC (ජාතික වශයෙන් නිර්ණය කල දායකත්වය) ජල අංශය යටතත් 2.3, NEAP(ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම - IWRM උපාය මාර්ග7.1, 7.2 |
| 8 | සේවකයින්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් | ආයතනයේ ප්‍රමුඛ අවශ්‍යතාවයන්ට අනුව මානවසම්පත් කුසලතා සංවර්ධනය | ආයතනික විෂය පථය ලබා දීම සඳහා ඵලදායී සහ කාර්යක්ෂම මෙහෙයුම් කළමනාකරණය | | 1/1/2024 - 31/12/2024 | 0.50 | | |

# විදුම් අංශය

**ප්‍රධාන කාර්යයන්**

- නල ළිං ඉදිකිරීම.
- නල ළිං පිරිසිදු කිරීම.
- නල ළිං අත්පොම්ප සවි කිරීම.
- නල ළිං පුනරුත්තාපනය සහ නඩත්තු කිරීමේ කටයුතු
- පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා නල ළිං ඉදිකිරීමේ කටයුතු

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ ජල අවශ්‍යවතාවය සඳහා විවිධ ප්‍රමාණ වල නල ළිං ඉදි කිරීම ප්‍රධාන කාර්ය භාරය වේ. විදුම් අංශය මඟින් නල ළිං විදුම් කටයුතු සිදු කරනු ලබන අතර ඒ සඳහා මෙහෙයුම් අංශය මඟින් ලබාදෙනු ලබන විදුම් කිරීම සඳහා අදාල නිර්දේශ අඩංගු ලිපිය මත නළ ලිං විදුම් සිදුකරනු ලබයි. (Job Order) ජල සම්පත් මණ්ඩලය මඟින් ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණවත් සහ නිපුන විදුම් කණ්ඩායමක් මෙන්ම ඒ සඳහා අවශ්‍ය) කරන විදුම් යන්ත්‍ර සහ උපකරණද පවතී. මඩ විදුම් සහ වායු විදුම් යන දෙවර්ගයම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ඕනෑම භූ විද්‍යාත්මක ස්ථරයන් යටතේ නල ළිං ඉදි කිරීමේ හැකියාව පවතී.

දැනට මෙම අංශය සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශය සතුව නල ළිං විදුම් පිළිබඳව මනා පුහුණුවකින් යුතු නිපුන විදුම් නිලධාරීන් 11 යටතේ ක්‍රියාත්මක වේ. ඉහත සඳහන් කරන ලද විදුම් අංශයේ කාර්ය භාරයන් අනුව 2022 වර්ෂය සඳහා පහත කාර්ය භාරය සිදුකර ඇත. (වගුව1)

**සොනික් විදුම්**

සොනික් විදුම් යනු නවීන විදුම් ක්‍රමවේදයකි. ඉහළ සංඛ්‍යාතයකින් හා චලනයන් සම්බන්ධ වී භ්‍රමනය සිදුවන විශේෂ විදුම් ක්‍රමයකි.

මෙම ක්‍රමය මඟින් පාංශු ස්ථර වල භූ විද්‍යාත්මක වශයෙන් විදුම් සඳහා යෙදෙන ද්‍රවන සහ අනෙකුත් ද්‍රව්‍ය මිශ්‍ර වීමකින් තොරව ලබා ගැනීමට ඇති හැකියාව පවතී.

මෙම විදුම් ක්‍රමය මඟින් නොබැදුනු පාංශු ස්ථරවල නියැදි මිශ්‍ර වීමෙන් තොරව අධ්‍යයනය කල හැකි වේ. නමුත් දැනට පවතින තාක්ෂණය අනුව සමහර අවස්ථාවලදී ගැඹුරු කලාපයන්ට යාමේ හැකියාවන් දැනට සීමාවී ඇත.

මෙම ක්‍රමය ජල සම්පත් මණ්ඩලය මඟින් මෑත කාලිනව ආරම්භ කරන ලද භූජල විමංශන අධ්‍යයන ව්‍යාපෘති මඟින් සිදු කරමින් පවතී.

## 2023 විදුම් අංශයේ වැඩ පිළිබද විස්තරය
## විදුම් අංශයේ ප්‍රගතිය - 2023
## නළ ළිං විදුම් කිරීම සහ ළිං පිරිසිදු කිරීම.

| මාසය | WASSIP ව්‍යාපෘතිය | EMUSE ව්‍යාපෘතිය | MA-OYA ව්‍යාපෘතිය | COMMERCIAL නළලින් ඉදිකිරීම් | නළලින් පිරිසිදු කිරීම් | නළලින් පුනරුත්ථාපනය | අත් පොම්ප අලුත්වැඩියා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 1 | _ | _ | 6 | _ | _ | _ | 7 |
| පෙබරවාරි | _ | _ | _ | 2 | _ | _ | _ | 2 |
| මාර්තු | _ | _ | _ | 5 | _ | _ | _ | 5 |
| අප්‍රේල් | _ | _ | _ | 5 | _ | _ | _ | 5 |
| මැයි | _ | _ | _ | 2 | 2 | _ | _ | 4 |
| ජූනි | _ | 1 | _ | 5 | 3 | _ | _ | 9 |
| ජූලි | _ | _ | _ | 5 | 6 | _ | _ | 11 |
| අගෝස්තු | _ | _ | 2 | 4 | 5 | _ | 1 | 12 |
| සැප්තැම්බර් | _ | _ | _ | 2 | 7 | _ | _ | 9 |
| ඔක්තෝබර් | _ | 1 | _ | 4 | 5 | _ | _ | 10 |
| නොවැම්බර් | _ | _ | _ | 5 | _ | _ | _ | 5 |
| දෙසැම්බර් | _ | _ | _ | 8 | _ | _ | _ | 8 |
| **එකතුව** | **1** | **2** | **2** | **53** | **28** | **0** | **1** | **87** |

| ස්ථානභාර නිලධාරියාගේ නම | ඉදි කරන ලද නළ ළිං ප්‍රමාණය | ඉදි කරන ලද අත් පොම්ප ප්‍රමාණය | පිරිසිදු කරන ලද ළිං ප්‍රමාණය | අලුත්වැඩියා කරන ලද අත් පොම්ප ප්‍රමාණය | ප්‍රතිසංස්කරණය කරන ලද ළිං |
|---|---|---|---|---|---|
| ඒ.එම්.සී.පී.බී. අලහකෝන් මහතා | 2 | _ | 13 | _ | _ |
| ජේ.පී.සී.සඳරුවන් මහතා | 3 | _ | 3 | 1 | _ |
| සී.බී.එස්.ගුණතිලක මහතා | 4 | _ | 1 | _ | _ |
| කේ.විජිතරන් මහතා | 8 | _ | 4 | _ | _ |
| ජේ.ජේ.එම්.පී.කේ.චන්ද්‍රසිරි මහතා | 25 | _ | 4 | _ | _ |
| ජී.ජී.ඩී.නයනජිත් මහතා | 8 | _ | 2 | _ | _ |
| පී.ඒ.අයි. බණ්ඩාර මහතා | 6 | _ | 1 | _ | _ |
| සී.කේ. වික්‍රමසිංහ | 2 | _ | _ | _ | _ |
| **එකතුව** | **58** | **0** | **28** | **1** | **0** |

# විදුම් ක්‍රියාකාරකම් 2023









## ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාරවල 2023 වසරේ වාර්ෂික ප්‍රගතිය

2023 වසරේදී ජල සම්පත් මණ්ඩලයට අයත් රසායනාගාර 4 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය) හි ජල සාම්පල විශ්ලේෂණය පිළිබඳ වාර්තාව පහත පරිදි වේ.

| | විශ්ලේෂණ වර්ගය | විශ්ලේෂණය කල ජල සාම්පල ගණන | ආදායම (රු.) |
|---|---|---|---|
| 1 | රසායනික විශ්ලේෂණ (සම්පූර්ණ විශ්ලේෂණ සහ පරාමිතීන් කීපයක්) (වාණිජ) | 321 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය) | |
| 2 | ක්ෂුද්‍රජීව විශ්ලේෂණය (වාණිජ) | 55 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය) | |
| 3 | රසායනික විශ්ලේෂණය (භාණ්ඩාගාර දීමනා යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති) | 1683 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය) | |
| 4 | බැර ලෝහ විශ්ලේෂණය (වාණිජ) | 50 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය) | |
| 5 | සමස්ථ ආදායම | භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හැර | **6,438,891.59** |

## ජල විශ්ලේෂණය පිළිබඳ විස්තරය

1. රසායනික හා ක්ෂුද්‍රජීව විශ්ලේෂණය
   2023 වසරේදී වාණිජ ජල සාම්පල සම්පූර්ණ සහ තෝරාගත් ජල පරාමිති, ක්ෂුද්‍රජීව හා බැර ලෝහ යන කාණ්ඩ යටතේ විශ්ලේෂණය කරන ලද අතර, ජල සම්පත් මණ්ඩලයේ වාණිජ ආදායම මිලියන 6.4 විය.



**රූපය 1:** ක්ෂුද්‍රජීව විශ්ලේෂණය රසායනාගාරය (පුත්තලම)

භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ 2023 වර්ෂයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති යටතේ ජල සාම්පල 1683 විශ්ලේෂණය කරන ලදි.

2. රසායනාගාරවල තත්ව සහතිකය පිළිබඳ විස්තරය (ISO 17025: 2017)
   ජල සම්පත් මණ්ඩලයේ අනුරාධපුර රසායනාගාරය විශ්ලේෂණ කටයුතු සඳහා වන ජාත්‍යන්තර තත්ව සහතිකය (ISO 17025: 2017) ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.



**රූපය 2:** රසායනික විශ්ලේෂණ සිදු කරන රසායනාගාරය (අනුරාධපුර)

3. බැර ලෝහ පරීක්ෂාව (ආසනික්, කැඩ්මියම්, ක්‍රෝමියම්, ලෙඩ්, මැංගනීස්, සෝඩියම්, පොටෑසියම්, සිනික්)
   බැර ලෝහ විශ්ලේෂණය සඳහා ව්‍යාපෘති සහ පුද්ගලික අංශ වලින් ජල සාම්පල ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාර වෙත ලැබේ.




**රූපය 3-1:** බැර ලෝහ විශ්ලේෂණය කිරීමේ උපකරණය (කොළඹ)



රූපය 3-2: බැර ලෝහ විශ්ලේෂණය කිරීමේ උපකරනය (අනුරාධපුර)

**ප්‍රධාන කාර්යාලය**

පාලන අංශය, මුදල් අංශය, සැපයුම් අංශය, භූජල අංශය, රසායනාගාරය, විදුම් අංශය, මෙහෙයුම් අංශය, විගණන අංශය, ප්‍රවාහන අංශය යන අංශයන්ගෙන් ප්‍රධාන කාර්යාලය සමන්විත වන අතර පුත්තලම, අනුරාධපුර, මොණරාගල හා යාපනය යනුවෙන් පළාත් කාර්යාල 4 කින් සමන්විත වේ.

**මුදල් අංශය**

සමාලෝචිත වසර තුළදී මුලු ආදායම රුපියල් මිලියන 2122 ක් විය. 2023 වර්ෂය වෙනුවෙන් පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබූ මුදල පිළිවෙලින් රුපියල් මිලියන 189 සහ රුපියල් මිලියන 14 කි. වර්ෂය සඳහා වාර්තාවූ අලාභය රුපියල් මිලියන 1383

**පාලන අංශය**

2023 වර්ෂයේ ජල සම්පත් මණ්ඩලයේ මුළු සේවක මණ්ඩලය 238 කි. මෙම වසරේදී ස්ථිර සේවකයින් බඳවා නොගන්නා ලදී. සේවකයින් 06 දෙනෙකු ඉල්ලා අස්වී ඇති අතර, සේවය අතහැරයාම් 01, සේවය අත්හිටුවීම් 01, සේවකයින් 12 දෙනෙකු විශ්‍රාම ගොස් ඇත.

**මානව සම්පත් සංවර්ධනය**

මුදල් නොමැති වීමෙන් පුහුණු පාඨමාලා සඳහා යොමු නොකරන ලදී.

මණ්ඩලයේ ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා සේවකයින් පුහුණු පාඨමාලා වෙත යොමු කිරීමට පියවර ගන්නා ලදී. විධායක ශ්‍රේණියේ නිලධාරීන් 02 කු ඇතුළු සේවකයින් කෙටි පුහුණුවකට යොමු කරන ලදී.

**ප්‍රවාහන ඇනිය**

සමාලෝචිත වසර තුළදී මණ්ඩලයේ ප්‍රවාහන ඇනිය වාහන හැත්තෑ හතරකින් (74) යුක්ත විය. මේවා අතරින් වාහන 58 ක් හොඳ තත්ත්වයේ පැවතිනි. ඒවා ප්‍රධාන වශයෙන් ද්විත්ව කාර්ය වාහන, මෝටර් රථ, ජීප්, ලොරි සහ බර ඔසවන යන්ත්‍ර වේ.

**භූජල අංශය**

ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබන්නේ භූජල අංශය මඟිනි.

**මෙහෙයුම් අංශය**

ජල සම්පත් මණ්ඩලයේ සියලුම මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන්නේ මෙහෙයුම් අංශය මඟිනි.

**සැපයුම් අංශය**

ජල සම්පත් මණ්ඩලයේ සියලුම භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් හා සැපයුම් කටයුතු වලට අදාල සියලුම ඉලක්ක සපුරා ගැනීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**පළාත් කාර්යාල**

ජල සම්පත් මණ්ඩලය පළාත් කාර්යාල 4 කින් සමන්විත වේ. (අනුරාධපුර, පුත්තලම, යාපනය සහ මොණරාගල) ප්‍රාදේශීය කාර්යාල මඟින් එම පළාතට අයත් රජයේ සහ පෞද්ගලික ආයතන වල භූගත ජලය උකහා ගැනීම සම්බන්ධ කටයුතු සිදු කිරීම, ජල සංරක්ෂණ කටයුතු සහ භූගත ජලය සම්බන්ධව වාර්තා ලබාදීම. අනුරාධපුර, පුත්තලම සහ යාපනය කාර්යාල තුළ රසායානාගාර පවත්වාගෙන යන අතර ජල සාම්පල රසායනික, ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබන අතර බැරලෝහ විශ්ලේෂණ කටයුතු අනුරාධපුර පළාත් කාර්යාලයෙන් පමණක් සිදු කරනු ලබයි.

**සංචාරක නිවාසය - අනුරාධපුරය**

මණ්ඩලයේ නිලධාරී මහතුන්ගේ හා වෙනත් රාජ්‍ය ආයතන වල නිලධාරීන්ගේ රාජකාරී හා පුද්ගලික කටයුතු වලදී නවාතැන් ගැනීම සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ මහත්ම මහත්මීන්ට සිය සංචාරක කටයුතු වලදී නැවතී විවේක ලබා ගැනීම සඳහාත් මෙම සංචාරක නිවාසය ප්‍රයෝජනයට ගැනේ.

**ස්තූතිය**

මණ්ඩලයේ කාර්ය ඉටු කිරීමේදී ඊට විශේෂ අනුග්‍රහය දැක්වූ ගරු ජල සම්පාදන අමාත්‍යතුමාට සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් එම අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරීන්ටද රජයේ වෙනත් දෙපාර්තමේන්තු රාජ්‍ය සේවා මණ්ඩල හා විදේශීය ආයතන වල විවිධ නිලධාරීන්ට හා උපදේශකයින්ට සිය ස්තූතිය සටහන්කොට තැබීම මණ්ඩලයට සතුටකි. ජල සම්පත් මණ්ඩලයට පක්ෂපාතීව සිය සේවාවන් ඉටු කිරීම ගැන ජල සම්පත් මණ්ඩලයේ සේවක මණ්ඩලයටද කෘතඥතාවය හිමිවේ.

**ආචාර්ය ජේ.ඩී.සමරසිංහ**
**සභාපති**
**ජල සම්පත් මණ්ඩලය**

# මූල්‍ය ප්‍රකාශන

**ජල සම්පත් මණ්ඩලය**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | | 2023 | | | | | 2023 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | | | | | රු. 000 | රු. 000 |
| | සටහන් අංක | සියළු අංශ | අංශ අංක 01 විදීම | අංශ අංක 02 ජල විද්‍යාව | අංශ අංක 03 පරීක්ෂණාගාරය | අංශ අංක 04 පොදු | සංශෝධිත අයවැය | සත්‍ය |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් වන ආදායම | 01 | 1,903,684 | 1,538,249 | 164,209 | 33,019 | 168,207 | 1,931,499 | 88,060 |
| භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | | 189,595 | 47,951 | 55,055 | 15,984 | 70,605 | 192,000 | 191,600 |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන (මෙහෙයුම්) | 02 | 14,158 | - | 14,158 | - | - | 20,000 | 6,904 |
| වෙනත් ආදායම් | 03 | 15,277 | - | 204 | - | 15,073 | 16,600 | 10,592 |
| **මුළු ආදායම** | | **2,122,714** | **1,586,200** | **233,626** | **49,003** | **253,885** | **2,160,099** | **297,156** |
| පරිපාලන වියදම් | 4.1 | (206,857) | (48,644) | (57,697) | (15,482) | (85,034) | (207,065) | (218,801) |
| සැපයුම් සහ අවශ්‍යතා | 4.2 | (41,215) | (15,405) | (3,817) | (3,308) | (18,685) | (41,800) | (42,019) |
| ගිවිසුම්ගත සේවාවන් සහ නඩත්තු වියදම් | 4.3 | (470,267) | (1,916) | (259) | (252) | (467,840) | (490,385) | (52,838) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 4.4 | (5,961) | (221) | (20) | (3) | (5,717) | (6,995) | (4,100) |
| වෙනත් ව්‍යාපෘති වියදම් | 4.5 | (802) | - | (802) | - | - | (7,850) | - |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන (පර්යේෂණ අධ්‍යයන) | 4.6 | (14,158) | - | (14,158) | - | - | (20,000) | (6,904) |
| **මුළු වියදම්** | | **(739,260)** | **(66,186)** | **(76,753)** | **(19,045)** | **(577,276)** | **(774,095)** | **(324,662)** |
| **මෙහෙයුම් වෙතින් වන අතිරික්තය/ (හිඟය)** | | **1,383,454** | **1,520,014** | **156,873** | **29,958** | **(323,391)** | **1,386,004** | **(27,506)** |
| **බදු** | | - | | | | | - | - |
| **කාල සීමාව සඳහා වන අතිරික්තය/ (හිඟය)** | | **1,383,454** | **1,520,014** | **156,873** | **29,958** | **(323,391)** | **1,386,004** | **(27,506)** |

**ජල සම්පත් මණ්ඩලය**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| 2023 දෙසැම්බර් 31 දිනට | සටහන අංක. | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 05 | 84,143 | 74,350 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 06 | 33,279 | 36,224 |
| භාණ්ඩ ලේඛන | 07 | 124,688 | 131,946 |
| පෙරගෙවීම් | 08 | 33 | 225 |
| | | **242,143** | **242,745** |
| **ජංගම නො වන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 09 | 1,429,584 | 1,824,502 |
| | | 1,429,584 | 1,824,502 |
| **මුළු වත්කම්** | | **1,671,727** | **2,067,247** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| වෙනත් ප්‍රතිපාදන සහ ගෙවිය යුතු දෑ | 10 | 7,062 | 11,605 |
| විලම්භිත ආදායම (සේවාවන් සඳහා අත්තිකාරම්) | 11 | 4,079 | 16,847 |
| | | 11,141 | 28,452 |
| **ජංගම නො වන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 12 | 56,129 | 60,783 |
| විලම්භිත ආදායම (රාජ්‍ය ප්‍රදාන සඳහා) | 13 | - | 1,796,809 |
| | | **56,129** | **1,857,592** |
| **මුළු බැරකම්** | | **67,270** | **1,886,044** |
| **ශුද්ධ වත්කම්** | | **1,604,457** | **181,203** |
| **ශුද්ධ වත්කම්/ සමකොටස්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| දායක ප්‍රාග්ධනය | 14 | 489,891 | 489,891 |
| සමුච්චිත ලාභය/ (හිගය) | 14 | 1,065,603 | (328,188) |
| ප්‍රත්‍යාගණන සංචිතය | 14 | 48,963 | 19,500 |
| **මුළු ශුද්ධ වත්කම්/ සමකොටස්** | | **1,604,457** | **181,203** |

**ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 06 සිට 20 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.**
මණ්ඩලයේ පවතින වාර්තා ප්‍රකාරව ඉහත මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ නිවැරදි බව අපි සහතික කරමු.

**සී. අබේසූරිය**
සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන සහ මූල්‍ය) - වැඩ බලන

**ටී.එච්.බී.ඒ. දේශප්‍රිය**
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය. මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබා ඇත

**ආචාර්ය ජේ.ඩී. සමරසිංහ**
සභාපති

**එල්.ඒ.වයි. දර්ශනී ද සිල්වා**
භාණ්ඩාගාර නියෝජිත

**ස්ටැනිස්ටර් යෝගරාජා පිල්ලෙයි**
මණ්ඩල අධ්‍යක්ෂ

2024 පෙබරවාරි 27

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## ශුද්ධ වත්කම්/ සමකොටස් පිළිබඳ ප්‍රකාශය

**සටහන් : 14**

| | දායක ප්‍රාග්ධනය රු. 000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. 000 | සමුච්ත ලාභ/අලාභ රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **වර්ෂය - 2022** | | | | |
| **2021 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය** | **489,891** | **19,500** | **(308,980)** | **200,411** |
| පසුගිය කාලයේ විශේෂ අවස්ථා සඳහා සිදු කරන ලද ගැළපීම් | - | - | - | - |
| අදාළ ශේෂය | 489,891 | 19,500 | (308,980) | 200,411 |
| කාල සීමාව සඳහා වන අතිරික්තය/ (හිඟය) | - | - | (27,506) | (27,506) |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | 8,298 | 8,298 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **489,891** | **19,500** | **(328,188)** | **181,203** |
| **වර්ෂය - 2023** | | | | |
| **2022 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය** | **489,891** | **19,500** | **(328,188)** | **181,203** |
| පසුගිය කාලයේ විශේෂ අවස්ථා සඳහා සිදු කරන ලද ගැළපීම් | - | - | 1,638 | 1,638 |
| අදාළ ශේෂය | 489,891 | 19,500 | (326,550) | 182,841 |
| කාල සීමාව සඳහා වන අතිරික්තය/ (හිඟය) | - | 29,463 | 1,383,454 | 1,412,917 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | 8,699 | 8,699 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **489,891** | **48,963** | **1,065,603** | **1,604,457** |

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් වන මුදල් ප්‍රවාහ** | | - |
| භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර අතිරික්තය/ (හිඟය) (පුනරාවර්තන) | 1,193,859 | (219,106) |
| එක් කළා: ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන( පුනරාවර්තන) | 189,595 | 191,600 |
| වසර සඳහා බදු පෙර අතිරික්තය/ (හිඟය) | **1,383,454** | **(27,506)** |
| ගැළපුම් විලම්භිත ආදායම | (1,796,809) | |
| අඩු කළා: පෙර වසරේ ගැළපීම් | - | - |
| | **(413,355)** | **(27,506)** |
| **මුදල් නොවන ගනුදෙනු** | | |
| ක්ෂය | 424,485 | 8,691 |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වැඩි වීම | 14,734 | 11,201 |
| ගෙවිය යුතු දෑ (අඩු වීම)/ වැඩි වීම | (17,264) | (17,433) |
| වෙනත් ජංගම වත්කම්වල (අඩු වීම) | 7,450 | 4,534 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය/ (අලාභය) | (4,963) | (638) |
| ලැබිය යුතු දෑ (අඩු වීම)/ වැඩි වීම | 2,945 | 3,819 |
| | **14,032** | **(17,332)** |
| පාරිතෝෂික සහ බැංකු ඉතුරුම් සඳහා ලැබුණු පොළිය | (6,232) | (7,046) |
| ගෙවූ බදු | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් වන ශුද්ධ මුදල් ප්‍රවාහ** | **7,800** | **(24,378)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් වන මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමන් ලද ඉපැයීම් | 4,963 | 637 |
| දේපළ, පිරියත සහ උපකරණ මිල දී ගැනීම | (107) | (1,896) |
| පාරිතෝෂික හා බැංකු ඉතුරුම් සඳහා ලැබුණු පොළිය | 6,232 | 7,046 |
| පාරිතෝෂික ගෙවීම | (9,095) | (1,541) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් වන ශුද්ධ මුදල් ප්‍රවාහ** | **1,993** | **4,246** |
| **මුලයන ක්‍රියාකාරකම් වෙතින් වන මුදල් ප්‍රවාහ** | | |
| රජයේ ප්‍රදාන ඍදේපළ, පිරියත සහ උපකරණ සඳහා ප්‍රාග්ධනය% | - | 494 |
| **මූලයන ක්‍රියාකාරකම් වෙතින් වන ශුද්ධ මුදල් ප්‍රවාහ** | **-** | **494** |
| **මුදල් හා මුදල් සමාන දෑවල වැඩි වීම/ (අඩු වීම)** | **9,793** | **(19,638)** |
| කාල සීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | **74,350** | **93,988** |
| කාල සීමාව අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | **84,143** | **74,350** |

◆ **මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්**

01 මුදල් සහ මුදල් සමාන දෑවලට බැංකු ශේෂයන් ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ඇතුළත් වන මුදල් සහ මුදල් සමාන දෑ පහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අඩංගු ප්‍රමාණවලින් සමන්විත වේ.

| | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|
| **බැංකුවල පවතින ජංගම ගිණුම් ශේෂයන්** | **60,753** | **56,299** |
| **ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි ඉතුරුම්** | **23,390** | **18,051** |
| | **84,143** | **74,350** |

02 මෙහෙයුම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රදානයෙන් (ප්‍රාග්ධනය) වන මුදල් ප්‍රවාහයන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් වන මුදල් ප්‍රවාහවල ඇතුළත් වේ.

## භාණ්ඩාගාර ප්‍රතිපාදන නිදහස් කිරීම් සැසඳුම - වසර 2023

**අනාවරණය කළ ප්‍රකාශය**

| | නිදහස් කිරීම් (රු.000') | භාණ්ඩාගාර මුද්‍රණය ප්‍රකාරව (රු.000') | වසර සඳහා ප්‍රතිපාදන (රු.000') |
|---|---|---|---|
| **01 පුනරාවර්ථන ප්‍රදාන** | | | |
| **වැය ශීර්ෂයː 166 - 01-02- 4-1503** | | | |
| මූල්‍ය කාර්යසාධනය | 177,595 | 177,595 | 180,000 |
| **වැය ශීර්ෂයː 166 - 01-02- 4-1509** | | | |
| මූල්‍ය කාර්යසාධනය | 12,000 | 12,000 | 12,000 |
| | **189,595** | **189,595** | **192,000** |
| **02 ප්‍රාග්ධන ප්‍රදාන** | | | |
| **වැය ශීර්ෂයː 166 - 01-02- 4-2201** | | | |
| මූල්‍ය කාර්යසාධනය - මෙහෙයුම් | | | |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 14,158 | 14,158 | 20,000 |
| | **14,158** | **14,158** | **20,000** |

## මූල්‍ය ප්‍රකාශන සටහන් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. ආයතනික තොරතුරු

**සාමාන්‍ය**

ජල සම්පත් මණ්ඩලය 1964 අංක 29 දරණ පනතේ විධිවිධාන යටතේ 1966 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. 2023 වර්ෂයේ දී එය ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවතිණි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය**

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලට භූ ජල විද්‍යා සමීක්ෂණ, නල ළිං ඉදිකිරීම, ජල සාම්පලවල රසායනික විශ්ලේෂණය, භූ ජල සිතියම් සකස් කිරීම සහ 2017 මාර්තු 16 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව ඇතැම් ක්‍රියාකාරකම් හෝ ව්‍යාපෘති සඳහා ස්වාභාවික ජල උල්පත් හෝ භූගත ජලය භාවිතය පිළිබඳ අධීක්ෂණය සහ මග පෙන්වීම ඇතුළත් වේ.

**අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

ලියාපදිංචි කළ කාර්යාලය සහ මණ්ඩලයේ ක්‍රියාකාරකම් සිදු කෙරෙන ප්‍රධාන ස්ථානයේ ලිපිනය

අංකඃ 488/ඒ, නාවල පාර, කොස්වත්ත, රාජගිරිය

### 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**2.1. අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ සහභාගීත්වය සහිතව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව විසින් සම්පාදනය කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**(යොමුවඃ අංක PED/03/2013 හා 02.10.2013 දිනැති චක්‍රලේඛය)**

**2.2. සකස් කිරීමේ පදනම**

ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබේ.

**2.3. භාවිත සහ වාර්තා කරන මුදල්**

මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලයේ භාවිත මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම් සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම දහස් ගණනට වටයා ඇත.

### 3. වත්කම් සහ ඒවායේ තක්සේරුවේ පදනම

**3.1 දේපළ, පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ මූලිකව වාර්තා කරනු ලබන්නේ පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් මතය. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය යනු මිල දී ගැනීම්/ප්‍රති තක්සේරු කිරීම හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ සඳහා වන ඕනෑම අමතර වියදමක් වේ.

**කල් බදු මත ඇති ඉඩම්වල පිහිටි ගොඩනැගිලි**

දේපළ, පිරියත හා උපකරණ යටතේ ස්වකීය අරමුදල් භාවිතා කර ඉදිකරන ලද ගොඩනැගිලි හෝ වසර 30 ක් සඳහා ජල සම්පත් මණ්ඩලය සතු ඉඩම සඳහා ලබා දී ඇති ගොඩනැගිලි ගණන් ගනු ලැබේ.

**3.2 ප්‍රත්‍යාගණන ආකෘතිය**

මූලික හඳුනා ගැනීම සඳහා මණ්ඩලය විසින් සමස්ත සින්නක්කර ඉඩම් කාණ්ඩය සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කර ගනු ලැබේ. සාධාරණ අගය සහ ධාරණ අගය අතර සැලකිය යුතු වෙනසක් ඇති විට හෝ මේවා ශුද්ධ පොත් ශේෂය තුළ ශුන්‍ය මට්ටමට පහළට පැමිණි විට අනෙකුත් සියළු වත්කම් පන්ති ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

වත්කම් බැහැර කරන විට එම වත්කම්වලට අදාළ ප්‍රත්‍යාගණන සංචිත රඳවා ගත් ඉපැයුම් වෙත මාරු කරනු ලැබේ.

2023 වර්ෂයේදී පුත්තලම, මොණරාගල සහ අනුරාධපුර පළාත් කාර්යාල වල වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට හා ක්ෂය කිරීමට කටයුතු කරන ලද අතර එහි ප්‍රතයාගනිත වටිනාකම රු.29,462,603.09කි.

### 3.3 ක්ෂය වීම

වත්කමක් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතා කිරීමට පවතින විට වන අතර එය තවදුරටත් වත්කමක් ලෙස හඳුනා නොගන්නා දින වන විට ක්ෂය වීම අවසන් වේ.

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ අදාළ වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය මත සෘජු රේඛීය පදනමක් මත දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය / ප්‍රත්‍යාගණනය කපා හැරීම සඳහා ය. මේ සඳහා භාවිතා කරන ප්‍රධාන වාර්ෂික අනුපාත පහත පරිදි වේ;

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| මෝටර් වාහන | 25% |
| යන්ත්‍ර | 20% |
| රසායනාගාර උපකරණ | 20% |
| විද්‍යාත්මක උපකරණ | 20% |
| පරිගණක සහ උපාංග | 20% |
| ගෘහ භාණ්ඩ, උපාංග හා කාර්යාල උපකරණ | 10% |

### 3.4 රජයේ ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 අනුව භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ රාජ්‍ය ව්‍යාපෘතිවලින් ප්‍රදාන ලෙස ලැබෙන වත්කම් පිළිගනු ලැබේ.

### 3.5 තොග

වාහන අමතර කොටස්, ගබඩා ද්‍රව්‍ය, යන්ත්‍ර අමතර කොටස්, ඉන්ධන සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් තොග සමන්විත වේ. තොගවල පිරිවැය ප්‍රථමයෙන් ලැබූ ප්‍රථමයෙන් නිදහස් කළ මූලධර්මය මත පදනම් වේ.

### 3.6 ලැබිය යුතු දෑ

#### 3.6.1 ලැබිය යුතු දෑ වලින් ලැ බෙන ඇස්තමේන්තුගත මුදලින් ඒවා ප්‍රකාශ කර ඇත.

#### 3.6.2 බොල් ණය සහ අඩමාන ණය

මෙම ණයවලට අදාළව ඇස්තමේන්තුගත පාඩු බොල් සහ අඩමාන ණය ලෙස හඳුනාගෙන ඇති සියළු ම ඉන්වොයිසි සහ හිමිකම් පෑම් අඛණ්ඩව සමාලෝචනය කිරීම මත පදනම් වී ඇත.

### 4. ගෙවිය යුතු ගිණුම් සහ උපචිත වියදම්

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ පිරිවැයට සඳහන් කර ඇත.

### 4.1 විලම්භිත ආදායම

සැපයිය යුතු සේවාවන් සඳහා ලැබුණු අත්තිකාරම්, ආදායම හඳුනා ගන්නා තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ විලම්භිත ආදායම ලෙස පෙන්වා ඇත.

### 4.2 ප්‍රතිපාදන

3.4 අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනය වෙත දැනට වගකීමක් (නෛතික හෝ සාධනීය) පැවරී ඇති විට ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තු කිරීමක් සිදු කළ හැකිය. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම ඕනෑම ප්‍රතිපූරණයක මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

### 5. ආදායම හඳුනා ගැනීම

ජල සම්පත් මණ්ඩලය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට ආදායම හඳුනාගෙන ඇති අතර ගෙවීම සිදු කරන්නේ කවදාද යන්න නොසලකා ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

#### ප්‍රධාන ආදායම් මූලාශ්‍ර

භූ ජල විද්‍යා සමීක්ෂණ, නල ළිං ඉදිකිරීම, පොම්ප කිරීමේ පරීක්ෂණ, ජල සාම්පල විශ්ලේෂණය සහ යෝග්‍යතා සහතික ආදායම ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වේ. මෙම මූලාශ්‍ර වෙතින් වන ආදායම් උපලබ්ධි වන අවස්ථාවේ හඳුනා ගනු ලැබේ.

#### වෙනත් ආදායම්

වෙනත් ආදායම් සංචාරක බංගලා වෙන්කිරීම්, දඩ සහ අධිභාර, විවිධ ආදායම්, බැහැර කිරීමෙන් ලද

ආදායම, සූර්ය බලශක්ති ආදායම, කුලී ආදායම යනාදියෙන් සමන්විත වන අතර ඒවා උපචිත පදනම මත පිළිගනු ලැබේ.

**පොලී ආදායම**

පොලී ආදායම ප්‍රධාන වශයෙන් උපයාගනු ලබන්නේ ආපදා ණය සඳහා වන පොලී, පාරිතෝෂිත ගෙවීම් සඳහා පවත්වාගෙන යනු ලබන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු සඳහා වන පොලිය සහ ලංකා බැංකුවේ අරමුදල් කළමනාකරණ ගිණුමේ පොලිය මගිනි.

## 6. සේවක ප්‍රතිලාභ

### 6.1 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම

1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමට ජල සම්පත් මණ්ඩලය බැඳී සිටියි. අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති වගකීම යනු සේවකයින් සම්බන්ධයෙන් වාර්තා කරන දිනට අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 මගින් නිර්දේශ කර ඇති පරිදි, ආයුගණකවරයෙකු, එනම් Actuarial & Management Consultants පුද්ගලික සමාගම විසින් ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් වාර්තා කරන දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව ගණනය කරනු ලැබේ.

සෑම වසරකම එවැනි ආයුගණක ඇගයීම් සිදු කරනු ඇත. සේවකයෙකු හට ඇති වගකීම ඇති වන්නේ ඔහු/ ඇය බඳවා ගත් දින සිටයි.

ජල සම්පත් මණ්ඩලය විසින් පාරිතෝෂිතයේ පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය මනිනු ලබන්නේ ආයුගණක ඇගයුම් ක්‍රමය භාවිතා කිරීමෙනි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 19, සේවක ප්‍රතිලාභ 01.01.2018 දින සිට බලාත්මක වේ. දිගුකාලීන වත්කම්

බැරකම සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. ජල සම්පත් මණ්ඩලයේ නිශ්චිත ප්‍රතිලාභ බැඳිවාව සඳහා අරමුදල් සැපයීමට මණ්ඩලය විසින් ජාතික ඉතිරි කිරීම් බැංකුවේ වෙනම ඉතුරුම් ගිණුමක් පවත්වා ගෙන යනු ලැබේ.

### 6.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

අදාළ ව්‍යවස්ථාවන් සහ රෙගුලාසිවලට අනුකූව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදලට දායක වීමට සහ සේවක භාරකාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබති. මණ්ඩලය විසින් සේවකයන්ගේ පුද්ගලික වැටුපෙන් පිළිවෙළින් 12%ක් සහ 3% ක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල වෙත දායක කරනු ලැබේ.

## 7. බදුකරණය

බදු වියදම වත්මන් බද්දෙන් ද පෙර වසරවලට අදාළව ගෙවිය යුතු බදු ගැළපුමක් වේ නම් එයින් ද සමන්විත වේ.

## 8. පර්යේෂණ අධ්‍යයන වියදම්

භාණ්ඩාගාර ප්‍රදාන පිරිවැය වැය ශීර්ෂය යටතේ සෘජුව පර්යේෂණ අධ්‍යයන ලෙස හඳුනා ගෙන ඇති මෙහෙයුම් වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

**9.** අධ්‍යක්ෂගේ වැටුප වන රු. 1,765,908.50/- අංක 4.1 සටහන: වැටුප් සහ වියදම් ගිණුමට ඇතුළත් කර ඇත.

| | |
|---|---|
| මාසික දීමනාව | 15,82,908.50 |
| මණ්ඩල රැස්වීම සඳහා සහභාගි වීමේ දීමනාව | 1,38,000.00 |
| ගමන් වියදම් | 45,000.00 |
| **එකතුව** | **17,65,908.50** |

## 10. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 පරිදි වක්‍ර ක්‍රමය භාවිතා කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලබන අතර එමගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම්

සහ ආයෝජන ක්‍රියාකාරකම්වලට අදාළ දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත.

මුදල් හා මුදල් සමාන දෑ ප්‍රධාන වශයෙන් බැංකුවල පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ.

### 11. වාර්තා කරන කාල සීමාවෙන් පසු හට ගන්නා සිදුවීම්

වාර්තා කරන කාල සීමාවෙන් පසුව හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයේ අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් සිදු කර ඇත.

### 12. විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘති

**භූජල නිරීක්ෂණ ජාලයක් ස්ථාපිත කිරීම - මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ධාර සඳහා වන නියමු ව්‍යාපෘතිය**

ව්‍යාපෘතිය මගින් මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ධාර ආවරණය කෙරෙන අතර පුත්තලම සහ යාපනය අර්ධද්වීපය යන නව නියමු ප්‍රදේශ එක් කිරීමත් සමග නිරීක්ෂණ ස්ථාන සංඛ්‍යාව 190 ක් දක්වා ඉහළ ගියේය.

භූගත ජල මට්ටම, විදුලි සන්නායකතාවය සහ උෂ්ණත්වය මෙම ස්වයංක්‍රීය පද්ධති මගින් නිරීක්ෂණය කරන මූලික පරාමිතීන් වේ. මීට අමතරව, භූගත ජලයෙහි බැර ලෝහ සාන්ද්‍රණය වරින් වර තක්සේරු කරනු ලැබේ. (අ) භූගත ජල මට්ටම (ආ) ජලයේ ගුණාත්මක බව පිළිබඳ තත්‍ය කාලීන දත්ත රැස් කිරීමට ශ්‍රී ලංකාව සඳහා ජාතික භූ ජල අධීක්ෂණ ජාලය පිහිටුවීම සඳහා විකල්ප පියවරක් ලෙස ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

මධ්‍යගත දත්ත කළමනාකරණ මධ්‍යස්ථානයක් කොළඹ පිහිටුවීමට නියමිතය. භූගත ජලය භාවිතා කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වන අදහස් වෙනස් කිරීමට බිම් මට්ටමින් ප්‍රජා ව දැනුවත් කිරීම සිදු කළ යුතු වේ. මෙම නියමු ව්‍යාපෘතියේ මුළු පිරිවැය යුරෝ මිලියන 20.63 ක් වන අතර එය නෙදර්ලන්තයේ රබෝ බැංකුවෙන් මෘදු ණයක් ලෙස ලබා දෙනු ලැබේ. අදාළ ක්‍රියාකාරකම් 2018 මාර්තු මාසයේදී ආරම්භ කර 2022 දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී. ව්‍යාපෘතිය නෙදර්ලන්තයේ “Royal Eijkelcamp” යන කොන්ත්‍රාත්කරු විසින් කාර්ය නිෂ්ඨාපර ව්‍යාපෘතියක් ලෙස මෙහෙයවන ලද අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘති ගිවිසුම අමාත්‍යංශය සහ කොන්ත්‍රාත්කරු වන නෙදර්ලන්තයේ “Royal Eijkelcamp” අතර අත්සන් තබන ලදී. ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මත පදනම්ව කාර්ය සැලැස්ම අනුව කාර්තුමය පදනමින් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ගෙවීම් නිර්දේශ කරන ලදී. ව්‍යාපෘති ප්‍රගතිය අනුව 2022 දෙසැම්බර් වන විට ගෙවීම් සම්පූර්ණ කරන ලදී. ව්‍යාපෘති මෙහෙයුම්වලදී (2018-2022) භාවිතා කරන ලද ස්ථාවර වත්කම් ජල සම්පත් මණ්ඩලය වෙත මාරු කරන ලද අතර පාරිභෝගික භාණ්ඩ සහ සංවර්ධන කටයුතු පිළිබඳ තොරතුරු වසර අවසානයේදී ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොමැත. වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම ව්‍යාපෘතියේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ප්‍රත්‍යාගණන කමිටුවක් පත් කරන ලද අතර ව්‍යාපෘති වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් කමිටුව කටයුතු කරමින් සිටියි. මෙම පෙර ව්‍යාපෘති වත්කම් 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 ප්‍රකාරව ගිණුම්ගත කර ඇත.

ගංගා ද්‍රෝණි තුන තුළ විභව අධීක්ෂණ ස්ථාන හඳුනා ගැනීම අවසන් කර ඇත.

මේ වන විට මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ද්‍රෝණිවල නිරීක්ෂණ ළිං ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. මීට අමතරව, පුත්තලම ප්‍රදේශයේ ළිං කැණීමේ කටයුතු ද සිදුවෙමින් පවතී. ජල සම්පත් මණ්ඩලය විසින් දැනටමත් ඉදිකර ඇති දැනට පවතින නිරීක්ෂණ ළිං යාපනය අර්ධද්වීපයේ ස්වයංක්‍රීය නිරීක්ෂණ ළිං (40 ක්) ලෙස සංවර්ධනය කිරීමට කටයුතු යොදා ඇත. මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණිවල ස්වයංක්‍රීය සංවේදක පද්ධති 121ක් සවිකිරීම අවසන් කර ඇත. සමතුලිත අධීක්ෂණ පද්ධති සහ මධ්‍යගත දත්ත මධ්‍යස්ථානය 2022 දෙසැම්බර් වන විට ස්ථාපනය කර අවසන් කිරීමට නියමිතය.

**ජල සම්පත් මණ්ඩලය**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | 2023 | | | | | 2023 | 2022 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | | | | | රු. 000 | රු. 000 |
| | **සියළු අංශ** | **අංශ අංක 01 විදුම් අංශය** | **අංශ අංක 02 භූජල අංශය** | **අංශ අංක 03 විද්‍යාගාර අංශය** | **අංශ අංක 04 පොදු අංශය** | **සංශෝධිත අයවැය** | **සත්‍ය** |
| **සටහන් අංකඃ 01** | | | | | | | |
| ජලඃ විමර්ශන / ගවේෂණ | | | | | | | |
| භූ ජල විද්‍යා සමීක්ෂණ | 15,932 | - | 15,932 | - | - | 20,000 | 16,077 |
| නළ ළිං ඉදිකිරීම් | 44,836 | 44,836 | - | - | - | 50,000 | 36,308 |
| ජල ධාරිතා පරීක්ෂණ | 31,283 | - | 31,283 | - | - | 37,500 | 26,146 |
| නළ ළිං පිරිසිදු කිරීම | 3,424 | 3,424 | - | - | - | 6,000 | 1,091 |
| ජල සාම්පල් විශ්ලේෂණය | 6,439 | - | - | 6,439 | - | 7,200 | 4,284 |
| **අනු එකතුව** | **101,914** | **48,260** | **47,215** | **6,439** | **-** | **120,700** | **83,906** |
| **භූ ජල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම** | | | | | | | |
| විදුම් යන්ත්‍ර ලියාපදිංචි කිරීම | 2,975 | 2,975 | - | - | - | 4,000 | 3,218 |
| බාහිර භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කිරීම | 385 | - | 385 | - | - | 625 | 329 |
| භූ ජල විද්‍යා වාර්තා ආදායම | 532 | - | 532 | - | - | 900 | 574 |
| ජල මනු සවි කිරීමේ ආදායම | 43 | - | 43 | - | - | 90 | 33 |
| ජල මනු පරීක්ෂා කිරීමේ ආදායම | - | - | - | - | - | 150 | - |
| බාහිර විදුම්කරුවන් පුහුණු කිරීම | - | - | - | - | - | 375 | - |
| **මුළු එකතුව** | **3,935** | **2,975** | **960** | **-** | **-** | **6,140** | **4,154** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **භූජල සංවර්ධනය** | | | | | | | |
| භූජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම " | 141 | - | 141 | - | - | 3,850 | - |
| භූජල සම්පත් මත කළමනාකරණ ජලධර ප්‍රති ආරෝපණ | | | | | | | |
| පද්ධතිය ක්‍රියාත්මක කිරීම | 885 | - | 885 | - | - | 4,000 | - |
| වෙනත් ව්‍යාපෘති ආදායම - වේලි ආරක්ෂණ සහ ජල සම්පත් | | | | | | | |
| සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය ආදිය (විලම්භිත ආදායම)= | 1,796,809 | 1,487,014 | 115,008 | 26,580 | 168,207 | 1,796,809 | - |
| **අනු එකතුව** | **1,797,835** | **1,487,014** | **116,034** | **26,580** | **168,207** | **1,804,659** | **-** |
| **මුළු එකතුව** | **1,903,684** | **1,538,249** | **164,209** | **33,019** | **168,207** | **1,931,499** | **88,060** |

**සටහන් අංකː 02**

**භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (පර්යේෂණ අධ්‍යයන - මෙහෙයුම්) | | | | | | | |
| වඩාත් සංවේදී භූමි ප්‍රදේශවල දිගුකාලීන භූජල නිරීක්ෂණය | 3,340 | - | 3,340 | - | - | 4,000 | 3,000 |
| දේශගුණික විපර්යාසවල ඍජු හා වක්‍ර බලපෑම් පිළිබඳ අධ්‍යයනය | 966 | - | 966 | - | - | 1,500 | 322 |
| භූජලය ප්‍රමාණය අඩු වීම සහ දූෂණය සම්බන්ධ පරීක්ෂණ | 884 | - | 884 | - | - | 1,500 | 254 |
| විද්‍යාත්මක සහ අනෙකුත් ප්‍රාග්ධන කටයුතු වැඩිදියුණු කිරීම | - | - | - | - | - | - | 378 |
| ස්වභාවික උල්පත් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය - මාඔය | 916 | - | 916 | - | - | 1,400 | 839 |
| පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ කටයුතුවලට අදාළ වියදම් | 3,640 | - | 3,640 | - | - | 4,000 | 1,313 |
| ශ්‍රී ලංකාව සඳහා භූ ජල සිතියම් සංවර්ධනය | 20 | - | 20 | - | - | 600 | 62 |
| ජල අංශයට සම්බන්ධ ආපදා සඳහා හදිසි භාවිතය | 2,729 | - | 2,729 | - | - | 3,000 | 347 |
| සේවක පුහුණුව | - | - | - | - | - | - | 389 |
| භූජල සංවර්ධනය සහ කළමනාකරණය | | | | | | | |
| ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සම්පත් | 1,663 | - | 1,663 | - | - | 4,000 | - |
| **මුළු එකතුව** | **14,158** | **-** | **14,158** | **-** | **-** | **20,000** | **6,904** |

**සටහන් අංකඃ 03**

**වෙනත් ආදායම්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "සංචාරක බංගලා වෙන්කරවා ගැනීම" | 267 | - | - | - | 267 | 350 | 190 |
| දඩ සහ අධිභාර | 23 | - | - | - | 23 | 50 | 302 |
| බැහැර කිරීමෙන් ලද ආදායම | 4,882 | - | - | - | 4,882 | 5,000 | 73 |
| ණය සහ බැංකු තැන්පතු මත පොලී | 6,232 | - | - | - | 6,232 | 6,500 | 7,045 |
| කාර්ය මණ්ඩල නවාතැන් වෙතින් වන ආදායම | 229 | - | - | - | 229 | 400 | 89 |
| දත්ත සැපයීම | 204 | - | 204 | - | - | 300 | 1,764 |
| විවිධ ආදායම් | 982 | - | - | - | 982 | 1,000 | 1,129 |
| සූර්ය බලශක්ති ආදායම | 100 | - | - | - | 100 | 600 | - |
| ඉඩම් කුලී ආදායම | 2,358 | - | - | - | 2,358 | 2,400 | - |
| **මුළු එකතුව** | **15,277** | **-** | **204** | **-** | **15,073** | **16,600** | **10,592** |

**සටහන් අංකඃ 4.1**

**පරිපාලන වියදම්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වැටුප් සහ වේතන | 158,600 | 40,985 | 47,074 | 13,662 | 56,879 | 161,000 | 172,623 |
| අර්ථ දැක්වූ දායක සැලැස්ම (පිරිවැය - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල) | 19,169 | 5,175 | 5,943 | 1,725 | 6,326 | 20,000 | 20,826 |
| අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - විශ්‍රාම පාරිතෝෂිතය | 14,734 | - | - | - | 14,734 | 11,400 | 11,201 |
| අතිකාල සහ නිවාඩු ගෙවීම | 4,965 | 133 | 1,378 | 67 | 3,387 | 5,200 | 6,633 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 183 | - | - | - | 183 | 220 | 227 |
| වෙනත් දීමනා | 363 | - | - | - | 363 | 400 | 113 |
| ගමන් වියදම් - දේශීය | 1,651 | 100 | 752 | 13 | 786 | 1,800 | 5,092 |
| කාර්ය මණ්ඩල පැකේජ වියදම් | 4,746 | 2,217 | 2,529 | - | - | 4,500 | - |
| ගමන් වියදම් - විදේශීය | 50 | - | - | - | 50 | 50 | - |
| සුභසාධන සහ ක්‍රීඩා පහසුකම් | 230 | - | - | - | 230 | 250 | 195 |
| වෛද්‍ය යෝජනා ක්‍රමය | 685 | - | - | - | 685 | 725 | 752 |
| විනෝදාස්වාදය | 1,216 | 34 | 21 | 15 | 1,146 | 1,250 | 1,035 |
| විශ්‍රාම පූර්ව නිවා ඩු සඳහා ගෙවීම් | 14 | - | - | - | 14 | 15 | 104 |
| කාර්ය මණ්ඩල රක්ෂණය | 251 | - | - | - | 251 | 255 | - |
| **මුළු එකතුව** | **206,857** | **48,644** | **57,697** | **15,482** | **85,034** | **207,065** | **218,801** |

**සටහන් අංකඃ 4.2**

**සැපයුම් සහ අවශ්‍යතා**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 28,678 | 10,094 | 3,633 | - | 14,951 | 29,000 | 28,688 |
| විදුලි වැඩ සඳහා වන පරිභෝජන භාණ්ඩ | 8,766 | 5,266 | - | - | 3,500 | 7,300 | 9,817 |
| රසායනාගාර සඳහා වන පරිභෝජන භාණ්ඩ සහ වෙනත් | 3,308 | - | - | 3,308 | - | 5,000 | 3,420 |
| වෙනත් පරිභෝජන භාණ්ඩ | 463 | 45 | 184 | - | 234 | 500 | 94 |
| **මුළු එකතුව** | **41,215** | **15,405** | **3,817** | **3,308** | **18,685** | **41,800** | **42,019** |

**සටහන් අංකඃ 4.3**

**ගිවිසුම්ගත සේවාවන් සහ නඩත්තු වියදම්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැපැල් සහ විදුලි සංදේශ | 1,922 | 6 | 24 | 6 | 1,886 | 2,100 | 1,906 |
| විදුලිය | 6,949 | - | - | 172 | 6,777 | 6,600 | 3,076 |
| ගොඩනැගිලි කුලිය සහ කල්බදු | 15,755 | - | - | - | 15,755 | 18,000 | 17,186 |
| වරිපනම් සහ බදු | 454 | - | - | - | 454 | 500 | 747 |
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 12 | - | - | - | 12 | 15 | 12 |
| විගණන ගාස්තු | 470 | - | - | - | 470 | 470 | 458 |
| මුද්‍රණ වියදම් | 35 | - | - | - | 35 | 350 | 1,111 |
| වැඩමුළුව සහ සම්මන්ත්‍රණ | 147 | - | - | - | 147 | 150 | 194 |
| ජල බිල්පත් | 721 | - | - | - | 721 | 850 | 642 |
| නවාතැන් වියදම් | 234 | 142 | 70 | - | 22 | 250 | 333 |
| උපදේශන ගාස්තු | 454 | - | - | - | 454 | 400 | 968 |
| විවිධ වියදම් | 1,001 | 191 | 19 | 5 | 786 | 1,000 | 1,446 |
| මෝටර් රථ නඩත්තු කිරීම | 6,290 | 131 | 10 | - | 6,149 | 7,000 | 5,705 |
| යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | 5,738 | 1,381 | 12 | - | 4,345 | 3,000 | 5,227 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 3,941 | 45 | 100 | 38 | 3,758 | 3,600 | 4,007 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 1,659 | 20 | 24 | 31 | 1,584 | 1,100 | 1,129 |
| ක්ෂය වීම | 424,485 | - | - | - | 424,485 | 445,000 | 8,691 |
| **මුළු එකතුව** | **470,267** | **1,916** | **259** | **252** | **467,840** | **490,385** | **52,838** |

**සටහන් අංකය: 4.4**

**වෙනත් මෙහෙයුම් වියදම්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 1,249 | 4 | 15 | 3 | 1,227 | 1,400 | 1,009 |
| නිල ඇඳුම් | 894 | 217 | - | - | 677 | 1,000 | 169 |
| වාර සඟරා සහ පුවත්පත් | 1 | - | - | - | 1 | 10 | 14 |
| ප්‍රචාරණය සහ වෙළඳ ප්‍රචාරණ වියදම් | 541 | - | - | - | 541 | 600 | 549 |
| බැංකු ගාස්තු | 182 | - | - | - | 182 | 155 | 151 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 5 | - | - | - | 5 | 7 | 166 |
| නීතිමය වියදම් | 101 | - | - | - | 101 | 300 | 239 |
| මුද්දර ගාස්තු | 14 | - | - | - | 14 | 300 | 282 |
| වාහන සේවා අංශය - රත්මලාන | 158 | - | - | - | 158 | 200 | 45 |
| කුලියට ගැනීමේ ගාස්තු | 3 | - | 3 | - | - | 8 | 41 |
| දඩ සහ අධිභාර | - | - | - | - | - | 10 | 10 |
| මෙහෙයුම් කල්බදු කුලී | - | - | - | - | - | - | 1,425 |
| දත්ත එකතු කිරීමේ වියදම් | 2 | - | 2 | - | - | 5 | - |
| සමාජ ආරක්ෂණ දායක බද්ද | 2,811 | - | - | - | 2,811 | 3,000 | - |
| **මුළු එකතුව** | **5,961** | **221** | **20** | **3** | **5,717** | **6,995** | **4,100** |

**සටහන් අංකය: 4.5**

**වෙනත් ව්‍යාපෘති වියදම්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| භූජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම | 141 | - | 141 | - | - | 3,850 | - |
| භූජල සම්පත් මත කළමනාකරණ ජලධර ප්‍රති ආරෝපණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම | 661 | - | 661 | - | - | 4,000 | - |
| **මුළු එකතුව** | **802** | **-** | **802** | **-** | **-** | **7,850** | **-** |

**සටහන් අංකඃ 4.6**

**භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන**

(පර්යේෂණ අධ්‍යයන - මෙහෙයුම්)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වඩාත් සංවේදී භූමි ප්‍රදේශවල දිගුකාලීන භූජල නිරීක්ෂණය | 3,340 | - | 3,340 | - | - | 4,000 | 3,000 |
| දේශගුණික විපර්යාසවල සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳ අධ්‍යයනය | 966 | - | 966 | - | - | 1,500 | 322 |
| භූජලය ප්‍රමාණය අඩු වීම සහ දූෂණය සම්බන්ධ පරීක්ෂණ | 884 | - | 884 | - | - | 1,500 | 254 |
| විද්‍යාත්මක සහ අනෙකුත් ප්‍රාග්ධන කටයුතු වැඩිදියුණු කිරීම | - | - | - | - | - | - | 378 |
| ස්වභාවික උල්පත් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය - මාඔය | 916 | - | 916 | - | - | 1,400 | 839 |
| පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ කටයුතුවලට අදාළ වියදම් | 3,640 | - | 3,640 | - | - | 4,000 | 1,313 |
| ශ්‍රී ලංකාව සඳහා භූ ජල සිතියම් සංවර්ධනය | 20 | - | 20 | - | - | 600 | 62 |
| ජල අංශයට සම්බන්ධ ආපදා සඳහා හදිසි භාවිතය | 2,729 | - | 2,729 | - | - | 3,000 | 347 |
| සේවක පුහුණුව | - | - | - | - | - | - | 389 |
| භූජල සංවර්ධනය සහ කළමනාකරණය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සම්පත් | 1,663 | - | 1,663 | - | - | 4,000 | - |
| **මුළු එකතුව** | **14,158** | **-** | **14,158** | **-** | **-** | **20,000** | **6,904** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්**

| | සත්‍ය 2023 රු.000 | 2022 රු.000 |
|---|---|---|
| **සටහන් අංක : 05** | | |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ( 1 ) ලංකා බැංකු යෝර්ක් වීදියේ ශාඛාව (0002026295) | 27 | 245 |
| ( 2 ) ලංකා බැංකු ටොරින්ටන් ශාඛාව (0002323267) | 59,927 | 55,818 |
| ( 3 ) ලංකා බැංකු ටොරින්ටන් ශාඛාව (0002323268) | 663 | 17 |
| ( 4 ) ලංකා බැංකු ටොරින්ටන් ශාඛාව (0005342839) | 136 | 219 |
| **උප එකතුව** | **60,753** | **56,299** |
| **සේවක ප්‍රතිලාභ - සැලසුම සඳහා දායක කළ වත්කම්** | | |
| ( 5 ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බම්බලපිටිය ශාඛාව (100230211818) | 23,390 | 18,051 |
| **මුළු එකතුව** | **84,143** | **74,350** |

**සටහන - අරමුදල් කළමණාකරන ගිණුම**

ජංගම ගිණුමේ දැනට පවතින අරමුදල් සඳහා පොළියක් උපයා ගැනීම සඳහා මණ්ඩලය (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 1203) විසින් 2018.09.07 දින ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ 0002323267 දරන ජංගම ගිණුමට ආශ්‍රිතව අරමුදල් කළමනාකරණ ගිණුමක් (ගිණුම් අංක 1203) විවෘත කර ඇත. A165

| | 2023 රු.000 | 2022 රු.000 |
|---|---|---|
| **සටහන් අංක : 06** | | |
| **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| **කාර්ය මණ්ඩලය** | | |
| (01) ආපදා ණය | 25,199 | 23,869 |
| (02) උත්සව අත්තිකාරම් | 25 | 11 |
| **අනු එකතුව** | **25,210** | **23,894** |
| **වෙනත්** | | |
| (03) වෙළඳ | 4,368 | 5,027 |
| (04) සැපයුම්කරුවන් වෙත ලබා දුන් අත්තිකාරම් | - | 185 |
| (05) රඳවා ගත් ලැබිය යුතු දෑ | 1,978 | 3,956 |
| (06) වැට් ලැබිය යුතු දෑ (ආපසු ලබා දුන් මුදල්) | - | 1,263 |
| (07) වෙනත් ණයකරුවන් | 250 | - |
| (08) කාර්ය මණ්ඩලය ණයකරුවන් | 80 | - |
| (09) ලැබිය යුතු රඳවා ගැනීමේ බද්ද | 393 | - |
| (10) වෙනත් ලැබිය යුතු දෑ | 1,000 | 1,899 |
| **අනු එකතුව** | **8,069** | **12,330** |
| **ලැබිය යුතු දෑ එකතුව** | **33,279** | **36,224** |

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | 2023<br>රු.000 | 2022<br>රු.000 |
|---|---|---|
| **සටහන් අංක : 07** | | |
| **භාණ්ඩ ලේඛන** | | |
| **අමුද්‍රව්‍ය හා අමතර කොටස්** | | |
| වාහන අමතර කොටස් | 2,550 | 3,182 |
| වාහන අමතර කොටස් (වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය) | 1,924 | 1,964 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,189 | 1,237 |
| භූ ජල පාරිභෝගික භාණ්ඩ | 23,879 | 28,114 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 539 | 783 |
| ලිපි ද්‍රව්‍ය | 238 | 296 |
| යන්ත්‍රෝපකරණ අමතර කොටස් (2 KR සහිත) | 54,618 | 56,319 |
| යන්ත්‍රෝපකරණ අමතර කොටස් (වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය) | 35,040 | 35,942 |
| යන්ත්‍රෝපකරණ අමතර කොටස් (අමාත්‍යංශය) | 2,113 | 2,208 |
| රසායනාගාර පාරිභෝගික භාණ්ඩ | 2,598 | 1,901 |
| **මුළු එකතුව** | **124,688** | **131,946** |

| | | |
|---|---|---|
| **සටහන් අංකः 08** | | |
| **පෙර ගෙවීම්** | | |
| බලපත්‍ර හා රක්ෂණය | 19 | 183 |
| මාර්ගස්ථ මුදල් | 10 | 10 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | - | 32 |
| ගොඩනැගිලි කුළිය | 4 | - |
| **මුළු එකතුව** | **33** | **225** |

**සටහනः 2024 වර්ෂයේ දී ලැබුණු වසරක වෙළඳ ණයකරුවන්ගේ අරමුදල්.**

**දේපළ, පිරියත උපකරණ**

**සටහන් අංක : 09**

| **පිරිවැය** | **2023.01.01 දිනට ශේෂය රු. 000** | **එක් කිරීම්/ ප්‍රත්‍යාගණනය රු. 000** | **බැහැර කිරීම්/ ගැළපුම් රු. 000** | **2023.12.31 දිනට ශේෂය රු. 000** |
|---|---|---|---|---|
| ඉඩම් | 1,897 | 90 | - | 1,987 |
| ගොඩනැගිලි | 50,590 | - | - | 50,590 |
| මෝටර් රථ | 171,447 | - | (250) | 171,197 |
| යන්ත්‍ර | 1,895,939 | 4,325 | (7,846) | 1,892,418 |
| රාසායනාගර උපකරණ | 90,460 | 5,465 | (50,234) | 45,691 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ කාර්යාල උපකරණ | 41,403 | 31 | - | 41,434 |
| පරිගණක හා උපාංග | 17,270 | 1,040 | (1,054) | 17,256 |
| විද්‍යාත්මක උපකරණ | 200,466 | 18,663 | (19,563) | 199,566 |
| ගොඩනැගිලි (සිදු කරගෙන යනු ලබන කාර්යය) | 1,789 | 34 | - | 1,823 |
| **මුළු එකතුව** | **2,471,261** | **29,648** | **(78,947)** | **2,421,962** |

| ක්ෂය කිරීම් | 2023.01.01 දිනට ශේෂය රු.000 | එක් කිරීම්/ ප්‍රත්‍යාගණනය රු.000 | බැහැර කිරීම්/ ගැළපුම් රු.000 | 2023.12.31 දිනට ශේෂය රු.000 |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 4,419 | 2,528 | - | 6,947 |
| මෝටර් රථ | 65,206 | 42,858 | (169) | 107,895 |
| යන්ත්‍ර | 408,541 | 336,832 | (7,846) | 737,527 |
| රාසායනාගර උපකරණ | 63,569 | 12,751 | (50,234) | 26,086 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ කාර්යාල උපකරණ | 9,728 | 4,139 | - | 13,867 |
| පරිගණක හා උපාංග | 9,860 | 1,806 | (1,054) | 10,612 |
| විද්‍යාත්මක උපකරණ | 85,436 | 23,571 | (19,563) | 89,444 |
| **මුළු එකතුව** | **646,759** | **424,485** | **(78,866)** | **992,378** |
| **ශුද්ධ පොත් අගය** | **1,824,502** | | | **1,429,584** |

**දේපළ, පිරියත හා උපකරණ**

**සටහන: 09**

**01 මූල්‍ය කාර්ය සාධනය සඳහා ක්ෂයවීමේ ගාස්තු පහත පරිදි අය කෙරේ.**

| ක්ෂය | වසර සඳහා ගාස්තු රු. 000 |
|---|---|
| ගොඩනැගිලි | 2,528 |
| මෝටර් රථ | 42,858 |
| යන්ත්‍ර | 336,832 |
| රාසායනාගර උපකරණ | 12,751 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ කාර්යාල උපකරණ | 4,139 |
| පරිගණක හා උපාංග | 1,806 |
| විද්‍යාත්මක උපකරණ | 23,571 |
| **මුළු එකතුව** | **424,485** |

02 කොරකහවැව පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම (හෙක්ටයාර 2.166) වාර්ෂික කුලී පදනම මත ගෙවීම සඳහා බදු ගිවිසුමක් ඇත.

03 බත්තරමුල්ලේ පර්චස් 40.0 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ජල සම්පත් මණ්ඩලයට වෙන් කර ඇත.

04 2016.08.26 දිනැති අංක 1982 ගැසට් නිවේදනය මගින් අනුරාධපුරයේ සංචාරක බංගලාවට අයත් ඉඩම (හෙක්ටයාර 0.0759.) වසර 30ක කාලයක් සඳහා බදු පදනම මත පවරා ඇත.

වාර්ෂික තක්සේරු දැන්වීමක් නොමැති වීම හේතුවෙන් මෙම ප්‍රතිපාදනය සපයා නොමැත.

05 පළාත් කාර්යාලය ඉදිකිරීම සඳහා යාපනයේ ඉඩම (හෙක්ටයාර් 0.0506:) වාර්ෂික කුලී පදනම මත ගෙවීමට බදු දී ඇත.
වත්මන් වාර්ෂික කුලිය රු. 50,000/= (රු. 2,500,000/= *2%)

06 2023.12.31 දිනට නීත්‍යානුකූල හිමිකම නොමැතිව මණ්ඩලය පරිහරණය කරන ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| **ඉඩම** | **(ආසන්න වශයෙන්)** |
|---|---|
| රත්මලාන වැඩපොළ | රෙක්ටෙයාර් 1.79378 |
| වව්නියාව වැඩ බිම | රෙක්ටෙයාර් 0.1050 |

07 වර්ෂය තුළ වත්කම් මිලදී ගැනීම් / ප්‍රදානය කළ වත්කම්වල අගයන් දේපළ, පිරියත හා උපකරණවල සටහන් අංක 09 හි එකතු කිරීම් ලෙස පෙන්වා ඇත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්**

| | 2023 රු.000 | 2022 රු.000 |
|---|---|---|
| **සටහන් අංක : 10** | | |
| **වෙනත් ප්‍රතිපාදන සහ ගෙවිය යුතු දෑ** | | |
| (1) විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 469 | 464 |
| (2) උපචිත වියදම් (කරුණාකර විස්තර සඳහා පිටු අංක 21 බලන්න) | 4,300 | 5,161 |
| (3) වෙනත් ගෙවිය යුතු දෑ (පාරිතෝෂිකය සමග) | 1,723 | 5,942 |
| (4) රඳවා ගත් ගෙවිය යුතු දෑ | - | 38 |
| (5) ගෙවිය යුතු වැට් බදු | 570 | - |
| (6) ලංසු බැඳුම්කර සහ ආපසු ගෙවිය හැකි තැන්පතු | - | - |
| (7) ගෙවිය යුතු රඳවා ගත් බදු | - | - |
| (8) ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද | - | - |
| (4) වැට් බදු මුදල් | - | |
| s/duty | | |
| **මුළු එකතුව** | **7,062** | **11,605** |

| | 2023 | 2022 |
|---|---|---|
| **සටහන් අංක 11** | | |
| **විලම්භිත ආදායම** | | |
| ප්‍රවාහ මීටර අත්තිකාම් | - | 903 |
| සේවා අත්තිකාරම් (කරු. විස්තර සඳහා 26 සහ 27 පිටු බලන්න) | 4,051 | 15,920 |
| සමීක්ෂණ වාර්තා අත්තිකාරම් (කරු. විස්තර සඳහා 28 පිටුව බලන්න) | 28 | 24 |
| **මුළු එකතුව** | **4,079** | **16,847** |

| | 2023 රු.000 | 2022 රු.000 |
|---|---|---|
| **සටහන : 12** | | |

**සේවක ප්‍රතිලාභ**

**12.1 නිර්වචනය කළ දායකත්ව සැලසුම්**

වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පහත දායක මුදල් ලබා දී ඇත.

| | 2023 | 2022 |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | | |
| සේවක දායකත්වය - 12% | 15,335 | 16,661 |
| සේවක දායකත්වය - 10% | 12,779 | 13,884 |
| | - | - |
| සේවක භාර අරමුදල - 3% | 3,834 | 4,165 |

**12.2 නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම**

| | 2023 | 2022 |
|---|---|---|
| වසර ආරම්භයේ දී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම | 60,783 | 59,089 |
| කාල සීමාව සඳහා පොළී පිරිවැය | 10,941 | 6,795 |
| වර්තමාන සේවා පිරිවැය | 3,793 | 4,406 |
| පසුගිය සේවා පිරිවැය | - | 2,116 |
| ආයුගණක (ලාභය/අලාභය) | (8,699) | (8,298) |
| වසර තුළ ගෙවන ලද ප්‍රතිලාභය | (9,095) | (1,541) |
| ගෙවිය යුතු ප්‍රතිලාභය | (1,594) | (1,784) |
| | **56,129** | **60,783** |

**12.2.1 ආදායම් ප්‍රකාශයේ වසර තුළ හඳුනාගත් වියදම**

| | | |
|---|---|---|
| වර්තමාන සේවා පිරිවැය | 3,793 | 4,406 |
| කාල සීමාව සඳහා පිරිවැය | 10,941 | 6,795 |
| | **14,734** | **11,201** |
| සමකොටස් ප්‍රකාශය (කරුණාකර 3 පිටුව බලන්න) | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභය/(අලාභය) | **(8,699)** | **(8,298)** |

**12.2.2.** වෘත්තීය ආයුගණකවරුන්ගේ සමාගමක් වන Actuarµal & Management Consultants පුද්ගලික සමාගමේ පුපලනාදන් මහතා විසින් 2023.12.31 දිනට පාරිතෝෂික වගකීම් සඳහා ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී.

ආයුගණක තක්සේරු විසින් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම තක්සේරු කිරීමේදී පහත උපකල්පන සහ දත්ත භාවිතා කරන ලදී.

| | **2023** | **2022** |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 13% | 18% |
| වැටුප් වර්ධක අනුපාතය | 10% | 15% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය | 6% | 3% |

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**12.2.3 නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම**

අනාගතය සම්බන්ධ උපකල්පන ලන්ඩනයේ Actuarµes ආයතනය විසින් නිකුත් කරන ලද A1967/70 මර්ත්‍යතා වගුව මත පදනම් වේ.

පුද්ගලයෙකුගේ සාමාන්‍ය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 60ක් ලෙස උපකල්පනය කෙරෙන අතර අවුරුදු 60ට වැඩි සේවකයින් ඔවුන්ගේ මීළඟ උපන්දිනයේ දී විශ්‍රාම යනු ඇතැයි උපකල්පනය කෙරේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සේවකයෙකුට පාරිතෝෂිකය සඳහා  වගකීම පැන නගින්නේ වසර 05ක අඛණ්ඩ සේවා  කාලයක් සම්පූර්ණ කළ පසුව පමණි.

**12.2.4  සංවේදීතා විශ්ලේෂණය**

විචල්‍යයන් 1% කින් වෙනස් වූ අතර අනෙකුත් සියළු උපකල්පන නොවෙනස්ව පැවතුණි.  සේවක ප්‍රතිලාභ කෙරෙහි බලපානු ඇත්තේ පහත සාධකයි.

| | **2023** | | |
|---|---|---|---|
| | **+1% කින් ඉහළ ගියේය රු.000'** | | **-1% කින් පහළ ගියේය රු.000'** |
| වට්ටම් අනුපාතය | 53,022 | | 59,616 |
| වැටුප් වර්ධක අනුපාතය | 59,728 | | 56,840 |

| | **2023**<br>**රු.000** |
|---|---|
| **සටහන් අංක :13** | |
| (2) විලම්භිත ආදායම | |
| (කරුණාකර විස්තර සඳහා  පිටු අංක 20 බලන්න) | - |

**සටහන් අංක :14**

ශුද්ධ වත්කම් / සම කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය සඳහා කරුණාකර පිටු අංක 03 බලන්න

**සටහන් අංක : 15**

**වෙනත් අනාවරණයන්**

**කැපවීම් සහ අවිනිශ්චිතතාවයන්**

**අවිනිශ්චිත වගකීම්**

**මණ්ඩලයට එරෙහිව නඩු**

2 ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 යන ලිපිනයේ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් පිටවීම සම්බන්ධයෙන් තිඹිලිගස්යාය, ලේකම් කාර්යාලය මගින් ගොනු කර ඇති නඩුවක් සඳහා හිමිකම් පෑම. කිසිදු සහතිකයක් ලබා දිය නොහැකි වුවද දැනට ලැබෙන තොරතුරු අනුව අධ්‍යක්ෂවරුන් විශ්වාස කරන්නේ එවැනි නඩු වල අවසාන තීරණය මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය හෝ ද්‍රවශීලතාවයේ ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් ඇති කිරීමට ඉඩක් නොමැති බවයි.

සටහන 13

**විලම්භිත ආදායම**

| විස්තරය | 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | වසර තුළ එකතු කිරීම් | වසර සඳහා ගාස්තු | | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | | ක්ෂය | ප්‍රත්‍යාගණන ගැළපුම්/බැහැර කිරීම් | |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ඉඩම් | - | - | - | - | - |
| ගොඩනැගිලි | 41,792 | | | (41,792) | - |
| මෝටර් රථ | 98,687 | | | (98,687) | - |
| යන්ත්‍ර | 1,487,013 | | | (1,487,013) | - |
| රාසායනාගර උපකරණ | 26,580 | | | (26,580) | - |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ කාර්යාල උපකරණ | 21,052 | | | (21,052) | - |
| පරිගණක හා උපාංග | 6,069 | | | (6,069) | - |
| විද්‍යාත්මක උපකරණ | 115,007 | | | (115,007) | - |
| ඉදිකිරීම්වලට අදාළව සිදු කරගෙන යනු ලබන කාර්යය | 609 | | | (609) | - |
| **මුළු එකතුව** | **1,796,809** | **-** | **-** | **(1,796,809)** | **-** |

**දේපල, පිරියත සහ උපකරණවල සාධාරණ අගය මත බලපෑම.**

| විස්තරය | 2020 වර්ෂය | 2018 වර්ෂය | 2017 වර්ෂය | 2016 වර්ෂය | |
|---|---|---|---|---|---|
| | | අතිරික්තය | හිගය | අතිරික්තය | හිගය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මෝටර් රථ | 15,100 | - | - | 916 | - |
| යන්ත්‍ර | - | - | - | - | 5,317 |
| රාසායනාගර උපකරණ | - | - | - | - | 631 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ කාර්යාල උපකරණ | - | 3,228 | - | - | - |
| පරිගණක හා උපාංග | - | - | - | 256 | - |
| විද්‍යාත්මක උපකරණ | - | - | 242 | - | - |
| **මුළු එකතුව** | 15,100 | 3,228 | 242 | 1,172 | 5,948 |
| බලපෑම | මූල්‍ය තත්වය | මූල්‍ය තත්වය | ආදායම් ප්‍රකාශනය | මූල්‍ය තත්වය | ආදායම් ප්‍රකාශනය |

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } IWM/A/WRB/FA/2023 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 අගෝස්තු 23 දින

සභාපති,
ජල සම්පත් මණ්ඩලය.

**ජල සම්පත් මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජල සම්පත් මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

(අ) පූර්ව වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබූ රු.1,638,000 ක වටිනාකම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 හි 54 ඡේදය ප්‍රකාරව සිදුකළ යුතු හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 49 ඡේදයට පටහැනිව දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදි වත්කම් පන්තීන් 3 කට අයත් අයිතම 854 න් 150 ක් පමණක් රු. 80,754,510 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන තිබුණි. තවද ප්‍රත්‍යාගණිත වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 90 ඡේදය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව්කිරීම් කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2016-2018 කාලය තුළ රු. 298,147,287 කට ප්‍රත්‍යාගණනය කර මේ වන විටත් භාවිතයට ගනිමින් පවතින වත්කම් පන්තීන් 4 කට අදාළ අයිතම 850 ක ඵලදායී ජීවිත කාලය අවසන් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශුන්‍ය වී තිබුණු අතර එම වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 42 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10හි 14 ඡේදයට පටහැනිව රු.3,360,000ක් වූ විදුම් යන්ත්‍ර, විදුම් ආයතන හා භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කිරීමේ ආදායම මුදල් පදනමට ගිණුම් තබා තිබුණි.

(ඉ) භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ඇතුළු අනෙකුත් ව්‍යාපෘති හා වෙනත් හුවමාරු නොවන ලැබීම් වලින් ලද එකතුව රු. 1,797,835,000 ක ආදායම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව ගිණුම්ගත කර තිබුණ ද උක්ත අයභාර හඳුනා ගැනීම සඳහා යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11හි 107 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) වාරිමාර්ග අමාත්‍යාංශය විසින් භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දින අවසන් කර මණ්ඩලයට භාර දී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) මෙ යටතේ මිලදී ගත් ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුණ ද රු.336,301,185 ක් වූ එම වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

2

(ii) රු.1,738,833,941 ක පිරිවැයකට මණ්ඩලයට පවරන ලද අධිතාක්ෂණික උපකරණ සහිත නළ ළිං 190 හා ඒවායේ නඩත්තු උපකරණ සහ රු.1,534,077,024 ක වටිනාකමකට මණ්ඩලයට පවරන ලද පරිභෝජන භාණ්ඩවල වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 83 ඡේදය ප්‍රකාරව අගයකර ගිණුම්ගත කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතිය විසින් ඩබල් කැබ් රථ 2ක් මිලදී ගෙන ජංගම රසායනාගාර බවට පරිවර්තනය කර 2023 පෙබරවාරි 15 දින මණ්ඩලයට භාර දී තිබූ අතර ඒවායේ වටිනාකම රු.33,541,773 ක් ලෙස යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 57 ඡේදය ප්‍රකාරව මෙම රථ 2 හි වටිනාකම මෝටර් වාහන ලෙස හා එහි සවිකල උපකරණ රසායනාගාර උපකරණ ලෙස ගිණුම්ගත කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.ඉන්වොයිසි වටිනාකම අනුව මෝටර් රථ 2 හි පිරිවැය වූ රු.21,700,000 මත සියයට 25 බැගින් රු.4,746,875ක් ක්ෂය කළ යුතු වුවත් යන්ත්‍රෝපකරණ ලෙස සලකා සියයට 20 බැගින් රු.3,352,340ක් ක්ෂය කර තිබීම හේතුවෙන් ක්ෂය රු.1,394,535ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) 2023 ඔක්තෝබර් 30 දින රු. 61,062,600 කට ප්‍රත්‍යාගණනය කර තිබූ රසායනාගාර උපකරණ අයිතම 80 ක වටිනාකම රු.5,465,000 ක් වශයෙන් රු.55,597,307 ක් අඩුවෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් එකී වත්කම් සඳහා වූ ක්ෂය වියදම රු.963,393 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2හි 56 ඡේදය ප්‍රකාරව මුදල් හා මුදල් සමාන දෑ වල සංරචක සියල්ල හෙළිදරව්කළ යුතු වුවද ලංකා බැංකුවේ අංක 0002323267 දරන ජංගම ගිණුම සම්බන්ධිතව පවත්වාගෙන ගොස් තිබූ අරමුදල් කළමනාකරණ ඉතිරි කිරීමේ ගිණුමේ පැවති රු.61,200,069 ක ශේෂය වෙන්ව දැක්වීම වෙනුවට අදාළ ජංගම ගිණුමේ ශේෂය සමඟ එකට ගෙන දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ වාර්ෂික වාර්තාව කියවන විට එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශ්වයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා

බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ),(ඈ),(ඉ),(ඊ),(උ) (i),(ii),(iii) ඡේද වල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ නියෝග. | |
| (i) 02 නියෝගය | නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 42 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි.ඉකුත් වර්ෂයේ ආයතන 72 ක් ලියාපදිංචි වී තිබුණු අතර ලියාපදිංචි වී නොමැති /ලියාපදිංචිය අළුත් නොකළ ආයතන නළ ළිං ඉදිකිරීම් නොකරන බව තහවුරු කර ගැනීමට හා මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැති ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබුණි. තවද ඉහත නියෝගය පරිදි ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියළු නළ ළිංවල දත්තයන් ඇතුලත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් ලියාපදිංචි ආයතන 42 අතරින් උක්ත වාර්තාව ලබා දී තිබුණේ ආයතන 4 ක් පමණකි. |
| (ii) 03 නියෝගය | ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් සෑම මාස 6 කට වරක්ම එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කරවාගෙන අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතන 42 න් උක්ත වාර්තා මණ්ඩලය වෙත ලබා දී තිබුණේ ආයතන 9 ක් පමණකි. |

7

| | |
|---|---|
| (iii) 06 නියෝගය | ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කළ යුතු නියමයන් ඇතුළත් 1 සිට 5 දක්වා නියෝග ප්‍රකාරව කටයුතු නොකරන ආයතන, සංවිධාන හෝ පුද්ගලයන්ට එරෙහිව 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 10 හා 11 වගන්ති | අරමුදල සඳහා සේව්‍ය දායකත්වය සියයට 12 ක් හා සේවක දායකත්වය සියයට 8ක් විය යුතු අතර ඊට වැඩි අනුපාතයකට එකඟ විය හැක. එසේ වුවද, මණ්ඩලයේ සේව්‍ය දායකත්වය සියයට 12ක් වීමේදී සේවකයන්ගෙන් සියයට 10 ක් අයකර ගෙවා තිබුණද ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වෙත දැනුම් දී නොතිබුණි. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| (i) 2.2.1 මාර්ගෝපදේශය | මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක නිශ්චය කර හෝ සංයුක්ත සැලැස්මක් සකස් කර හෝ ඒ අනුව මණ්ඩලය මෙහෙයවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 2.2.2 (ආ) මාර්ගෝපදේශය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කියවා අධ්‍යනය කිරීම සඳහා මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම, තීරණ ගැනීමට හා වගවීම තහවුරු කිරීමට අවශ්‍ය මනා විශ්වාසදායි කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගැනීම, විගණන කමිටු ඇතුළු අනෙකුත් උප කමිටුවල තීරණ කාලීනව පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා සම්බන්ධිත පාර්ශවයන්ගේ අවශ්‍යතා ඉටුවන, මූල්‍ය හා මූල්‍ය නොවන උපරිම තොරතුරු පරිශීලන හිතකාමී පරිදි ආයතනයේ වෙබ් පිටුව මගින් හෙළිදරව් කිරීම යන අවශ්‍යතා ඉටුවන පරිදි ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර තිබුණි. |
| (iii) 2.4 මාර්ගෝපදේශය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලය සමඟ වූ සම්බන්ධතා පිළිබඳ මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂික ප්‍රකාශයක් සිදුකර නොතිබුණු |

අතර මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීමද සිදු කර නොතිබුණි.

| | |
|---|---|
| (iv) 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ අත්පොතෙහි 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2023 වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

මණ්ඩලය විසින් 2018 වර්ෂයේ සිට භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර ඔවුන් වෙත පෞද්ගලිකව වෘත්තිමය සේවාවන් සැපයීමට අවසරය ලබා දී තිබුණි. 1964 අංක 29 අංක දරණ ජල සම්පත් මණ්ඩල පනත යටතේ ඒ සඳහා නෛතික ප්‍රතිපාදන ලැබී නොතිබුණ අතර භූ ජල විද්‍යාඥයින් 12ත් 18ත් අතර සංඛ්‍යාවක් වාර්ෂිකව ලියාපදිංචි කර තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

------------------

**(අ) භූගත ජල විමංසන තොරතුරු ජාලයක් (Ground Water Monitoring Network) ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය.**

ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා පද්ධතියක් ස්ථාපනය කිරීමට, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය,පොළොන්නරුව,මොණරාගල සහ පුත්තලම ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක 4 ක ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය යූරෝ 20,629,921ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් නෙදර්ලන්තයේ රෝයල් අයිකල්කැම්ප් ආයතනය සමඟ 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ යූරෝ 20,629,921.18 හෙවත් රුපියල් 5,521,329,000 න් සියයට 85 ක් එනම් යූරෝ 17,535,433 ක්

9

නෙදර්ලන්තයේ රේබෝ බැංකුවෙන් (Rabo Bank) වාර්ෂිකව සියයට 1.45 බැගින් වූ සහන පොලී අනුපාතයක් මත වර්ෂ 10ක් තුළ සමාන වාරික 20 කින් ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ඉතිරි සියයට 15 වන යුරෝ 3,094,488.18 ක මුදල ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින්, වසර 3 ක සහන කාලයකින් පසු 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ව්‍යාපෘතිය 2022 වර්ෂයේ නිම කර තිබුණද එහි මූලික අවශ්‍යතාවයක් වූ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි නොකිරීම නිසා ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ නිසිලෙස ලබාගත නොහැකි වී තිබුණි.

(ii) බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462 ක් වෙන්කර තිබුණු අතර රු. මිලියන 329.8 ක් හෙවත් යුරෝ 1,875,447 ක අවිනිශ්චිත වෙන් කිරීමද දත්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මෙකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු.මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම් හිමිකාරිත්වය ලැබී නොතිබීම හේතුවෙන් දත්ත මධ්‍යස්ථානය ඉදි කර නොතිබුණු අතර ගෙවා තිබූ යුරෝ 3,094,488 ක අත්තිකාරම් මුදල නිෂ්කාර්ය වී තිබුණි.

(iii) ව්‍යාපෘතියේ කාර්යයක් ලෙස ජංගම රසායනාගාර 2 ක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.21,700,000 කට ඩබල්කැබ් 2 ක් මිලදී ගෙන ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් ලියාපදිංචි කර පුද්ගලික ආයතනයකට භාර දී ජංගම රසායනාගාර බවට පත්කර තිබුණු අතර ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ආයතනයක් තෝරා ගෙන නොතිබුණි.

(iv) අදාළ රථ 2 ජංගම රසායනාගාර බවට පත්කර 2023 පෙබරවාරි 15 දින මණ්ඩලය වෙත භාරදී තිබුණු අතර පරිවර්තන කටයුතු සඳහා රු.11,841,774 ක් පුද්ගලික සමාගම විසින් අයකර තිබුණි. එසේ වුවද එම වාහන දෙකෙන් ඉවත් කර ඇති පසුපස කොටස් (Rear Tube Tail Body) දෙක මණ්ඩලය වෙත ආපසු භාර දී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර ඊට වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණිග

(v) ජංගම රසායනාගාර රථ 2, 2023 මැයි 02 දින මණ්ඩලයේ සභාපති නමින් කැබ් රථ ලෙස ලියාපදිංචි කර තිබුණද ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචිය සංශෝධනය කර නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියට අයත්, බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩමක් 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත, එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරු කරු විසින් වාර්ෂිකව රු.2,700,000 ක බදු මුදලක් තීරණය කර තිබුණි.ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමකට අත්සන් කිරීමකින් තොරව මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් දක්වා කුලිය වශයෙන් රු.24,906,879 ක් එම අධිකාරියට ගෙවා තිබුණද ඉඩම භාවිත කර නොතිබුණි.එමෙන්ම භූ ගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය

යටතේ මෙම ඉඩමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ සිට ප්‍රතිපාදන වෙන්වී තිබුණද විධිමත් බදු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.එමෙන්ම රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය යටතේ කොළඹ 7 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා ගෙවීමට ඇති රු. 56,409,666,000 ක හිඟ බදු මුදල ගෙවීමෙන් හෝ නිසි ක්‍රමවේදයක් යටත් කපා හැරීම සිදු කරන තෙක් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි මෙම ඉඩම සඳහා දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළඹීම නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඇ) (i) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධිවිධාන පරිදි මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ JM-1 වැටුප් කාණ්ඩයට අයත්ව තිබූ ඇතැම් තනතුරු ප්‍රතිව්‍යුහගතකරණයේදී MM කාණ්ඩයේ (මධ්‍යම කළමනාකරණ මට්ටම) තනතුරු බවට පරිවර්තනය කර තිබුණි. 2012.10.03 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු එම තනතුරු වලට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් 5 දෙනෙකු හට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2010 හා 01/2013 හා 01/2018 යටතේ සහනදායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කාලසීමාවද MM කාණ්ඩයේ තනතුරු දැරූ ලෙස සලකා සාවද්‍ය ලෙස සේවා කාලය ගණනය කර උක්ත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණි.පළමු සහනදායී වාහන ආනයන බලපත්‍ර ලබාගත් මෙම නිලධාරීන්ගෙන් නිලධාරීන් තිදෙනෙකුට 2018 වර්ෂයේ නැවත දෙවන බලපත්‍රය ලබා ගැනීමටද අවශ්‍ය නිර්දේශ ලබා දී තිබුණි. බලපත්‍ර ලබාගෙන වසර 10 ක කාලයක් ගත වී තිබුණද එම නිලධාරීන් සඳහා ආරම්භ කර තිබූ විනය පරීක්ෂණය මේ දක්වා අවසන් කර නොතිබුණි. ඒ සම්බන්ධ අදාල නිර්දේශ ලබා දුන් නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට මණ්ඩලය විසින් මේ දක්වා පියවර ගෙන නොතිබුණි.

(ii) මීට අමතරව මේ වන විට විශ්‍රාම ලබා ඇති නිලධාරී 5 දෙනෙකු සඳහාද නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර සහනදායී වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට නිර්දේශ ලබා දී එම නිලධාරීන් බලපත්‍ර ලබා ගෙන තිබුනු අතර ඒ අනුව එම නිලධාරීන් බලපත්‍ර ලබා ගැනීම තුළින් සිදුකර ඇති අලාභ අයකර ගැනීමටත් එම බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදුන් නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමටත් පියවර ගෙන නොතිබුණු අතර නිලධාරීන් විශ්‍රාම ගැනිමේදී රජයට අයවිය යුතු මෙම අලාභ අයකර නොගෙන පාරිතෝෂිත ගෙවා තිබුණි.

(ඉ) ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත පිළියල කිරීම සඳහා පෞද්ගලික නීතිඥයෙකු හා නීතිඥ සමාගමක සේවය ලබා ගෙන විගණිත දිනය වන විට රු.645,000ක් ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කළ යුතු බව හඳුනා ගෙන වසර 4 ක් ගත වී තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.

(ඊ) මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරවීමේ පාර්ශවය ( Implementing Partner) ලෙස කටයුතු කරන ලද ව්‍යාපෘති 2 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් රු.7,850,000 ක ප්‍රතිපාදන වෙන් කර රු.802,000 ක් පමණක් වියදම් කර තිබුණි.ඒ අනුව අදාළ ව්‍යාපෘති සඳහා වාර්ෂික අයවැය මගින් වෙන් කරන ප්‍රතිපාදන වලින් සියයට 89 ක් වර්ෂය තුළ භාවිතා නොකිරීම මත ඌණ උපයෝජිතව තිබුණි.

11

(ඌ) මණ්ඩලයේ විදුම් අංශයට විදුම් කළමණාකරුවකු, විදුම් නිළධාරීන් 11 දෙනෙකු ඇතුලු 52 දෙනෙකුගෙන් යුත් සහාය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු අතර එම කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් පිරිවැය වශයෙන් රු.65,965,000 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. එම අංශය සතුව පැවති විදුම් යන්ත්‍ර 18 න් 9ක් පමණක් ක්‍රියාකාරී තත්වයේ පැවති අතර ඉන් ව්‍යාපෘතියෙන් ලැබුණු නවීන විදුම් යන්ත්‍ර 2 සඳහා නඩත්තු හා සේවා වියදම් හා අලුත්වැඩියා වියදම් අධික වීම හේතුවෙන් සේවයේ යොදවා නොතිබුණි. ඉතිරි විදුම් යන්ත්‍ර 07 න් සමාලෝචිත වර්ෂයේ නළ ළිං 58 ක් පමණක් ඉදිකර තිබුණු අතර ඒ අනුව ක්‍රියාකාරී තත්වයේ පැවති එක් යන්ත්‍රයකින් නළ ළිං 8 ක් පමණක් ඉදිකර තිබුණි. එක් යන්ත්‍රයක් සඳහා විදුම් නිලධාරියකු හා 8 දෙනෙකුගෙන් යුත් සහය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබූ අතර එම එක් කණ්ඩායමක් විසින් මාස දෙකකට එක් නළ ළිඳක් පමණක් ඉදිකර තිබුණි.

2018 වර්ෂය සිට මණ්ඩලයේ විදුම් අංශය වෙත ලැබූ ඇණවුම් ප්‍රමාණය 280 සිට 58 දක්වා වාර්ෂිකව අඛණ්ඩව පහත වැටී තිබුණි. ඒ අනුව එම අංශයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය පිලිබඳ විශ්ලේෂණයක් සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි.

(ඌ) ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.12,772,000 ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබදව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45 ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රය එවකට අග්‍රාමාත්‍යවරයා භාවිතා කළ නිළ නිවස පුළුල් කිරීමේ කාර්ය සඳහා යොදා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්ද තොරව භාරදී තිබුණි. ප්‍රධාන කාර්යාලය 2021 ජුලි 18 දින සිට 2022 ජුලි 15 දක්වා රාජගිරිය ප්‍රදේශයේ පෞද්ගලික කුලී ගොඩනැගිල්ලකද, 2022 අගොස්තු 01 දින සිට නාවල කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික ගොඩනැගිල්ලකද පවත්වා ගෙන ගොස් තිබුණි. ඒ සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු.30,511,722 ක් ගෙවා තිබුණි.

(එ) 2016 වර්ෂයේදී අවුරුදු 30 ක කාලසීමාවක් සඳහා කුලී පදනම මත මණ්ඩලයට පවරා තිබූ අනුරාධපුර සංචාරක බංගලාව ඉදිකර ඇති ඉඩම සඳහා වසර 7 ක් ඉක්මවා තිබුණද කුලී ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මෙම ඉඩම සඳහා කිසිදු කුලියක් ගෙවීමට මේ දක්වා කටයුතු කර නොමැත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

**ජල සම්පත් මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

| 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම | | | |
|---|---|---|---|
| | (අ) | පූර්ව වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබූ රු. 1,638,000.00 ක වටිනාකම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 හි 54 ඡේදය ප්‍රකාරව සිදුකල යුතු හෙළිදරවු කිරීම් කර නොතිබුණි. | මෙම රු. 1,638,000 ක මුදල 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමෙන් පසු එම වර්ෂයේ ආදායමට ඇතුලත් විය යුතු ඉන්වොයිස් පත් 5 ක් , දුරකථන ගාස්තු වවුචරයක් හා බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව ඉඩම සඳහා බදු මුදල් වෙන් කිරීමේදී වැඩිපුර වෙන්කර ඇති මුදලකින් සමන්විත වේ. මෙම අයිතම සම්බන්ධ විස්තර ඇමුණුම 3 මගින් ඉදිරිපත් කරන අතර 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙවැනි ගනුදෙනු පැවතිය හොත් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කිරීමට කටයුතු කරමි. |
| | (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 49 ඡේදයට පටහැනිව දේපොළ , පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදී වත්කම් පන්තීන් 3කට අයත් අයිතම 854 න් 150 ක් පමණක් රු. 80,754,510.00 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගෙන තිබුණි. තවද ප්‍රත්‍යාගණිත වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 90 ඡේදය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරවු කිරීම කර නොතිබුණි. | ජල සම්පත් මණ්ඩලය සතුව අනුරාධපුර යාපනය පුත්තලම මොනරාගල රත්මලාන ලෙසින් පළාත් කාර්යාල පවතින අතර මණ්ඩලය සතුව පවතින සියලුම වත්කම් එම එක එක අංශ සතුව පවතී. අප මණ්ඩලයේ සේවක හිඟතාවය හේතුවෙන් යාපනය හා රත්මලාන පළාත් කාර්යාල තුල පැවති වත්කම් ප්‍රත්‍යාගණනය කරවා ගැනීම සඳහා ද ජල සම්පත් මණ්ඩලය , ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයේ සහයෝගය පැතූ අතර එම දිස්ත්‍රික්ක දෙක සඳහා ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් සහභාගී නොවීම මත ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වූ බව සඳහන් කරමි. |
| | (ඇ) | මණ්ඩලය විසින් 2016-2018 කාලය තුල රු, 298,147,287.00 කට ප්‍රත්‍යාගණනය කර මේ වන විටත් භාවිතයට ගනිමින් පවතින වත්කම් පන්තීන් 4කට අදාල අයිතම 850 ක ඵලදායි ජීවිත කාලය අවසන් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශූන්‍ය වී තිබූ අතර එම වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 42 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ජ.ස.ම. අනුමත සහ සත්‍ය කාර්ය මණ්ඩලය සම්බන්ධ විස්තරය ඇමුණුම FD-0 මගින් දක්වා ඇත. ඒ අනුව මේ වනවිට සමස්ත පුරප්පාඩු 187 ක් පමණ වේ. ඉහත දක්වා ඇති පරිදි ජ.ස.ම. තුල දෛනික රාජකාරියට අමතර වෙනත් රාජකාරියන් සිදුකරවා ගැනීමට තරම් ප්‍රමාණවත් තරම් කාර්ය මණ්ඩලයක් නොමැති බව තහවුරු වන අතර 2023 වර්ෂය තුලදී පුත්තලම මොනරාගල අනුරාධපුරය දිස්ත්‍රික්ක වල පළාත් කාර්යාල තුල ඇති ඵලදායි ජීවිත කාලය අවසන් වූ වත්කම් ප්‍රත්‍යා ගණනය කල අතර ඒ බවට හෙළිදරවු කිරීම් වල 3.2 යටතේ දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | අනෙකුත් දිස්ත්‍රික්ක දෙකේද වත්කම් ප්‍රත්‍යාග ණනය කිරීමට 2023 වසරේදී ජ.ස.ම. උත්සහයක් දැරූ අතර අදාළ කාර්ය මණ්ඩලය හා බාහිර සාමාජිකයින් සම්බන්ධ කර ගැනීමේ අපහසුව මත එම කාර්ය ඉටු කල නොහැකි විය. |
| | (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති 10 හි 14 ඡේදයට පටහැනිව රු. 3,360,000.00 වූ විදුම් යන්ත්‍ර විදුම් ආයතන හා භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කිරීමේ අදායම මුදල් පදනමට ගිණුම් තබා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයක් පිටු අංක 8 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ ආදායම් හඳුනා ගැනීම් යටතේ අදාළ කරුණ හෙළිදරවු කර ඇත. |
| | (ඉ) | භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ඇතුළු අනෙකුත් ව්‍යාපෘති හා වෙනත් හුවමාරු නොවන ලැබීම් වලින් ලද එකතුව රු. 1,797.835,000.00 ක අදායම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 11 ප්‍රකාරව ගිණුම් ගත කර තිබුනද උක්ත අයභාර හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 107 ඡේදය ප්‍රකාරව හෙළිදරවු කර නොතිබුණි. | ගිණුම්කරන ප්‍රතිපත්ති 3.4 යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 11 ට අනුව ප්‍රධාන ලෙසද වත්කම් සම්බන්ධයෙන් ක්‍රියා කල අයුරු හෙළිදරවු කර ඇත. තවද ඒ පිළිබඳ විස්තර සටහන් 13 යටතේද ඇතුලත් කර ඇත.<br><br>හුවමාරු නොවන ගනුදෙනු වටිනාකමට අදාළ ක්ෂය වියදම ද ඇතුලත්ව සමස්ත වත්කම් ක්ෂය වියද රු. 424,485,000.00 ක් තරම් විශාල අගයක් සැකසීම මෙම මෙහෙයුම් ඌණතාවයට හේතු වේ. |
| | (ඊ) | වාරිමාර්ග අමාත්‍යංශය විසින් භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කර මණ්ඩලයට භාර දී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.<br><br>(i) මේ යටතේ මිලදී ගත් ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුනද රු. 336,301,185.00 ක් වූ එම වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම නෙදර්ලන්ත ව්‍යාපෘතිය යටතේ ලැබුණු වත්කම් වල පිරිවැය සකස් කිරීමේදී ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වැරදි ක්‍රමයක් අනුගමනය කිරීම මත එම පිරිවැයන් පිළිගත නොහැකි තත්වයක පැවතුන අතර 2023 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ වත්කම් වල පිරිවැය නිවැරදිව අගය කිරීම සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යංශයේ ලේකම් විසින් කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව විසින් ලබාදුන් නිර්දේශයන්ට අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් නිවැරදි වත්කම් අගයන් ඇතුලත් කර වාර්තාවක් ජ.ස.ම. ට ඉදිරිපත් කලයුතු වුවත් 2024.02.28 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් නොවීම මත එම වත්කම් පොත්වලට ගැනීමට අපොහොසත් විය. මෙම කමිටු වාර්තාව ලබාදෙන ලද්දේ 2024.04.19 දිනය. 2024 වර්ෂයේ මූල්‍ය ගිණුම් වල මෙම වත්කම් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 11 යටතේ හෙළිදරවු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | ii. රු. 1,738,833,941.00 පිරිවැයකට මණ්ඩලයට පවරන ලද අධිතාක්ෂණික උපකරණ සහිත නළ ළිං 190 හා ඒවායේ නඩත්තු උපකරණ සහ රු, 1,534,077,024.00 ක වටිනාකමට මණ්ඩලයට පවරන ලද පාරිභෝජන භාණ්ඩ වල වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 83 ඡේදය ප්‍රකාරව අගය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉහත - එම විස්තරයම, |
| | (ii) | iii. ව්‍යාපෘතිය විසින් ඩබල් කැබ් රථ 2 ක් මිලදී ගෙන ජංගම රසායනාගාර බවට පරිවර්තනය කර 2023 පෙබරවාරි 15 දින මණ්ඩලයට භාර දී තිබූ අතර ඒවායේ වටිනාකම රු, 33,541,773.00 ක් ලෙස යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම් ගත කර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 57 ඡේදය ප්‍රකාරව මෙම රථ 2 හි වටිනාකම මෝටර් රථ වාහන, ලෙස සවිකළ උපකරණ රසායනාගාර උපකරණ ලෙස ගිණුම් ගත කලයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඉන්වොඉස් වටිනාකම අනුව මෝටර් රථ 2 හි පිරිවැය වූ රු. 21,700,000.00 මත සියයට 25 බැගින් රු, 4,746,875.00 ක්ෂය කල යුතු වුවත් යන්ත්‍රෝපකරණ ලෙස සලකා සියයට 20 බැගින් රු, 3,352,340.00 ක්ෂය කර තිබීම හේතුවෙන් ක්ෂය රු, 1,394,535.00 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | 1. පිළිගනිමි - 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි.<br>2. පිළිගනිමි - 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (උ) | 2023 ඔක්තෝම්බර් 30 දින රු, 61,062,600.00 කට ප්‍රත්‍යාගණනය කර තිබූ රසායනාගාර උපකරණ අයිතම 80 වටිනාකම රු. 5,465,000.00 ක් වශයෙන් රු, 55,597,307.00 අඩුවෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් එකී වත්කම් සඳහා වූ ක්ෂය වියදම රු, 963,393.00 අඩුවෙන් දක්වා තිබුණි. | ජල සම්පත් මණ්ඩලය සතුව අනුරාධපුර යාපනය පුත්තලම මොනරාගල රත්මලාන ලෙසින් පළාත් කාර්යාල පවතින අතර මණ්ඩලය සතුව පවතින සියලුම වත්කම් එම එක එක අංශ සතුව පවතී. අප මණ්ඩලයේ සේවක හිඟතාවය හේතුවෙන් යාපනය හා රත්මලාන පළාත් කාර්යාල තුල පැවති වත්කම් ප්‍රත්‍යාගණනය කරවා ගැනීම සඳහා ද ජල සම්පත් මණ්ඩලය , ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයේ සහයෝගය පැතූ අතර එම දිස්ත්‍රික්ක දෙක සඳහා ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් සහභාගී නොවීම මත ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වූ බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| | (ඨ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 හි 56 ඡේදය ප්‍රකාරව මුදල් හා මුදල් සමාන දෑ වල සංරචක සියල්ල හෙළිදරවු කල යුතු වුවද ලංකා බැංකුවේ අංක 0002323267 දරන ජංගම ගිණුම සම්බන්ධිත පවත්වාගෙන ගොස් තිබූ අරමුදල් කළමනාකරණ ඉතිරිකිරීමේ ගිණුමේ පැවති රු, 61,200,069.00 ක ශේෂය වෙන්ව දැක්වීම වෙනුවට අදාළ ජංගම ගිණුමේ ශේෂය සමග එකට ගෙන නොදක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් අංක 0002323267 යටතේ දක්වා ඇති ශේෂය තුල මෙම අරමුදල් කළමනාකරණ ගිණුම් ශේෂයද ඇතුලත්වේ. මූල්‍ය ප්‍රකාෂණ වල පිටු අංක 15 තුල මේ සම්බන්ධව හෙළිදරවු කර සටහන් තබා ඇත. එම සටහන් වල පිටපත් ඇමුණුම 2 මගින් ඉදිරිපත් කර ඇත. |
| 2.2.2 | | **නීතිරීති /විධානයට යොමුව** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** |
| | (අ) | 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ නියෝග<br><br>(i) **02 නියෝගය**<br>නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 42ක් පමණක් ලියාපදිංචි වී තිබුණි. ඉකුත් වර්ෂයේ ආයතන 72ක් ලියාපදිංචි වී තිබුණු අතර ලියාපදිංචි වී නොමැති / ලියාපදිංචිය අලුත් නොකළ ආයතන නළ ළිං ඉදිකිරීම් නොකරන බව තහවුරු කර ගැනීමට හා මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැති ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබුණි. තවද ඉහත නොයෝගය පරිදි ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියලු නළ ළිං වල දත්තයන් ඇතුලත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් ලියාපදිංචි ආයතන 42 අතුරින් උක්ත වාර්තාව ලබා දී තිබුනේ ආයතන 4 ක් පමණකි. | නල ළිං ඉදිකරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු සකස් කරමින් පවතී. මෙහිදී පුවත්පත් දැන්වීම් පළකර ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. තවද ජ.ස.ම. පනතේ නල ළිං ඉදිකරනු ලබන ආයතන ලියාපදිංචි නොවීම සම්බන්ධයෙන් ගත හැකි නීතිමය ප්‍රතිපාදන නොමැති බැවින් අදාළ පනත සංශෝධනය කරනු ලැබූ අතර අවශ්‍ය අනුමතින් සඳහා යොමු කර ඇත.<br><br>තවද මේ සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය ආයතන දැනුවත් කර එම ආයතන වල සහයෝගය ලබාගෙන පනත සංශෝධනය වී අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ලැබෙන තෙක් ලියාපදිංචි නොවූ නල ළිං ඉදිකරන විදුම් යන්ත්‍ර භාවිතය අවම කිරීමට කටයුතු සිදුකරමින් පවතී.<br><br>දැනට ලියාපදිංචි සියලු නළ ළිං විදුම් ආයතන දැනුවත් කර එම විදුම් යන්ත්‍ර නැවත ජ.ස.ම. ලියාපදිංචිය යාවත්කාලින කරන මෙන් එම ආයතන වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලදී.<br><br>ලියාපදිංචි විදුම් ආයතන වෙත එම ආයතන විසින් ඉදිකරන නළ ළිං වල තාක්ෂණික වාර්තා ජ.ස.ම. වෙත ලබාදෙන ලෙස දන්වමින් එක් එක් විදුම් යන්ත්‍ර වලට අදාළ විදුම් ආයතන වෙත ලිඛිතව දැනුවත් කිරීම් සිදුකරන ලදී. ඒ අනුව විදුම් වාර්තා ලැබෙමින් පවතින අතර එම වාර්තා ජ.ස.ම. වෙත තවදුරටත් ලබාග ැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | | ii **03 නියෝගය**<br>ජලය බෝතල් කිරීමේ කර්මාන්තයෙහි හා බිම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් සෑම මාස 6 කට වරක්ම එකී ජල මුලාශ්‍රයේ ජල නියැදියක් රජය පිළිගත් රසායනාග ාරයකින් පරීක්ෂා කරවාගෙන අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වුවත් මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතන 42 න් උක්ත වාර්තා මණ්ඩලය වෙත ලබා දී තිබුනේ ආයතන 9 ක් පමණකි. | ජල බෝතල් හා බිම නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන භූගත ජාල ප්‍රභවයන් හි ජලයේ ගුණාත්මක භාවයට අදාළ රසායනික වාර්තා ජ.ස.ම. වෙත ලබාදෙන ලෙස අදාළ ආයතන වෙත ලිඛිතව දැනුම් දීම සිදු කරන ලදී. ඒ අනුව මේ වන විට රසායනික වාර්තා ජ.ස.ම. වෙත ලැබෙමින් පවතී. ඉදිරියේදී භූගත ජලයේ ගුණාත්මක භාවයට අදාළ වාර්තා ලබා නොදෙන ආයතන සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. තවද අනුකූත් රාජ්‍ය ආයතන හා සම්බන්ධ වී මෙම වාර්තා ලබාගැනීමට අවශ්‍ය සහයෝගය ලබාගෙන මෙම කටයුත්ත තවදුරටත් විදිමත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. |
| | | iii. **06 නියෝගය**<br>ස්භාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කලයුතු නියමයන් ඇතුලත් 1 සිට 5 දක්වා නියෝග ප්‍රකාරව කටයුතු නොකරන ආයතන , සංවිධාන හෝ පුද්ගලයන්ට එරෙහිව 1999 අංක 42 දරන පනතින් සංශෝදධිත 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | භූගත ජලයේ ගුණාත්මකභාවයට අදාළ වාර්තා හා විදුම් වාර්තා ලබානොදෙන ආයතන සඳහා අවශ්‍ය නීතිමය පියවර පවත්නා පනතට අනුව සිදු කිරීමට කටයුතු යොදා ඇත. තවද අනෙකුත් රාජ්‍ය ආයතන හා සම්බන්ධ වී මෙම වාර්තා ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා ගෙන මෙම කටයුත්ත තවදුරටත් විදිමත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. |
| | (ආ) | 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 10 හා 11 වගන්ති -<br><br>අරමුදල සඳහා සේව්‍ය දායකත්වය සියයට 12 ක් හා සේවක දායකත්වය 8ක් විය යුතු අතර ඊට වැඩි අනුපාතයකට එකඟ විය නොහැකිය. එසේ වුවද මණ්ඩලයේ සේව්‍ය දායකත්වය සියයට 12 වීමේදී සේවකයන්ගෙ න් සියයට 10 ක් අයකර ගෙවා තිබුනද ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වෙත දැනුම් දී නොතිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා සටහන් කර ගතිමු. |
| | (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හදුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ - | ජ.ස.ම. සඳහා කාර්ය දර්ශන සහ සංයුක්ත සැලසුම් සකස්කර තිබුනද මෑතක සිට ජාතික ජාල ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ජාතික ජාල ලේකම් කාර්යාලය පිහිටුවීමද ඒ සමග ජල සම්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහ ගත කිරීමේ කාර්ය සඳහා මෙම කටයුතු තාවකාලිකව නවතා දමනු ලැබිණි. |

| | | | |
|---|---|---|---|
| | | i. **2.2.1 මාර්ගෝපදේශය**<br>මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක නිශ්චය කර හෝ සංයුක්ත සැලැස්මක් සකස් කර හෝ ඒ අනුව මණ්ඩලය මෙහෙය වීමට කටයුතු කර නොතිබුණි. | |
| | | ii. **2.2.2. (ආ) මාර්ගෝපදේශය**<br>අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට පෙර අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා කියවා අධ්‍යනය කිරීම සඳහා මණ්ඩලය සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම, තීරණ ගැනීමට හා වගවීම තහවුරු කිරීමට අවශ්‍ය මනා විශ්වාසදායි කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම, විගණන කමිටු වැනි අනෙකුත් උප කමිටු වල තීරණ කාලීනව පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා සම්බන්ධිත පාර්ශයවයන්ගේ අවශ්‍යතා ඉටුවන , මුල්‍ය හා මුල්‍ය නොවන උපරිම තොරතුරු පරිශීලන හිතකාමී පරිදි ආයතනයේ වෙබ් පිටුව මගින් හෙළිදරවු කිරීම යන අවශ්‍යතා ඉටුවන පරිදි ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂය මණ්ඩලය කටයුතු කර තිබුණි. | සටහන්කර ගතිමි. |
| | | iii. **2.4 මාර්ගෝපදේශය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලය සමඟ වූ සම්බන්ධතා පිළිබඳව මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂික ප්‍රකාශයක් සිදුකර නොතිබුණු අතර මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ එක් එක් අධ්‍යක්ෂකවරයා සම්බන්ධයෙන් අදාළ හෙළිදරවු කිරීමද සිදුකර නොතිබුණි. | මණ්ඩලයේ ලේකම් තනතුරක් නොමැති අතර දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සටහන් කරගතිමි. |
| | | iv. 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේකය මගින් හදුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායයන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ අත්පොතෙහි 6.6 ඡේදය -<br><br>ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත් මණ්ඩලය විසින් 2023 වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | දැනට 2023 වාර්ෂික වාර්තාව සකස් කෙරෙමින් පවතින අතර 2024 අවසන් ගිණුම් සමඟ කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| 2.2.3 | | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යන්ට අනුකූලව නොවන ලෙස කටයුතු කර ඇති බව -<br><br>මණ්ඩලය විසින් 2018 වර්ෂයේ සිට භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර ඔවුන් වෙත පෞගලිකව වෘත්තිමය සේවාවන් සැපයීමට අවසරය ලබාදී තිබුණි. 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ ඒ සඳහා නෛතික ප්‍රතිපාදන ලැබී නොතිබුන අතර භූ ජල විද්‍යාඥයින් 12 ත් 18 ත් අතර සංඛ්‍යාවක් වාර්ෂිකව ලියාපදිංචි කර තිබුණි. | නල ළිං ඉදිකිරීම සඳහා ජ.ස.ම. මඟින් අනුමැතිය ලබා දිය යුතු බැවින් එම අනුමැතිය සඳහා අදාළ ස්ථානයේ භූජල සමීක්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කල යුතුය. එබැවින් නල ළිං ඉදිකිරීම සඳහා භූජල සමීක්ෂණය සිදුකර අදාළ වාර්තාවන් ජ.ස.ම. අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා පමණක් බාහිර භූජාල විද්‍යාඥයින් ලියාපදිංචිය සිදුකර තිබුණි. මෙම කටයුතු විධිමත්ව සිදුකිරීම සඳහා ජ.ස.ම. පනත සංශෝධනයේදී අදාළ කරුණු ඇතුලත්ව අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. තවද ජ.ස.ම. අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් පරිදි මේ සඳහා වන ඉදිරි වැඩ කටයුතු සිදු කරමින් පවතී. |
| **2.3** | | **වෙනත් කරුණු** | **කළමනාකරණයේ අදහස් දැක්වීම.** |
| | | භූගත ජල විමංසන තොරතුරු ජාලයක් (Ground Water Monµtorµng Network) ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය.<br><br>i. ව්‍යාපෘතිය 2022 වර්ෂයේ නිම කර තිබුනද එහි මූලික අවශ්‍යතාවයක් වූ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි නොකිරීම නිසා ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ නිසිලෙස ලබාගත නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති ගිවිසුම අනුව භූගත ජලධරයන්හි තත් කාලීන තොරතුරු වෙබ් පෝර්ටලය හරහා මධ්‍යගත මෙහෙයුම් ඒකකයක් ලෙස දත්ත මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ජල සම්පත් මණ්ඩල කාර්යාලය පිහිටි හෙක්ටර් කොබ්බැකඩුව මාවතේ 6000 sqft ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු වුවද එම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් පවරා ගැනීම තුල ප්‍රධාන කාර්යාල ද ඇතුළුව දත්ත මධ්‍යස්ථානය 24,000 sqft ප්‍රමාණයකට ජ.ස.ම. මගින් සැලසුම් කර එම සංශෝධනයන්ද සහිතව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස ලිඛිතව එකග වී ලබාදුන් බත්තරමුල්ලේ පිහිටි ඉඩමහි ඉදිකිරීම සඳහා සැලසුම් කෙරුනද නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිසි බදු ගිවිසුමක් 2022 ජුලි මස වන විටත් ලබා නොදීම හේතුවෙන් ව්‍යාපෘතිය නිමවීමට ආසන්න වනතුරු ඉදිකිරීම් ආරම්භ කල නොහැකි විය. ඒ අනුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ / ජල සම්පාදන අමාත්‍යංශයේ උපදෙස් සහ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට යටත්ව ව්‍යාපෘති කොන්ත්‍රාත් කරු වන නෙදර්ලන්ත Eµjkelkamp ආයතනය විසින් එම අනුමත ප්‍රතිපාදන තුල අවශ්‍යතාවයන්ට සුදුසු ගොඩනැගිල්ලක් මිලදී ගෙන ව්‍යාපෘතිය වෙත ලබාදීම සඳහා කැබිනට් අනුමැතියට යොමු කෙරුණි. එහිදී 2022 .08. 22 දින අමාත්‍ය මණ්ඩල කෙටුම්පත් වාර්තාවට අනුව ජ.ස.ම. සතුව දැනට පවතින ගොඩනැගිල්ලක දත්ත මධ්‍යස්ථානය ප්‍රතිස්ථාපනය කිරීමට නිර්දේශ වුනු අතර ගොඩනැගිල්ලක් මිලදී ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | | | රජයේ වියදම් කළමනාකරණය පිළිබඳව අමාත්‍ය මණ්ඩල සභාව විසින් අනුමත නොකරන ලදී.<br><br>එම තත්වය මත රත්මලාන වැඩබිම කාර්යාලයේ සියලු අවශ්‍ය විශේෂාංග සහිතව දත්ත මධ්‍යස්ථානය ව්‍යාපෘති අරමුණු සහ අවශ්‍යතාවයන් අනුව මේ වන විට ස්ථාපනය කර කටයුතු කරගෙන යනු ලබයි. |
| | | ii. බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462.00 ක් වෙන්කර තිබුණු අතර රු. මිලියන 329.8 හෙවත් යුරෝ 1,875,447.00 ක අවිනිශ්චිත වෙන් කිරීමද දත්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මෙකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488.00 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම් හිමිකාරිත්වය ලැබී නොතිබීම හේතුවෙන් දත්ත මධ්‍යස්ථානය ඉදි කර නොතිබුණු අතර ගෙවා තිබූ යුරෝ 3,094,488.00 ක අත්තිකාරම් මුදල නිෂ්කාර්ය වී තිබුණි. | මෙහිදී දත්ත මධ්‍යස්ථානය ජ.ස.ම. පවතින ගොඩනැගිල්ලක් තුල ස්ථාපිත කිරීම හේතුවෙන් වැය වූ වියදම අවශ්‍ය උපකරණයන් සඳහා පමණක් වූ හෙයින් ඇති වුනු ව්‍යාපෘති ඉතුරුම් පිළිබඳ ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් 2023.06.12 දිනැති PD/GWMNP/2022-15 දරන ලිපියෙන් අධ්‍යක්ෂක ජනරාල් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත සහ අධ්‍යක්ෂක (විදේශ ණය-1) භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව ප්‍රධාන ගණකාධිකාරී වාරිමාර්ග අමාත්‍යංශය වෙතද පිටපත් සහිතව දැනුම් දී ඇත. ඒ අනුව මෙම ශේෂ පදනම්ව ණය වාරිකයන් ගෙවීමේදී එම අඩුකිරීම්ද ඇතුලත්ව ණයගෙවීම සිදු කරන බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දන්වන ලදී. |
| | | iii. ව්‍යාපෘතියේ කාර්යක් ලෙස ජංගම රසායනාගාර 2 ක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු, 21,700,000.00 කට ඩබල් කැබ් 2ක් මිලදී ගෙන ව්‍යාපෘති අධ්‍යක්ෂක නමින් ලියාපදිංචි කර පුද්ගලික ආයතනයකට භාර දී ජංගම රසායනාගාර බවට පත්කර තිබුණු අතර ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ආයතනයක් තෝරා ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය Turnkey EPC (Engμneerμng Procurment & Constructμon) ව්‍යාපෘතියක් ලෙස වාරිමාර්ග අමාත්‍යංශ යටතේ ජ.ස.ම. සඳහා තත් කාලින භූ ගත ජල විමංසන පද්ධතීන් රටෙහි තෝරා ගත් කලාප කිහිපයක ස්ථාපනයට නෙදර්ලන්ත කොන්ත්‍රාත්තු සමාගමක් වන Eμjelkamp ආයතන හරහා ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත ක්‍රමවේදය අනුව ජ.ස.ම. මූලික තාක්ෂණික අවශ්‍යතා පදනම්ව කොන්ත්‍රාත්තු සමාගම විසින් ප්‍රසම්පාදන කටයුතු කෙරුනද ඒ සඳහා ජ.ස.ම. තාක්ෂණික කරුණු හැරුණු විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වීමේ අවකාශයක් නොතිබිණි. |

| | | | |
|---|---|---|---|
| | | iv. අදාළ රථ 2 ක ජංගම රසායනාගාර බවට පත්කර 2023 පෙබරවාරි 15 දින මණ්ඩලය වෙත භාරදී තිබුණු අතර පරිවර්තන කටයුතු සඳහා රු, 11,841,774.00 ක් පුද්ගලික සමාගම විසින් අයකර තිබුණි. එසේ වුවද එම වාහන දෙකෙන් ඉවත්කර ඇති පසුපස කොටස් (Rear Tube Taμl Body) දෙක මණ්ඩලය වෙත ආපසු භාර දී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර ඊට වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. | ව්‍යාපෘතියේ මෙම ජංගම රසායනාගාර රථ දෙක ලබාගැනීමේදී මේ සඳහා අනුමැතිය ලබාගැනීමට කැබිනට් මණ්ඩලය මගින් පත් කරනු ලැබූ ව්‍යාපෘති ඇගයුම් කමිටුව වෙත යොමු කෙරෙනුයේ මෙම ඒකකයන් දෙක අභිරුචිකරණය කරනු ලැබූ නිමවුම් ඒකකයන් ලෙසය. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත ක්‍රමවේදයන් පදනම්ව කොන්ත්‍රාත්තු සමාගමක වන Eμjelkamp ආයතනය විසින් මෙහි ප්‍රසම්පාදනයන් සහ ඉල්ලුම් කරනු ලැබූ තාක්ෂණික පිරිවිතරයන් මත සැකසීම සිදු කරනු ලැබිණ.එහිදී ප්‍රධාන කොන්ත්‍රාත් කරු විසින් මිලදී ගනු ලැබූ ඩබල් කැබ් රථ දෙක සෘජුවම අදාළ අභිරුචිකරණය කරනු ලබන උප කොන්ත්‍රාත් ආයතනය වෙත ලබා දී එම කටයුතු සියල්ලම නිම වූ පසු ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් නිමවුම් එකක ලෙස මෙම රසායනාගාර ජංගම රථ දෙක ව්‍යාපෘතියට ලිඛිතව 2022.09.15 දින බාර ගෙන ඇත. |
| | | v. ජංගම රසායනාගාර රථ 2, 2023 මැයි 02 දින මණ්ඩලය සභාපති නමින් කැබ් රථ ලෙස ලියාපදිංචි කර තිබුනද ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචිය සංශෝධනය කර නොතිබුණි. | මෙම රසායනාගාර ජංගම රථ දෙක ව්‍යාපෘති අධ්‍යක්ෂක යටතේ ලියාපදිංචි වී පැවති අතර ව්‍යාපෘතියෙන් පසු සභාපති ජ.ස.ම. වෙතට පවරා ගැනුන අතර මෝටර් රථ දෙපාර්තමේන්තුවෙහි මෙම රථ දෙක රසායනාගාර රථ දෙකක් ලෙස ව්‍යාපෘතිය මගින් ලියාපදිංචිය සිදු නොවී ඇති බැවින් එය වෙනස් කිරීම සඳහා ඇති හැකියාව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. |
| | (ඇ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩමක් 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මගින් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරු කරු විසින් වාර්ෂිකව රු, 2,700,000.00 ක බදු මුදලක් තීරණය කර තිබුණි. ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමකට අත්සන් කිරීමෙන් තොරව මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2023 ඔක්තෝම්බර් දක්වා කුලිය වශයෙන් රු, 24,906,879.00 ක් එම අධිකාරියට ගෙවා තිබුනද ඉඩම භාවිතා කර නොතිබුණි. එමෙන්ම භූ ගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වූ නියමු | අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි ජ.ස.ම. පරිහරණය කරනු ලැබූ කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ අංක 2 A දරන ස්ථානයේ පිහිටි ඉඩම වෙනුවට ලබාදෙන ලද බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමේ කායික භුක්තිය 2016.10.10 දින ජ.ස.ම. භාරදෙන ලදී. නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2016.01.21 දින ලිපියේ දක්වා තිබුනේ මෙම ඉඩමේ ජ.ස.ම. යේ රසායනාගාරය ඉදිකිරීමට අදහස් කරනු ලබන බවයි. නෙදර්ලන්ත රජයේ ආධාර මත ක්‍රියාත්මක වූ භූගත ජල විමංසන ජාල ව්‍යාපෘතිය මගින් ඉදිකිරීමට නියමිත තිබූ දත්ත මධ්‍යස්ථානය සහ ජ.ස.ම. යේ ප්‍රධාන කාර්යාලය සමඟ රසායනාගාරය මෙම ඉඩමේ ස්ථාපනය කිරීමට සැලසුම් කර අවශ්‍ය අනුමතින් පවා ලබාගෙන තිබූ අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩමට ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද කිරීම නිසා ව්‍යාපෘතිය කාලය අවසන් වීමත් සමඟ එම අවස්තාව |

| | | | |
|---|---|---|---|
| | | ව්‍යාපෘතිය යටතේ මෙම ඉඩමේ ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ සිට ප්‍රතිපාදන වෙන් වී තිබුනද විධිමත් බදු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. එමෙන්ම රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය යටතේ කොළඹ 7 හෙක්ටර් කොබ්බැකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා ගෙවීමට ඇති රු. 56,409,666.00 ක හිඟ බදු මුදල ගෙවීමෙන් හෝ නිසි ක්‍රමවේදයක් යටතේ කපාහැරීම සිදුකරන තෙක් ඩෙන්සිල් කොබ්බැකඩුව මාවතේ පිහිටි මෙම ඉඩම සඳහා දීර්ඝ කාලින බදු ගිවිසුමකට එළඹීම නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රතික්ෂේප කර තිබුණි. | මඟ හැරුණි. දැනටමත් නාගරික සංවර්ධන අධිකාරියට විශාල මුදලක් ගෙවා තිබියදී එම ඉඩම අතහැරීමට නොහැකි අතර අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ අනුමැතිය ලබා නොදෙන තත්වය යටතේ මෙම ඉඩමේ යෝජිත ගොඩනැගිල්ල තැනීම සඳහා රාජ්‍ය - පුද්ගලික ව්‍යාපෘතියක් මගින් මෙම කාර්ය ඉටුකර ගැනීම සඳහා සලකා බැලීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දුනි. රාජ්‍ය ඉඩම් අඥාපනතේ 6-1 වගන්තිය යටතේ බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවිය යුතුව තිබූ හිඟ මුදල අවු රු. 56,409,666.00 ගෙවීමෙන් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් කපා හැරීමෙන් පසු ගිවිසුම අත්සන් කරන බව නාගරික සංවර්ධන අධිකාරිය දන්වා සිටීම සැලකිල්ලට ගෙන ජ.ස.ම. මේ සඳහා දැනටමත් මෙම හිග මුදල කපා හැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සංදේශයක් ඉදිරිපත් කර ඇත. |
| | (ඈ) | i. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධිවිධාන පරිදි මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ JM -1 වැටුප් කාණ්ඩයට අයත්ව තිබූ ඇතැම් තනතුරු ප්‍රතිව්‍යුහගත කරණයේදී MM කාණ්ඩයේ තනතුරු බවට පරිවර්තනය කර තිබුණි. 2012.10.03. දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිව්‍යුහගත කරණයෙන් පසු එම තනතුරු වලට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් 5 දෙනකු හට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛන 01/2010 හා 01/2013 හා 01/2018 යටතේ සහනදායි පදමන මත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත්කිරීමේදී ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කාලසීමාවද MM කාණ්ඩයේ තනතුරු දරූ ලෙස සලකා සාවද්‍ය ලෙස සේවා කාලය ගණනය කර උක්ත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණි. පළමු සහනදායි වාහන ආනයන බලපත්‍ර ලබාගත් මෙම නිලධාරීන්ගෙන් නිලධාරීන් තිදෙනෙකුට 2018 වර්ෂයේ නැවත දෙවන බලපත්‍රය ලබාගැනීමට ද අවශ්‍ය නිර්දේශ ලබාදී තිබුණි. බලපත්‍ර ලබාගෙන වසර 10 ක කාලයක් ගතවී තිබුනද එම නිලධාරීන් සඳහා ආරම්භ කර තිබූ විනය පරීක්ෂණය මේ දක්වා අවසන් කර නොතිබුණි. ඒ සම්බන්ධව | මෙම නිලධාරීන් සම්බන්ධව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යංශය විසින් මූලික විමර්ශනයක් සිදුකර වාර්තාවක් ලබා දී ඇති අතර ඒ අනුව අදාළ නිලධාරීන්ට චෝදනා පත්‍ර නිකුත් කර ඇත.<br><br>මේ සම්බන්ධව ජ.ස.ම. විසින් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවතින අතර එම කටයුතු දැනට අවසන් වෙමින් පවතින අතර මැයි මාසය අවසන් වන විට එම වාර්තාව ලබාදෙන බව පරීක්ෂණ නිලධාරීන් දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | | අදාළ නිර්දේශ ලබාදුන් නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට මණ්ඩලය විසින් මේ දක්වා පියවර ගෙන නොතිබුණි. | |
| | | ii. මීට අමතරව මේ වන විට විශ්‍රාම ලබා ඇති නිලධාරීන් 5 දෙනෙකු සඳහාද නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීමට ප්‍රථම සහනදායි වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට නිර්දේශ ලබා දී එම නිලධාරීන් බලපත්‍රය ලබාගෙන තිබුණු අතර ඒ අනුව එම නිලධාරීන් බලපත්‍ර ලබාගැනීම තුලින් සිදුකර ඇති අලාභ අයකර ගැනීමටත් එම බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදුන් නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමටත් පියවර ගෙන නොතිබුන අතර නිලධාරීන් විශ්‍රාම ගැනීමේදී රජයට අය විය යුතු මෙම අලාභ අයකර නොගෙන පාරිතෝෂික ගෙවා තිබුණි. | සහන දායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබාගෙන තිබියදී විශ්‍රාම ගොස් සිටින නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය සහ අමාත්‍ය ලේකම් වරයා දැනුවත් කර අවශ්‍ය උපදෙස් මත පියවර ගැනීමට සටහන් කර ගතිමි.<br><br>මේ සම්බන්ධව නිර්දේශ ලබාදුන් නිලධාරීන් මේ වන විට විශ්‍රාම ගොස් ඇත. එමෙන්ම විගණන වාර්තාවේ එම විස්තර සඳහන් JM මට්ටමට පත් වූ දිනය ජ්‍යේෂ්ඨ මට්ටමට (MM) පත් වූ දිනය ලෙස නිවැරදි විය යුතු අතර මෙසේ මෝටර්රථ ආනයන බලපත්‍ර ලබාගත් අය සම්බන්ධව පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |
| | (ඉ) | ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත පිළියෙළ කිරීම සඳහා පුද්ගලික නීතිඥයෙකු හා නීතිඥ සමාගමක සේවය ලබාගෙන විගණිත දිනය වන විට රු, 645,000.00 ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කල යුතු බව හදුනාගෙන වසර 4 ක් ගත වී තිබුනද එම කාර්ය ඉටුකර නොතිබුණි. | 1964 ජල සම්පත් මණ්ඩල පනත සහ 1999 ජල සම්පත් මණ්ඩල සංශෝධන පනත යන පනත් දෙක සංශෝධනය කිරීම සඳහා පුළුල් සාකච්ඡා පවත්වන ලද අතර එම සංශෝධන ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාට ඉදිරිපත් කර එහි තවදුරටත් සිදුකල යුතු සංශෝධන ඇතුලත්කර භාර දෙන ලදී. එහෙත් යෝජිත ජාතික ජල ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීම සහ ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය පිහිටුවීම ද ඒ හරහා ජ.ස.ම. ප්‍රතිව්‍යුහ ගත කිරීම යන කරුණු හේතුකොට ගෙන මෙම ජ.ස.ම. පනත සංශෝධනය කිරීම ඇනහිට ඇත. |
| | (ඊ) | මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරවීමේ පාර්ශවය (Implementµng Partner) ලෙස කටයුතු කරන ලද ව්‍යාපෘති 2 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් රු, 7,850,000.00 ක ප්‍රතිපාදන වෙන් කර රු, | ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට අදාලව ජ.ස.ම. විසින් සිදු කිරීමට නියමිත ව්‍යාපෘති සංරචිකයට අදාලව ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදු කිරීමේදී වැය වන ඉන්ධන සඳහා වෙන් |

| | | | |
|---|---|---|---|
| | | 802,000.00 ක් පමණක් වියදම් කර තිබුණි. ඒ අනුව අදාළ ව්‍යාපෘති සඳහා වාර්ෂිකව අයවැය මගින් වෙන් කරන ප්‍රතිපාදන වලින් සියයට 89 ක් වර්ෂය තුල භාවිතා නොකිරීම මත ඌණ උපයෝජිතව තිබුණි. | කල මුදලින් අත්තිකාරම් මුදලක් ලෙස රු. මි. 3.79ක් 2023.09.18 වන දින ජ.ස.ම. වෙත ලැබී තිබුණි. එසේ වුවද 2023 වර්ෂය සඳහා අදාළ ක්ෂේත්‍ර කටයුතු කරගෙන යාමේදී අවසාන කාර්තුවේ පැවති අධික වර්ෂා කාලගුණ තත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමට දුෂ්කරතාවයන් පැන නැගුණි. මෙම කටයුතු විධිමත්ව 2024 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම්කර තිබේ.<br><br>ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට අදාලව ජ.ස.ම. විසින් සිදු කිරීමට නියමිත ව්‍යාපෘති සංරචකයන්ට අදාලව ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදුකිරීමේදී වැයවන ඉන්ධන සඳහා වෙන් කල මුදලින් අත්තිකාරම් මුදලක් ලෙස රු. මි. 3.79ක් 2023.09.18 වන දින ජ.ස.ම. වෙත ලැබුණි. එසේ වුවද 2023 වර්ෂය සඳහා අදාළ ක්ෂේත්‍ර කටයුතු කරගෙන යාමේදී අවසාන කාර්තුවේදී පැවති අධික වර්ෂා කාලගුණ තත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි කේෂ්ත්‍ර කටයුතු සිදු කිරීමට දුෂ්කරතාවයන් පැන නැගුණි. මෙම කටයුතු විධිමත්ව 2024 වර්ෂයේදී සිදුකිරීමට සැලසුම් කර තිබේ. |
| | (උ) | මණ්ඩලයේ විදුම් අංශයට විදුම් කළමනාකරුවෙකු විදුම් නිලධාරින් 11 දෙනකු ඇතුළු 52 දෙනෙකුගෙන් යුත් සහාය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු අතර එම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් අතිකාල ගමන් වියදම් හා අනෙකුත් පිරිවැය වශයෙන් රු, 65,965,000.00 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. එම අංශය සතුව පැවති විදුම් යන්ත්‍ර 18 න් 9 ක් පමණක් ක්‍රියාකාරී තත්වයේ පැවති අතර ඉන් ව්‍යාපෘතියෙන් ලැබුණු නවීන විදුම් යන්ත්‍ර 2 සඳහා නඩත්තු හා සේවා වියදම් හා අලුත්වැඩියා වියදම් අධික වීම හේතුවෙන් සේවයේ යොදවා නොතිබුණි. ඉතිරි විදුම් යන්ත්‍ර 7න් සමාලෝචිත වර්ෂයේ නළ ළිං 58ක් පමණක් ඉදිකර තිබුණු අතර ඒ අනුව ක්‍රියාකාරී තත්වයේ පැවති එක් යන්ත්‍රයකින් නළ ළිං 8ක් පමණක් ඉදිකර තිබුණි. එක් යන්ත්‍රයක් සඳහා විදුම් නිලධාරියෙකු හා 8 දෙනෙකුගෙ න් යුත් සහය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබු අතර එම එක් කණ්ඩායමක් විසින් මාස දෙකකට එක් නළ ළිදක් පමණක් ඉදිකර තිබුණි. | විදුම් අංශය සතු විදුම් යන්ත්‍ර 18න් 3ක් 2023 වර්ෂයේදී වෙන්දේසි කරන ලදී. ඉතිරි 15න් 6ක් පැරණි විදුම් යන්ත්‍ර වන අතර අලුත්වැඩියාවන් කල යුතු වීමත් පැරණි නිසා අමතර කොටස් සොයා ගැනීමේ අපහසුතාවයන් හා නඩත්තු වියදම් අධික වීමත් හේතුවෙන් භාවිතා කල නොහැකි තත්වයක පවතී. ඉතිරි විදුම් යන්ත්‍ර 9 යෙන් 2 ක් නෙදර්ලන්ත ව්‍යාපෘතිය මගින් ලැබුණු නවීන විදුම් යන්ත්‍ර වන අතර ඒවා පවත්වාගෙන යාමේදී නඩත්තු හා සේවා වියදම් හා අලුත්වැඩියා වියදම් අධික වීම නිසා ඉතිරි විදුම් යන්ත්‍ර 7න් පමණක් 2023 වර්ෂයේදී නළ ළිං විදුම් කටයුතු සිදුකරන ලදී. නෙදර්ලන්ත ව්‍යාපෘතිය හරහා ලැබුණු නවීන විදුම් යන්ත්‍ර 2ක IWWRMP ව්‍යාපෘතියේ පරීක්ෂණ නල ළිං ඉදි කිරීම සඳහා යෙදවීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| | | 2018 වර්ෂයේ සිට මණ්ඩලයේ විදුම් අංශය වෙත ලැබූ ඇණවුම් ප්‍රමාණය 280 සිට 58 දක්වා වාර්ෂිකව අඛණ්ඩව පහත වැටී තිබුණි. ඒ අනුව එම අංශයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය පිළිබඳව විශ්ලේෂණයක් සිදුකර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. | |
| | (ඍ) | ජල සම්පත් මණ්ඩලය 1978 සිට පවත්වාගෙන ගොස් තිබු කොළඹ 07 හෙක්ටර් කොබ්බැකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු, 12,772,000.00 ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබාගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුනද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ බුක්තිය පිළිබඳව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රය එවකට අග්‍රාමාත්‍ය වරයා භාවිතා කල නිළ නිවස පුළුල් කිරීමේ කාර්ය සඳහා යොදා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව භාරදී තිබුණි. ප්‍රධාන කාර්යාලය 2021 ජුලි 18 දින සිට 2022 ජුලි 15 දක්වා රාජගිරිය ප්‍රදේශයේ පුද්ගලික කුලී ගොඩනැගිල්ලකද 2022 අගෝස්තු 1 දින සිට නාවල කොස්වත්ත ප්‍රදේශයේ පුද්ගලික ගොඩනැගිල්ලකද පවත්වාගෙන ගොස් තිබුණි. ඒ සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු, 30,511,722.00 ගෙවා තිබුණි. | ජ.ස.ම. අදාළ පරිශ්‍රයෙන් ඉවත්වීමට සිදුවුයේ කොළඹ 7 විජේරාම මාවතේ අංක 117 හි හිටපු ජනාධිපති මෙන්ම එවකට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ නිල නිවාස පුළුල් කිරීම සඳහා ඉඩමෙන් කොටසක් පවරා ගැනීම නිසා ආයතනයේ අංශ දෙකක් පිහිටුවා තිබු ගොඩනැගිලි දෙකක් අහිමිව ගියේය. එසේම අග්‍රාමාත්‍ය ලේකම් විසින් මෙම ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2021.02.12 දාතමින් සහ 2021.04.29 දාතමින් යවන ලද ලිපිවලින් දන්වා සිටියේ මෙම බිම් කොටස පවරා දෙන ලෙසයි. රාජ්‍ය සේවා පළාත්සභා සහ පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම්ට සහ ජල සම්පාදන අමාත්‍යංශයේ ලේකම්ට පිටපත් සහිතව යවනු ලැබූ අග්‍රාමාත්‍ය ලේකම්ගේ PMO/2/13/20 Bldg හා 2021.04.29 දාතම ලිපියෙන් ජ.ස.ම. සභාපතිට දන්වා සිටියේ 2021.05.21 දිනට මෙම භූමියෙන් ඉවත්වන ලෙසය. ජල සම්පාදන අමාත්‍යංශයේ ලේකම් වරයා විසින්ද මෙසේ ඉවත්වන ලෙස දන්වන ලදී. මේ සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීමට ඒ සඳහා කුලිය ලබා දෙන ලෙසද ජල සම්පාදන අමාත්‍යංශයේ ලේකම් සහ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂක ජනරාල්ට පිටපත් සහිතව අග්‍රාමාත්‍ය ලේකම්ගේ PMO/3/2/12 හා 2021.09.15 දින ලිපියෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ට දැනුම් දී තිබුනේ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙසය. නෙදර්ලන්ත රජයේ ණය ආධාර යටතේ බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බැකඩුව මාවතේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්. 40 ඉඩමේ ජ.ස.ම. ප්‍රධාන කාර්යාලය සහ දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු,මි, 200ක් ලබාදීමට නියමිතව තිබුනද නාගරික සංවර්ධන අධිකාරිය ගිවිසුම් අත්සන් කිරීම දිගින් දිගටම කල් දැමීම නිසා මේ දක්වා කුලී ගොඩනැගිල්ලක ජ.ස.ම. යේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමට සිදුව ඇත. |

| | | | |
|---|---|---|---|
| | (එ) | 2016 වර්ෂයේදී අවුරුදු 30ක කාලසීමාවක් සඳහා කුලී පදනම මත මණ්ඩලයට පවරා තිබූ අනුරාධපුර සංචාරක බංගලාව ඉදිකර ඇති ඉඩම සඳහා වසර 7 ක් ඉක්මවා තිබුනද කුලී ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මෙම ඉඩම සඳහා කිසිඳු කුලියක් ගෙවීමට මේ දක්වා කටයුතු කර නොමැත. | අනුරාධපුර සංචාරක නිවස පිහිටි ඉඩම සම්බන්ධයෙන් බදු ගෙවීම සඳහා ඉඩම මැනුම් කරවා ගැනීමට ප්‍රාදේශීය ලේකම් හරහා බලයලත් මිනින්දෝරු කේ.එම්.එස්.බී. කුලතුංග මහතා සම්බන්ධ කරගෙන ඉදිරි කටයුතු සිදුකලද මෙම ඉඩම වැව රක්ෂිතය තුල පිහිටා ඇති බැවින් මෙම ගැටලුව නිරාකරණය කරගැනීම අපහසු වී ඇත. |

.........................................

ජයලත් ගංගොඩ

විගණන නිලධාරී

## 2023 වර්ෂය තුල ජල සම්පත් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතියේ සාරාංශය

ශ්‍රී ලංකාව තුළ භූගත ජලය කළමනාකරණය පිළිබඳ වගකීම දරන ආයතනය වන්නේ ජල සම්පත් මණ්ඩලයයි. ඒ අනුව ජල සම්පත් මණ්ඩලය විසින් භූ ගත ජලය සම්බන්ධ පර්යේෂණ, නිම්න කටයුතු, නියාමන කටයුතු, සහ ගංගා ද්‍රෝණි මට්ටමින් භූගත ජලයෙහි තිරසාර සංවර්ධන කටයුතු සඳහා මූලිකත්වය ලබා දී ඇත. දැනට ජල සම්පත් මණ්ඩලය ප්‍රධාන වශයෙන් ජල සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්යයට උර දෙමින් භූගත ජල නියාමනය සහ කළමනාකරණය පිළිබඳව දැඩි අවධානයක් යොමු කරමින් පවතී.

ඒ අනුව, ජල සම්පත් මණ්ඩලය මගින් 2023 වර්ෂය සඳහා සැලසුම් කල පරිදි පහත සඳහන් ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. මූලික වශයෙන් ව්‍යාපෘති සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ප්‍රධාන අංශ 3කට වෙන් කල හැක.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති, උත්පාදිත අරමුදල් යටතේ සිදු කරන ක්‍රියාකාරකම් සහ විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ලෙස වේ.

**භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

2023 වර්ෂයේදී ව්‍යාපෘති 9ක් සිදු කරන ලදී.

භූ ගත ජලය සඳහා සංවේදී ප්‍රදේශ තුළ දීර්ඝ කාලීන භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM) යටතේ, දිවයිනේ ප්‍රදේශ 12ක පමණ භූගත ජල මට්ටම සහ භූගත ජලයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කරනු ලැබේ. ජල සාම්පල එක් රැස් කිරීම සඳහා ඉලක්කගත ජල සාම්පල 2491 න් 100% ක ප්‍රගතියක් ළඟා කරගන්නා ලද අතර එක් රැස් කරන ලද සාම්පල 2491 (ඉලක්කගත) න් 62%ක ප්‍රමාණයක රසායනික විශ්ලේෂණය සිදු කර ඇත.

**කාලගුණික වෙනස්වීම් මත ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජලධරයන් වලට සෘජුව හා වක්‍රාකාරව සිදු වන බලපෑම් අධ්‍යයනය** (SICC) යටතේ, භූගත ජලයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවයේ විචලනය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ බටහිර සහ නැගෙනහිර වෙරළබඩ තීරය තෝරා ගන්නා ලදී. ඉලක්කගත ජල සාම්පල 400ක් එක්රැ ස් කිරීම සහ ක්ෂේත්‍රයේදී රසායනික පරීක්ෂාවට ලක් කිරීමේ කටයුතු 100% ක ප්‍රගතියක් ලඟා කරගන්නා ලදී. විද්‍යාගාරය තුලදී ජල සාම්පල රසායනික විශ්ලේෂණයට ලක් කිරීමේ කටයුතු වල 73%ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.

**මා ඔය ගංගා ද්‍රෝණිය තුල භූජල විද්‍යාත්මක තක්සේරුව හා භූගත ජල ආරෝපණය සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම** (Ma-Oya) යටතේ, මා ඔය ද්‍රෝණිය තුල භූ ගත ජලය පුනරාරෝපණය සඳහා සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම 100% ප්‍රමාණයක් අවසන් කරන ලදී. භූගත ජල සම්පත්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය පිළිබඳ අධ්‍යයනය 100% ක ප්‍රගතියක් අත් කර ගන්නා ලදී.

**භූ ගත ජලය සම්බන්ධ ගැටළු පිළිබඳ සංයුක්ත පරීක්ෂණ** යටතේ ඉලක්කගත රැස්වීම් සහ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ 100න් 149%ක ප්‍රගතියක් ඇති කරගෙන ඇත. මීට අමතරව භූගත ජලය සම්බන්ධ ගැටළු පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ ඉලක්කගත වැඩසටහන් 25 න් 50%ක ප්‍රගතියක් ලඟා කර ගන්නා ලදී.

ශ්‍රී ලංකාව සඳහා භූගත ජල සිතියම් සකස් කිරීම යටතේ දත්ත එක්රැස් කිරීම, සකස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ සිතියම් සකස් කිරීම ,රටේ භූ ගත ජල සම්පත පිළිබඳව අවදානම් තත්ත්ව සිතියම් සහ එලදායිතාවය පිළිබඳව සිතියම් සකස් කිරීම, අවසන් සිතියම් සහ වාර්තාව සකස් කිරීම යන සියලු ක්‍රියාකාරකම් 100%ක ප්‍රගතියක් අත් කරගන්නා ලදී.

**යටිතල පහසුකම් සංවර්ධනය,** විද්‍යාත්මක **උපකරන වල ක්ෂමතාවය වර්ධනය කිරීම** යටතේ 2023 වසර තුල, වාහන සහ මැෂින් සන්වර්ධාන් කටයුතු, මොනරාගල සහ පුත්තලම පළාත් කාර්යාල වල වැට ඉදි කිරීමේ කටයුතු, 100%ක ප්‍රගතියක් ලඟා කරගන්නා ලදී. මීට අමතරව රසායනාගාර උපකරණ සහ භූ භෞතික විද්‍යා උපකරණ නඩත්තු කිරීමේ කටයුතු 95%ක් සම්පූර්ණ කරන ලදී.

ජල අංශයට අදාල නියඟ, ගංවතුර, භූ ගත ජලය දූෂණය වීම ආදී හදිසි ආපදා තත්ත්ව සඳහා ක්‍රියාත්මක වීම යටතේ ඉලක්කගත සියලු කටයුතු 100% ක් අවසන් කරන ලදී.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය යටතේ, ඉහළ භූගත ජලය උකහා ගැනීම හඳුනා ගැනීම, වර්තමාන සහ අනාගත භූගත ජල ඉල්ලීම් හඳුනා ගැනීම, වත්මන් ජලධර ආතතිය මෙන්ම අනාගතය පුරෝකථනය කිරීම සඳහා තත්‍ය කාලීන අධීක්ෂණ දත්ත සහ තොරතුරු විශ්ලේෂණය කිරීම, භූගත ජලයේ රසායනය තක්සේරු කිරීම, භූගත ජලය ගවේෂණය සඳහා භූ භෞතික විද්‍යා ක්‍රමවේදයන් යොදා ගැනීම, විකල්ප ඵලදායී කලාප තක්සේරු කිරීම යන ක්‍රියාකාරකම් ජල සම්පාදන ක්‍රමයන් සඳහා 100% සම්පූර්ණ කරන ලදී. මීට අමතරව, පවතින ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා විකල්ප භූගත ජල සම්පත් භාවිතා කර 80% කින් නිම කිරීම සහ සොයාගැනීම්, අවශ්‍ය නිර්දේශ, පසු විපරම් මාර්ගෝපදේශ සහිත අවසන් වාර්තාව 25%කින් නිම කරන ලදී.

### උත්පාදිත අරමුදල්

උත්පාදිත අරමුදල් යටතේ, වාණිජ්‍යමය ක්‍රියාකාරකම්, භූ ගත ජල නියාමන කටයුතු සහ පර්යේෂණ මට්ටමින් සිදු කරන වානිජ්‍ය ව්‍යාපෘති සිදු කරන ලදී.

භූ ගත ජල සමීක්ෂණ (ඉලක්කය-350, ප්‍රගතිය 110%), නළ ළිං ඉදි කිරීම (ඉලක්කය - 75, ප්‍රගතිය 71%), ජල ධාරිතා පරීක්ෂණ (ඉලක්කය - 225, ප්‍රගතිය - 84%), නළ ළිං පිරිසිදු කිරීම (ඉලක්කය - 10, ප්‍රගතිය 210%), ජල සාම්පල රසායනික විශ්ලේෂණය (ඉලක්කය -500, ප්‍රගතිය - 79%) ආදී ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

මීට අමතරව භූගත ජල නියාමන කටයුතු යටතේ, පුද්ගලික විදුම් ආයතන හා විදුම් යන්ත්‍ර 68%ක් ලියාපදිංචි කරන ලදී (ඉලක්කය 130). බාහිර භූ ජල විද්‍යාඥයින් 80%ක් ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි කරන ලදී (ඉලක්කය 20). බාහිර භූ ජල විද්‍යාඥයින් විසින් යොමු කරන ලද භූ ජල විද්‍යා සමීක්ෂණ වාර්තා 60%ක් අනුමත කරන ලදී (ඉලක්කය 500). ජල මනු 60%ක් සවි කරන ලදී (ඉලක්කය 05).

### විදේශ ආධාර යටතේ සිදු කරන ව්‍යාපෘති.

ලෝක බැංකු අරමුදල් යටතේ භූගත ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම - IWWRMP සංරචක 1.3.2 යටතේ සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ගංගා ද්‍රෝණි 04 ක (කැලණි ගඟ, මා ඔය, දැදුරුඔය සහ යාපනය අර්ධද්වීපය) පිළිබඳ මූලික අධ්‍යයනය 50% නිම කරන ලදී. භූගත ජලය භාවිතා කරන කණ්ඩායම් හඳුනා ගැනීම සහ වත්මන් තත්වය අනුව භූගත ජලය පැවතීම, ප්‍රමාණය සහ ගුණාත්මක භාවය හඳුනා ගැනීම සඳහා ළිං පිලිබඳ දත්ත සහ ජල මූලාශ්‍ර සමීක්ෂණ 10% නිම කරන ලදී. ජලධර සිතියම්කරණය සඳහා භූ භෞතික ගවේෂණය(600ක්- ඒකමාන 115 සහ ද්වීමාන සමීක්ෂණ) 5% නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2025 දක්වා ක්‍රියාත්මක වේ.

## විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් හා විගණන වාර්තා වල පෙන්වා දී ඇති ගිණුම්කරණ හා කළමනාකරණ දුර්වලතා නිවැරදි කිරීම පිණිස ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග

1. නල ළිං ඉදකිරීමේ නියැලෙන සියළු ආයතන හා වාණිජ මට්ටමෙන් භූගත ජලය ලබා ගන්නා සියළු ආයතන නියාමනය කිරීමට අදාල කරුණු ඇතුලත් කර ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කර ඇති අතර එය ගරු ඇමතිතුමාට හා අමාත්‍යාංශ ලේකම්තුමාට අනුමැතිය සඳහා යොමු කර ඇත.

2. භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය යටතේ පරීක්ෂණ නල ළිං වල තොරතුරු එක් රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා දත්ත මධ්‍යස්ථානය රත්මලාන කාර්යාලය තුල ස්ථාපිත කර ඇත.

3. විගණන වාර්ථා වලින් පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදි කිරීමටත් මූල්‍ය කටයුතු වල අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීමටත් කටයුතු කර ඇත.

## ජල සම්පත් මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා 2023 වර්ෂය තුලදී ගන්නා ලද ක්‍රියාමාර්ග

1. වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන IWWRM ව්‍යාපෘතියෙහි උප සංරචකයක් යටතේ ජල සම්පත් මණ්ඩලය මගින් ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් කළමනාකරණය සවිබල ගැන්වීමේ අරමුණ උදෙසා එහි ක්‍රියාකාරකම් සැලසුමට අදාල භූගත ජල සම්පත් පිළිබඳව ක්ෂේත්‍රයේ සිදු කරනු ලබන කාර්යයයන් උදෙසා භූගත ජල විමංසන ජාල පද්ධති ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලැබී ඇති විද්‍යාත්මක උපකරණ හා අනෙකුත් අයිතමයන් භාවිතයට ගැනීම.

2. භූ ගත ජල සම්පත් නියාමන ක්‍රියාවලියේදී නළ ළිං ඉදි කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් හා වාණිජ පදනමින් භූ ගත ජලය උකහා ගන්නා ආයතන සඳහා ජල සම්පත් මණ්ඩලයේ නිර්දේශ ආරක්ෂිත ජල පරිමාවන් තක්සේරු කිරීම පිළිබඳ ජල ධාරිතා පරීක්ෂණ සිදු කර ගන්නා ලෙස දැනුවත් කිරීම.

3. බාහිර භූ ජල විද්‍යාඥයින් විසින් ලබා දෙන භූ ජල විද්‍යා වාර්තා සම්බන්ධව පවතින විරෝධතාවයන් පිළිබඳව ස්ථානීය පරීක්ෂණ සිදු කර ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සහ අවශ්‍ය උපදෙස් ලබා දීම.

4. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ සිදු කරනු ලැබූ මූලික සමාලෝචන කමිටු සහ තාක්ෂණික කමිටු සඳහා භූගත ජල සම්පත් පිළිබඳ සක්‍රිය දායකත්වය ලබා දීම.

5. ශ්‍රී ලංකාවේ භූගත ජලය පිළිබඳ සංවේදී ප්‍රදේශ සහ වෙරළබඩ ප්‍රදේශ තෝරා ගනිමින් එම ප්‍රදේශ වල ඇති භූගත ජල ප්‍රභව වල ගුණාත්මක භාවය සහ ප්‍රමාණාත්මක භාවය දිගු කාලීනව තක්සේරු කිරීම. මෙහිදී කාලගුණ විපර්යාස හේතුවෙන් වෙරලබඩ ප්‍රදේශ වල පවතින භූ ගත ජල ප්‍රභවයන් වල ගුණාත්මක භාවයේ සහ ප්‍රමාණාත්මක භාවයේ සිදු වන වෙනස් කම් හඳුනා ගැනීමද මෙයට අදාල වේ.

6. ශ්‍රී ලංකාව තුල පවතින භූගත ජල ධර විධිමත් ලෙස පුනරාරෝපණය කිරීම සඳහා UNICEF ආධාර යටතේ සිදු කරනු ලැබූ අධ්‍යයනයන්ගේ ප්‍රතිපල අනුව භූගත ජල පුනරාරෝපණ පද්ධතීන් 2ක් සකස් කිරීම සඳහා අවශ්‍ය සලසුම් සකස් කිරීම.

ජල සම්පත් මණ්ඩලය
நீர் வளச் சபை
WATER RESOURCES BOARD